(අටවැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 4.]

# පාර්ලිමේන්තුවේ
# න්‍යාය පුස්තකය

**2016 අගෝස්තු මස 09 වැනි අඟහරුවාදා ඇතුළුව එදින සිට**

**නිකුත් කළේ 2016 ජූලි මස 29 වැනි සිකුරාදා**

---

**2016 අගෝස්තු මස 09 වැනි අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

385/'15

1.

ගරු බුද්ධික පතිරණ මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයට අයත් කාර්මික නිලධාරින්ට ව්‍යාපෘති ඇස්තමේන්තු අනුමත කිරීමේ උපරිම සීමාව රුපියල් ලක්ෂ දහයක් වන බවත්;

(ii) රුපියල් ලක්ෂ 10ට වඩා වැඩි ඇස්තමේන්තු අනුමත කිරීම ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ, විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු විසින් සිදු කළ යුතු බවත්;

(iii) තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරින් ප්‍රමාණවත් සංඛ්‍යාවක් රාජ්‍ය සේවයේ නොමැති බවත්;

(iv) එහෙයින් ව්‍යාපෘති ඇස්තමේන්තු අනුමත කිරීමේදී ප්‍රමාදයන් සිදුවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) දකුණු පළාතේ දැනට සේවයේ යෙදී සිටින,

(i) කාර්මික නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(ii) තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) කාර්මික නිලධාරින්ට ව්‍යාපෘති අනුමත කිරීමට හැකි සීමාව ඉහළ දැමීමට කටයුතු කරන්නේද;

(ii) තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරින් අලුතින් බඳවා ගැනීමට කටයුතු කරන්නේද;

(iii) ව්‍යාපෘති අනුමත වීම ප්‍රමාදවීම වැළැක්වීමට ගන්නා වෙනත් ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

488/'16

2.

ගරු කනක හේරත් මහතා,— කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ දිවයිනෙන් වාර්තා වූ ළමා අපචාර සිද්ධි සංඛ්‍යාව කොපමණද;

(ii) එම සිද්ධීන්වලට සම්බන්ධ සැකකරුවන් සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා වැරදිකරුවන්ට නීත්‍යානුකූලව දඬුවම් කර තිබේද;

(iii) පරීක්ෂණ පවත්වා නීත්‍යානුකූලව කටයුතු කිරීමට නොහැකි වූ සිද්ධීන් ඉතිරිව තිබේද;

(iv) එසේ නම්, එම පරීක්ෂණ කඩිනම් කිරීමට යම් ක්‍රියාමාර්ගයක් ගන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

599/'16

3.

ගරු ලකී ජයවර්ධන මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාවෙන්, පළාත් සහා යටතේ ක්‍රියාත්මක පාසල් හා මධ්‍යම රජයේ පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අ (i) හි පාසල් අතරින් ස්ථිර පත්වීමක් නොමැතිව වැඩ බලන හා තාවකාලික පදනම මත සේවය කරන විදුහල්පතිවරුන් සිටින පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) ස්ථිර පත්වීම් නොලැබූ විදුහල්පතිවරුන් සිටින එම පාසල්වල පරිපාලන කටයුතු නිසි ලෙස සිදු නොවන බව පිළිගන්නේද;

(iii) ස්ථිර විදුහල්පතිවරුන් නොමැති පාසල්වලට ස්ථිර විදුහල්පතිවරු පත්කිරීමට කඩිනම් පියවර ගන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

609/'16

4.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012, 2013, 2014 වර්ෂවලදී ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් බස් රථ අමතර කොටස් මිලදී ගැනීමේදී අනුගමනය කළ ක්‍රමවේදය වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එය, ඊට පෙර පැවති ක්‍රමවේදයට වඩා වෙනස් වන්නේ කවර ආකාරයෙන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත වර්ෂවලදී ශ්‍රී ලංගමයට අමතර කොටස්,

(i) සැපයීම සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ සමාගම් හා ඔවුන්ගේ ලිපිනයන්;

(ii) සැපයූ සමාගම හා එහි ලිපිනය;

(iii) සැපයූ දිනයන් හා ඒවායේ වටිනාකම්;

(iv) වෙනුවෙන් රජයට ගෙවන ලද ආනයන බදු මුදල්;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ගෙන්වන ලද අමතර කොටස්වල මිල, ප්‍රමිතිය සහ අවශ්‍යතාවය සම්බන්ධයෙන් ශ්‍රී ලංගමය සෑහීමට පත් වන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

625/'16

5.

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අඹතලේ ජල පවිත්‍රාගාරය සතු විදුලිජනක යන්ත්‍රයේ ධාරිතාව කවරේද;

(ii) අඹතලේ ජල පවිත්‍රාගාරයෙහි දෛනික ජල විදුලි පරිභෝජනය ඒකක කොපමණද;

(iii) දීර්ඝ කාලයක් සඳහා විදුලිය විසන්ධි කර ඇති අවස්ථාවක අඛණ්ඩ පානීය ජල සැපයුමක් පවත්වා ගැනීම සඳහා මෙම විදුලිජනක යන්ත්‍රය ප්‍රමාණවත්ද;

(iv) එසේ නම්, 2016 මාර්තු 13 වැනි ඉරිදා දින මුළු දිවයිනටම විදුලිය නොමැති වූ විට අඹතලේ ජල පිරිපහදුවේ කටයුතු සිදු කිරීමට නොහැකි වූයේ මන්ද;

(v) එම විදුලි ජනක යන්ත්‍රය ප්‍රමාණවත් නොවේ නම්, මේ පිළිබඳව අඹතලේ ජල පවිත්‍රාගාරයේ ප්‍රධානියා අදාළ බලධාරීන්ට දැනුම් දුන්නේද;

(vi) දැනුම් දී තිබුනේ නම්, ඒ සඳහා ගත් පියවර කුමක්ද;

(vii) එසේ දැනුම් දී තිබුනේ නම්, බලධාරීන් විසින් එම දැනුම් දීම පැහැර හැරීම පිළිබඳව ඔබතුමා ගන්නා පියවර කුමක්ද;

(viii) එසේ නොවේ නම්, දැනුම් නොදීම සම්බන්ධව වගකිව යුත්තන්ට එරෙහිව ගන්නා පියවර කුමක්ද;

(ix) අනාගතයේ ජනතාවට අත්‍යවශ්‍ය පානීය ජලය අඛණ්ඩව ලබාදීමට කටයුතු කරන්නේද;

(x) එසේ ලබාදීමට කටයුතු කරන්නේ නම්, ඒ පිළිබඳව විස්තර කළ හැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

636/'16

6.

ගරු වාසුදේව නානායක්කාර මහතා,— පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2003 වර්ෂයේදී ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සේවකයින් 18 දෙනෙක් තමන්ගේ මානව හිමිකම් කඩවී ඇති බවට මානව හිමිකම් කොමිසමට පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති බවත්;

(ii) 2007 වර්ෂයේදී එම සේවකයින්ගේ මානව හිමිකම් කඩවී ඇති බවට එවකට පැවති ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයට දන්වා ඇති බවත්;

(iii) ඒ අනුව, 2014 වර්ෂයේදී එවකට ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග මහතා විසින් මානව හිමිකම් කොමිසමේ තීරණය ක්‍රියාත්මක කරන මෙන් සියලු ලේකම්වරුන් වෙත දන්වා යවා තිබූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති අංක 17/2005 දරන චක්‍රලේඛය ජනමාධ්‍ය අමාත්‍යාංශය පිළිගන්නේද;

(ii) එසේ නම්, ඉහත අ (i) හි සඳහන් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සේවකයින් 18 දෙනා සඳහා එම චක්‍රලේඛය අනුව හිමිකම් ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

640/'16

7.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට මත්පැන් බලපත්‍ර ලබාදීම ආරම්භ කළ වර්ෂය කවරේද;

(ii) එවකට ශ්‍රී ලංකාණ්ඩුවේ ප්‍රධානියා කවුරුන්ද;

(iii) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට මත්පැන් බලපත්‍ර අවසන් වරට ලබා දුන් වර්ෂය කවරේද;

(iv) එවකට ශ්‍රී ලංකාණ්ඩුවේ ප්‍රධානියා කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අවසන් වරට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට මත්පැන් බලපත්‍ර ලබා දුන් අවස්ථාවේදී බලපත්‍ර ලබා නොගත් මන්ත්‍රීවරුන් කවුරුන්ද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

645/'16

8.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අංක 1904 හා 2015.02.27 දිනැති ගැසට් පත්‍රය මඟින් අයදුම්පත් කැඳවා, විභාග දෙපාර්තමේන්තුව මඟින් 2015.06.26 දින පවත්වන ලද "ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ, 2 වැනි පංතියේ, II ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරහ විභාගය - 2015" සඳහා අයදුම් කළ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අනුව රුපියල් 500/- බැගින් විභාග ගාස්තු ලෙස එකතු වූ මුළු මුදල කොපමණද;

(iii) විභාගයට හා සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයට අනුව පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් සම්පූර්ණ කළ සංඛ්‍යාව කොපමණද;

(iv) සුදුසුකම් ලැබූවන්ගේ නාම ලේඛනය හා ලකුණු අනුපිළිවෙළ සභාගත කරන්නේද;

(v) සුදුසුකම් සපුරන ලද පිරිස මේ දක්වා බඳවා නොගැනීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

657/'16

9.

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අංක 1951/13 දරන මුස්ලිම් විවාහ හා දික්කසාද පනතේ 24 වැනි වගන්තිය ක්‍රියාත්මක කිරීමේදී ක්වාසි විනිසුරුවරු විසින් ජුම්ආ පල්ලිවලට අයත් භාරකරුවන්ගේ දායකත්වය සහ ඔවුන්ගේ සහාය ලබාගැනීමේ අවශ්‍යතාවය පැන නඟින බව දන්නේද;

(ii) රාජකාරිමය අවශ්‍යතා සඳහා ක්වාසි විනිසුරුවන් විසින් දිවයිනේ ජුම්ආ පල්ලිවල භාරකරුවන්ට යොමු කරන නිවේදන, එම පල්ලිවලට අයත් දැන්වීම් පුවරුවල ප්‍රදර්ශනය කිරීමේ අවශ්‍යතාවය සහ සම්ප්‍රදායානුකූලව පවතින එම වගකීම් දැනුවත් කරමින් අවශ්‍ය උපදෙස් නිකුත් කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

663/'16

10.

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය,— තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඌන සුදුසුකම් සහිත පුද්ගලයන් ලෙස සැලකෙන තැපැල් ස්ථානාධිපතිවරු සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ට විශ්‍රාම වැටුපක් හිමි වන්නේද;

(iii) එසේ නොවේ නම්, ඔවුන් තැපැල් සේවයට සිදු කළ දීර්ඝකාලීන සේවය සලකා කිසියම් සහනදායී දීමනාවක් හෝ ලබා දීමට හැකියාවක් තිබේද;

(iv) එසේ නොමැති නම්, ඔවුන්ගේ අභිවෘද්ධිය උදෙසා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

667/'16

11.

ගරු බිමල් රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජය මඟින් ප්‍රකාශ කර ඇති පරිදි අග්‍රාමාත්‍යවරයාගේ චීන සංචාරයේ දී එකඟ වූ බවට සඳහන් කරන මත්තල ගුවන් තොටුපළ ආශ්‍රිත විශේෂ චීන කර්මාන්ත කලාපය පිළිබඳව චීන රජය සමඟ එළැඹී ඇති ගිවිසුමක් හෝ එකඟතා ලියවිල්ලක් තිබේද;

(ii) එසේ නම්, එම ලියවිල්ල සභාගත කරන්නේද;

(iii) එම විශේෂ චීන කර්මාන්ත කලාපය පිහිටුවීමේ මූලික කොන්දේසි හා කළමනාකරණය සිදු වන ආකාරය පැහැදිලි කරන්නේද;

(iv) එම කර්මාන්ත කලාපය සඳහා හඳුනාගෙන ඇති භූමියේ සිතියමක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

386/'15

12.

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා යුධ හමුදාවේ සේවය කරන මේජර්වරයෙකු වන ජේ. ආර්. එස්. රූපසිංහ මහතාට එරෙහිව මේ වනවිට යම් පරීක්ෂණයක් ක්‍රියාත්මක වෙමින් පවතීද;

(ii) එසේ නම්, එයට හේතුව කවරේද;

(iii) මෙම පරීක්ෂණය මෙහෙයවන නිලධාරීන්ගේ නම් හා තනතුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේජර් ජේ. ආර්. එස්. රූපසිංහ මහතාට සාධාරණයක් කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

600/'16

13.

ගරු ලකී ජයවර්ධන මහතා,— බුද්ධශාසන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දඹදිව වන්දනා චාරිකා සංවිධානය කරන ආයතන විශාල ප්‍රමාණයක් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන බවත්;

(ii) එකී සමහර ආයතන මඟින් විදෙස් ගතවන වන්දනාකරුවන්ගේ සුරක්ෂිතභාවය පිළිබඳව නිසි ක්‍රියාමාර්ගයක් අනුගමනය නොකරන බවත්;

(iii) එම නිසා බැතිමතුන් මහත් අසීරුතාවයට පත්වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) දඹදිව පූජා භූමි වන්දනා කිරීම සඳහා වසරකට සහභාගී වන වන්දනාකරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) විදෙස් ගතවන ශ්‍රී ලාංකික වන්දනාකරුවන්ගේ සුරක්ෂිතභාවය සහතික කිරීම සඳහා වන්දනා චාරිකා සංවිධානය කරන ආයතන නියාමනය කිරීමට විධිමත් ක්‍රමවේදයක් සකසන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

611/'16

14.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වසරේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවෙන් ඉන්දියාවට අපනයනය කළ කරුංකා ප්‍රමාණය;

(ii) ඒවායේ වටිනාකම;

(iii) අපනයනකරුවන් හා ඔවුන්ගේ ලිපිනයන්;

(iv) එක් එක් අපනයනකරුවා අපනයනය කළ ප්‍රමාණය හා වටිනාකම;

(v) එක් එක් අපනයනකරුවා රජයට ගෙවූ බදු මුදල;

වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2010 වසරේ සිට මේ දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවට ආනයනය කළ කරුංකා ප්‍රමාණය;

(ii) ඒවායේ වටිනාකම;

(iii) ආනයනකරුවන් හා ඔවුන්ගේ ලිපිනයන්;

(iv) එක් එක් ආනයනකරුවන් ආනයනය කළ ප්‍රමාණය හා වටිනාකම;

(v) ආනයනය කළ රට;

(vi) එක් එක් ආනයනකරුවා රජයට ගෙවූ බදු මුදල;

වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 2010 වසරේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ කරුංකා නිෂ්පාදනය වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) නීතිවිරෝධී ලෙස කරුංකා ප්‍රති අපනයන ක්‍රියාවලියක් ශ්‍රී ලංකාව හරහා සිදුවන බවත්, එමඟින් දේශීය කරුංකා නිෂ්පාදකයන් සහ අපනයනකරුවන් දුෂ්කරතාවයට පත්ව ඇති බවත් පිළිගන්නේද;

(iii) මෙම නීතිවිරෝධී ප්‍රති අපනයනය වැළැක්වීමට රජය ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

627/'16

15.

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වර්ෂය තුළ නොරොච්චෝලේ තාප විදුලි බලාගාරයේ බිඳ වැටීම් සිදු වූ අවස්ථා සංඛ්‍යාව කොපමණද;

(ii) නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය ආරම්භයේ සිට මේ දක්වා සිදු වූ බිඳ වැටීම් සංඛ්‍යාව කොපමණද;

(iii) නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය රටේ සමස්ත විදුලි අවශ්‍යතාවයෙන් කොපමණ ප්‍රතිශතයක් ලබා දෙන්නේද; එම ඒකක සංඛ්‍යාව කොපමණද;

(iv) තාප විදුලි බලාගාරයක් මත රටේ ජාතික විදුලි නිෂ්පාදනයට යැපීමට සිදුවීම අවදානම් සහගත කටයුත්තක් නොවේද;

(v) නොඑසේ නම්, එය පැහැදිළි කරන්නේද;

(vi) එම අවදානමෙන් මිදීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා,— මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා පනත යටතේ නියෝග,— 1995 අංක 35 දරන මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා පනතේ 60 වැනි වගන්තිය යටතේ ආහාර සුරක්ෂිතතාව අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 ජූලි 2 දිනැති අංක 1921/54 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.04.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*3.

එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

සත්ව ආහාර (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*7.

මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

විශ්වවිද්‍යාල (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*9.

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— 2016 ජූනි 22 දිනැති අංක 1972/33 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින්, සිංහල හා දෙමළ භාෂා පිටපත්වල මුද්‍රණ දෝෂ නිවැරදි කරනු ලැබූ, මෝටර් වාහන පනතේ (203 වැනි අධිකාරය වූ) 122 වගන්තිය සහ VII අ කොටස සමඟ කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 නොවැම්බර් 02 දිනැති අංක 1939/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.07.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරියගේ වැටුප හා දීමනා ප්‍රතිශෝධනය කිරීම,— 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 16 (1) වගන්තිය අනුව කොමිෂන් සභාවට පැවරී ඇති කාර්යයන් ඉටුකරලීම පිණිස එම කොමිෂන් සභාවට සහාය වීමට අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු පත්කිරීමට සහ එම තනතුර දරන තැනැත්තාට පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලබන වැටුපක් ගෙවීමට විධිවිධාන සලස්වා දී ඇති හෙයින්ද;

අවදානමක් දැරිය යුතු තනතුරක් වන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට 2015.02.12 දින රජයේ අවශ්‍යතාවය මත නීතිපති දෙපාර්තමේන්තුවේ අතිරේක සොලිසිටර් ජනරාල් ධූරයේ රාජකාරි කළ ජනාධිපති නීතිඥ ඒ. ඒ. පී. දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය පත්කිරීම මත, ඇයට පෞද්ගලික වන සේ පහත සඳහන් වැටුප් හා දීමනා 2015.02.12 දින සිට ගෙවීමට අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා දී ඇති හෙයින්ද:—

(අ) අතිරේක සොලිසිටර් ජනරාල් තනතුරට හිමි මාසික වැටුප සහ සියලු දීමනා (දුරකථන දීමනාව, ඉන්ධන දීමනාව සහ නිවාස කුලී දීමනාව හැර);

සහ

(ආ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ධූරයට හිමි අමාත්‍යාංශ ලේකම් දීමනාව, දුරකථන දීමනාව, ඉන්ධන දීමනාව හා රජයේ නිල නිවාසයක් ලබාදී නොමැති නම් නිවාස කුලී දීමනාව.

ඊට අනුකූලව, 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 16 (2) වගන්තිය ප්‍රකාරව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්, ජනාධිපති නීතිඥ ඒ. ඒ. පී. දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය වෙත රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ඉහත සඳහන් මාසික වැටුප හා දීමනා ගෙවීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ස්වාධීන කොමිෂන් සභාවන්හි සභාපතිවරයන් හා සාමාජිකයින් වෙත ගෙවනු ලබන පාරිශ්‍රමිකයන් හා වෙනත් දීමනා,— දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 (ආ) ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් ස්වාධීන කොමිෂන් සභා නවයෙහි සභාපතිවරයන් හා සාමාජිකයින් වෙත පහත සඳහන් පාරිශ්‍රමිකයන් හා වෙනත් දීමනා, අදාළ කොමිෂන් සභා සත්‍ය වශයෙන්ම රාජකාරි ආරම්භ කරන ලද දිනය, අදාළ ගෙවීම් බලාත්මක වන දිනය ලෙස සලකමින් ගෙවීමට අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා දී ඇති හෙයින්ද:—

(අ) නිල බලයෙන් පත්වන සභාපතිවරයන් හැර අනෙකුත් සභාපතිවරයන් සඳහා රු. 100,000/-ක මාසික දීමනාවක් ද, රු. 10,000/-ක මාසික දුරකථන දීමනාවක් ද, පෞද්ගලික භාවිතයට ද හිමිකම් සහිත නිල වාහනයක් සහ එකී වාහනය සඳහා ඉන්ධන ලීටර් 225ක් හෝ වෙළඳපොළේ පවත්නා ඉන්ධන මිල ගණන්වලට අනුරූපව දීමනාවක්ද;

(ආ) නිල බලයෙන් පත්වන ස්වාධීන කොමිෂන් සභා සභාපතිවරයන් සඳහා තම නිත්‍ය තනතුරේ වැටුප් හා දීමනාවලට අතිරේකව, ස්වාධීන කොමිෂන් සභාවන්හි සභාපතිවරයෙකුගේ මාසික දීමනාවෙන් 50%ක මාසික දීමනාවක්ද;

(ඇ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ හැර අනෙකුත් ස්වාධීන කොමිෂන් සභාවල නිල බලයෙන් පත් නොවන සාමාජිකයින් සඳහා රු. 75,000/-ක මාසික දීමනාවක්ද, රු. 8,000/-ක මාසික දුරකථන දීමනාවක් ද, තම පදිංචි ස්ථානයේ සිට කොමිෂන් සභා කාර්යාලයට යාමට ඇති දුර ප්‍රමාණය අනුව කිලෝ මීටර් 350 දක්වා රු. 25,000/-ක ප්‍රවාහන දීමනාවක් හෝ කිලෝ මීටර් 350ට වැඩි දුර ප්‍රමාණයක් වෙනුවෙන් රු. 50,000/-ක ප්‍රවාහන දීමනාවක්ද;

(ඈ) 2015.06.17 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 3/2015 විධිවිධාන පරිදි නිල බලයෙන් පත්වන සාමාජිකයින් සඳහා එක් රැස්වීම් වාරයකට සහභාගි වීම වෙනුවෙන් රු. 10,000/-ක දීමනාවක්ද;

(ඉ) 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ (8) වැනි වගන්තියට අනුව එම කොමිෂන් සභාවේ සභාපතිට හා සමානව සාමාජිකයින්ට ද බලතල පැවරී ඇති බැවින්, එම කොමිෂන් සභාවේ සාමාජිකයින්ට රු. 95,000/-ක මාසික දීමනාවක් ද, රු. 8,000/-ක මාසික දුරකථන දීමනාවක් ද, පෞද්ගලික භාවිතයට ද හිමිකම් සහිත නිල වාහනයක් හා එම වාහනය සඳහා ඉන්ධන ලීටර් 170ක් හෝ වෙළඳපොළේ පවත්නා ඉන්ධන මිල ගණන්වලට අනුරූපව දීමනාවක්;

සහ

(ඊ) මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිවරයා හා සාමාජිකයින් වෙත, මැතිවරණයක් ප්‍රකාශයට පත් කළ දින සිට ප්‍රතිඵල නිකුත් කරන දින දක්වා වූ කාලසීමාව සඳහා ඔවුන්ගේ මාසික දීමනාවෙන් ¾ක විශේෂ දීමනාවක් ද.

ඊට අනුකූලව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 (ආ) ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් ස්වාධීන කොමිෂන් සභා නවයෙහි සභාපතිවරයන්ට හා සාමාජිකයින්ට ඉහත සඳහන් පාරිශ්‍රමිකයන් හා වෙනත් දීමනා ගෙවීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා,— කාර්මික ආරවුල් පනත යටතේ නියෝග,— කලින් කලට සංශෝධනය කරන ලද, 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනතේ (131 වැනි අධිකාරය වූ) 39 වැනි වගන්තිය යටතේ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016.07.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2016 ජූනි 22),— "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2016 පෙබරවාරි 25 දිනැති අංක 1955/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.05.06 දින ඉදිරිපත් කරන ලද, ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ/ මෙහෙයුම් ප්‍රතිපත්ති අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*14.

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 213ඇ වගන්තිය සමඟ කියවියයුතු, එකී පනතේ 237 වගන්තිය යටතේ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 දෙසැම්බර් 22 දිනැති අංක 1946/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.03.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*15.

බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*16.

ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*17.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමඟ කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 26 දිනැති අංක 1903/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*

---

## 2016 අගෝස්තු මස 10 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

9/'15

1.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) 2015.08.18 දින ගාල්ල වරාය පොලිසිය කරන ලද පරීක්ෂා කිරීමක දී වරායේ ගාල් කර තිබූ "මහනුවර" නමැති නෞකාව තුළත්, ශ්‍රී ලංකා දක්ෂිණ නෞකා කඳවුරේ සහ එහි සේවා වනිතා ඒකකය සතු ගොඩනැගිල්ලක අවි සහ උණ්ඩ තිබී හමු වූ බවත් එතුමා දන්නෙහිද?

(ආ) (i) පොලිසිය මඟින් අනාවරණය කරගත් අවි සහ උණ්ඩවල නීත්‍යානුකූල අයිතිය කවර පුද්ගලයෙකු හෝ ආයතනයක් සතු වන්නේද;

(ii) එම අවි ආයුධ පුද්ගලයෙකුට හෝ ආයතනයකට කවර පනතක් යටතේ පවරා තිබේද;

(iii) එසේ නම්, ඊට බලය ලබා දුන් බලධරයා කවුරුන්ද;

(iv) එම ආයුධ නිෂ්පාදිත රට, වර්ෂය සහ බලපත්‍රය කවරේද;

(v) ආයුධ මිලදී ගත් ක්‍රමය සහ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම පාවෙන අවි ගබඩාව වරාය පරිශ්‍රයේ පවත්වාගෙන යාමට අවසර තිබේද;

(ii) ඊට අවසර ලබා දී ඇති බලධරයා කවුරුන්ද;

(iii) ඒ වෙනුවෙන් ඇවන්ට්ගාර්ඩ් සමාගම මුදල් ගෙවන්නේද;

(iv) එසේ නම්, එම මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මේ පිළිබඳව නීතිපතිවරයාගේ නිගමනයන් විෂයභාර අමාත්‍යවරයා වශයෙන් පිළිගන්නේද;

(ii) මේ සම්බන්ධයෙන් පාර්ලිමේන්තු කමිටුවක් පත් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

114/'15

2.

ගරු බුද්ධික පතිරණ මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රණවිරු සේවා අධිකාරියේ සේවය කරන ස්ථිර සහ කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වර්ෂ 2013 හා 2014 දී එම අධිකාරියේ ස්ථිර සහ කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය සඳහා නිල ඇඳුම් සැපයීමට වැය කළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) නිල ඇඳුම් ලබා දුන් ස්ථිර සහ කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය, කාන්තා සහ පිරිමි ලෙස කාණ්ඩගත කළ විට, එක් එක් කාණ්ඩයේ එක් අයෙකු වෙනුවෙන් නිල ඇඳුම් සඳහා දරනු ලැබූ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල ඇඳුම් සඳහා තෝරාගත් රෙදි තත්ත්වයෙන් බාල බවත්;

(ii) එම නිසා නිලධාරින් එම ඇඳුම් ප්‍රතික්ෂේප කර ඇති බවත්;

(iii) අධිකාරියේ සභාපතිනිය අත්තනෝමතිකව කටයුතු කර ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) රණවිරු සේවා අධිකාරියේ නිල ඇඳුම් ගැටලුව විසඳීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

445/'16

3.

ගරු වාසුදේව නානායක්කාර මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2008 වර්ෂයේදී හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා, මුදල් අමාත්‍යවරයා වශයෙන් රාජ්‍ය බැංකුවලින් සමුපකාර ව්‍යාපාරයට ලබාදී තිබූ සියලුම ණය කපා හැරීමට ප්‍රතිපාදන වෙන් කරනු ලැබුවේද;

(ii) ඒ බව සනාථ කරමින් එවකට විෂයභාර අමාත්‍යවරයා වූ පාර්ලිමේන්තු මන්ත්‍රී බන්දුල ගුණවර්ධන මහතා 2015.11.05 දින පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයක් කරනු ලැබුවේද;

(iii) එක් එක් සමූපකාර සමිතිවලින් කපා හරින ලද ණය පිළිබඳ යථා තත්ත්වය අමාත්‍යවරයා සමඟ සාකච්ඡා කර දැනුම් දෙන බව කර්මාන්ත හා වාණිජ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා 2015.11.05 දින පාර්ලිමේන්තුවට දන්වනු ලැබුවේද;

(iv) මහජන බැංකුව විසින් සමූපකාර සමිතිවලට ලබාදී තිබූ ණය කපාහැරීමට තීරණය කර ඇති නමුත් එම තීරණය මේ දක්වා කිසිදු දිස්ත්‍රික්කයක ක්‍රියාත්මක වී නොමැති බවට රාජ්‍ය අමාත්‍යවරයා 2015.11.05 දින පාර්ලිමේන්තුවේදී දෙන ලද පිළිතුර නිවැරදිද;

(v) ඉහත (iv) හි තීරණය ක්‍රියාත්මක නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක්ත ණය කපාහැරීමෙන් සමූපකාර සමිතිවලට යම්කිසි ධෛර්යයක් ලබාදීමට ගත් තීරණය ක්‍රියාත්මක කරන්නේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳව ගන්නා ඉදිරි පියවර සමූපකාර සමිතිවලට දන්වා යවන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

508/'16

4.

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ, ශ්‍රී ලංකා වකුෆ් මණ්ඩලයේ අංක R/0682/T/036 යටතේ ලියාපදිංචි කරන ලද ත්‍රිකුණාමලය, N.C. වීදියේ, අංක 154 දරන ස්ථානයේ පිහිටි මුහියිද්දීන් ජුම්ආ පල්ලියට අයත්, නිශ්චල දේපළ (ඉඩම්, නිවාස හා වෙළඳසැල්) සංඛ්‍යාව කොපමණද;

(ii) එම දේපළ පිහිටා තිබෙන එක් එක් ස්ථානයන්හි ලිපිනයන් කවරේද;

(iii) එක් එක් දේපළවලින් මාසිකව ලබන ආදායම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම එක් එක් වකුෆ් දේපළවලට අයත් ඔප්පුවල සඳහන් නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම වකුෆ් දේපළ පරිහරණයේදී දෙපාර්තමේන්තුවේ අනුමතිය ලබා තිබේද;

(ii) එම දේපළ අතරින්, සමහර දේපළ සින්නක්කර ඔප්පු මඟින් කිසියම් පුද්ගලයින්ගේ නමට පවරා තිබේද;

(iii) එසේ නම්, මේ පිළිබඳව ශ්‍රී ලංකා වකුෆ් මණ්ඩලය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

562/'16

5.

ගරු එස්. ශ්‍රීතරන් මහතා,— නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) යාපනය කාර්මික විද්‍යාලයේ සිදුවූ මුදල් අක්‍රමිකතාව පිළිබඳව එතුමා දන්නේද;

(ii) එසේ නම්, මෙතෙක් ඒ සම්බන්ධයෙන් කටයුතු නොකිරීමට හේතු කවරේද;

(iii) එම කාර්මික විද්‍යාලයේ අධ්‍යක්ෂවරයා විසින් සිදුකළ මුදල් වංචාව තහවුරු වීමෙන් පසු ඔහුට ස්ථාන මාරුවක් ලබා දී තිබේද;

(iv) එසේ නම්, එම ස්ථාන මාරුව මෙතෙක් ක්‍රියාත්මක නොකිරීමට හේතු කවරේද;

(v) අදාළ ස්ථාන මාරුව අත්හිටුවා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) යාපනය කාර්මික විද්‍යාලයේ වෙනත් ශාඛා එම දිස්ත්‍රික්කය තුළ පිහිටා තිබේද;

(ii) නොඑසේ නම්, එම දිස්ත්‍රික්කයේ ජීවත්වෙන 650,000 ක ජනතාවට මෙම කාර්මික විද්‍යාලය ප්‍රමාණවත්ද;

(iii) නොඑසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

574/'16

6\.

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කැකිරාව අධ්‍යාපන කලාපයට අයත්, අ/බමුණුගම මුස්ලිම් විද්‍යාලයේ විද්‍යාල්පති ධුරය දරමින් සිටි ඒ. එච්. සමුන් මහතා, යම් විනය නියෝගයක් මත විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2:17 වගන්තිය අනුව (යොමු අංක උමැප/ අදෙ/07/2/001) විශ්‍රාම ගැන්වීම සඳහා නිර්දේශ කර තිබේද;

(ii) එසේ නම්, ඒ කවර දිනයක සිටද;

(iii) ඒ අනුව, ඔහුගේ විශ්‍රාම පාරිතෝෂික මුදල සහ විශ්‍රාම වැටුප ලබා දෙන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

590/'16

7\.

ගරු ලකී ජයවර්ධන මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ පවතින මුළු සතොස වෙළඳ ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතන අතරින් රජයේ ගොඩනැගිලිවල පවත්වාගෙන යනු ලබන සතොස වෙළඳ ආයතන සංඛ්‍යාව සහ කුලී පදනම මත පවත්වාගෙන යනු ලබන සතොස වෙළඳ ආයතන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කුලී පදනම මත ලබාගත් ගොඩනැගිලි සඳහා කුලී ගෙවීමට සතොස මඟින් වාර්ෂිකව කොපමණ මුදලක් වැය කරන්නේද;

(ii) කුලියට ලබාගත් ගොඩනැගිලි පිහිටා තිබෙන ස්ථාන කවරේද; එම ස්ථානවල හිමිකරුවන් කවුරුන්ද සහ ඔවුන්ට මාසිකව ගෙවන කුලී මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ස්ථානවල දැනට පවත්වාගෙන යන සහ වසා දමා ඇති සතොස ආයතන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) සතොස වෙළඳ ආයතන පිහිටුවීමට කුලී පදනම මත ගොඩනැගිලි ලබා ගැනීමේදි විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කරන්නේද;

(ii) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

632/'16

8.

ගරු ජයන්ත සමරවීර මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 1948 සිට 2015 ජනවාරි 08 දක්වා කාලය තුළ සැකපිට රක්ෂිත බන්ධනාගාරගත කළ හා චෝදනා ඔප්පු වීමෙන් පසු වැරදිකරුවන් ලෙස සිරගත කළ බෞද්ධ භික්ෂූන්වහන්සේලා සංඛ්‍යාව, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) රක්ෂිත බන්ධනාගාරගත කළ හෝ සිරගත කළ භික්ෂූන්වහන්සේලා රක්ෂිත බන්ධනාගාරගත කිරීමට හෝ සිරගත කිරීමට හේතු වූ චෝදනාව හෝ වරද, එක් එක් භික්ෂූන්වහන්සේ අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) රක්ෂිත බන්ධනාගාරගත කළ හෝ සිරගත කළ භික්ෂූන්වහන්සේලා රක්ෂිත බන්ධනාගාරගතව හෝ සිරගත කර සිටි කාලය, එක් එක් භික්ෂූන්වහන්සේ අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ආ) (i) 2015.01.08 සිට 2016.03.31 දක්වා කාලය තුළ රක්ෂිත බන්ධනාගාරගත කළ භික්ෂූන්වහන්සේලා සංඛ්‍යාව කොපමණද;

(ii) රක්ෂිත බන්ධනාගාරගත කළ භික්ෂූන්වහන්සේලාට එල්ල වුණු චෝදනාව, එක් එක් භික්ෂූන්වහන්සේ අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මෙම භික්ෂූන්වහන්සේලා රක්ෂිත බන්ධනාගාර ගත කර සිටි කාලය, එක් එක් භික්ෂූන්වහන්සේ අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2016 අගෝස්තු මස 11 වැනි බ්‍රහස්පතින්දා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

375/'15

1.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) වර්ෂ 2005 සිට 2015 දක්වා වසරවල එක්සත් ජාතීන්ගේ මහ සමුළුවට (General Assembly) සහභාගී වූ ශ්‍රී ලාංකික නියෝජිත කණ්ඩායම්වල,

(i) ප්‍රධානත්වය දැරුවේ කවුරුන්ද;

(ii) නියෝජිතයින් සංඛ්‍යාව කවරේද;

(iii) ඒ අතර පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සිටියේ නම්, ඔවුන්ගේ නම් කවරේද;

(iv) විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(v) වැය කළ මුළු මුදල කොපමණද;

(vi) එම වියදම ගුවන් ගමන්, හෝටල් හා නවාතැන් වියදම් ලෙස එක් එක් ශීර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

387/'15

2.

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේදී යුධ හමුදාවට ශාරීරික අභ්‍යාස සඳහා අවශ්‍ය කැන්වස් සපත්තු මිලදී ගැනීමට ටෙන්ඩර් කැඳවූ අවස්ථාවේ ඒ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ ආයතන කවරේද;

(ii) එම ආයතන ඉදිරිපත් කළ ටෙන්ඩර් වටිනාකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ටෙන්ඩරය ලබාගත් ආයතනය කවරේද;

(iv) එම ආයතනයට ටෙන්ඩරය ලබාදීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2015 වර්ෂයේදී මෙම සපත්තු මිලදී ගැනීමට අදාළ ආරක්ෂක අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩලයේ සිටි නිලධාරින්ගේ නම් හා තනතුරු කවරේද;

(ii) මෙම නිලධාරින් ටෙන්ඩර් මණ්ඩලයේ කොපමණ කාලයක සිට කටයුතු කරන්නේද;

(iii) 2015 වර්ෂයේදී මෙම සපත්තු මිලදී ගැනීමට අදාළ යුධ හමුදා ටෙන්ඩර් මණ්ඩලයේ සිටි නිලධාරින්ගේ නම් හා තනතුරු කවරේද;

(iv) මෙම නිලධාරින් ටෙන්ඩර් මණ්ඩලයේ කොපමණ කාලයක සිට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ආරක්ෂක අමාත්‍යාංශය හා යුධ හමුදා ටෙන්ඩර් මණ්ඩලවල අඛණ්ඩව සේවය කරන නිලධාරින් ඉවත් කිරීමට රජය කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කවර දිනයකදීද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

509/'16

3.

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) සුනාමි ව්‍යසනය නිසා දිවයිනේ විවිධ පළාත්වල නිවාස හා දේපළ අහිමි වූ පවුල් ගණනාවක් මේ වනවිටත් අසරණභාවයෙන් පසුවන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නිවාස අහිමිවී සිටින පුද්ගලයින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් තෝරාගෙන ඔවුන්ට ස්ථිර නිවාස ලබාදීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නේද;

(ii) ආපදා කළමනාකරණ අමාත්‍යාංශය සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය ඒකාබද්ධව එම වැඩපිළිවෙළ ක්‍රියාවට නැංවීම කෙරෙහි අවධානය යොමු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

554/'16

4\.
ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා,— තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 වර්ෂයේදී තැපැල් දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ තැපැල් සේවයේ, "ආ" කාණ්ඩයේ 1 "ආ" ශ්‍රේණියේ, තැපැල් "සේවා නිලධාරි" තනතුරට බඳවා ගැනීම සඳහා පැවැත්වූ තරඟ විභාගයට පෙනී සිටි (විභාග අංකය - PS/ C/05264) දෙහිඅත්තකණ්ඩිය, රන්හෙලගම, අංක 159 දරන ලිපිනයේ පදිංචි, එන්. ජී. සුනිල් ශාන්ත මහතා එම විභාගයෙන් සමත් වී ඇති බවත්;

(ii) එසේ වුවද , ඔහු මේ වනතෙක් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) තරඟ විභාගයෙන් ලබා ගෙන ඇති ලකුණු සැලකිල්ලට ගෙන, ඔහු එම තනතුරට පත්කිරීම සඳහා සලකා බලන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

592/'16

5\.
ගරු ලකී ජයවර්ධන මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත්ව තිබී 1994.12.31 දින සිට මේ දක්වා කාලය තුළ විවිධ පුද්ගලයන්ට සහ ආයතනවලට ලබා දී ඇති මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටි ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් ලබා දී ඇති පුද්ගලයින් සහ ආයතන, පිහිටි ස්ථාන, ප්‍රමාණයන් සහ වටිනාකම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ඉඩම් ලබාදීමෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට ලැබී ඇති මුළු ආදායම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ඉඩම්වලින්, මේ වනවිට සංවර්ධනය කර හා නොකර ඇති ඉඩම් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ජාතික ආර්ථිකයට දායකත්වයක් ලබා දිය හැකි එහෙත් නිසි සංවර්ධනයක් සිදුකර නොමැති ඉඩම් නැවත ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට පවරා ගැනීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

613/'16

6\.
ගරු ඉෂාක් රහුමාන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2008 සිට 2015 දක්වා කාලය තුළ පළාත් පාසල්වල වැඩ බැලීමේ පදනම මත පත් කරනු ලැබූ විදුහල්පතිවරුන් 4000ක් පමණ පාසල්වල මූල්‍ය කටයුතු සහ පරිපාලන කටයුතු පිළිබඳව දැනුම හා පුහුණුවීම් ලබාගෙන ඇති බවත්;

(ii) විදුහල්පති සේවයට බඳවා ගැනීමේ තරඟ විභාගය වර්ෂ 2005න් පසුව 3 වන ශ්‍රේණිය සඳහා පමණක් 2015 දී පවත්වා ඇති බවත්;

(iii) එම විභාගයට පෙනී සිටීම සඳහා අවුරුදු 50 ඉක්මවූවන්ට අවස්ථාව ලබා දී නොමැති අතර 3 වන ශ්‍රේණියේ විදුහල්පති තනතුරට වඩා ඉහළ වැටුප් තලයක සිටි ගුරුවරුන් බොහෝ දෙනෙකු ඉදිරිපත්ව නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) විදුහල්පති සේවා ව්‍යවස්ථාව අනුව, අවුරුදු 03කට වඩා කාලසීමාවක් එම පදනම මත සේවය කළ අය සම්මුඛ පරීක්ෂණ මඟින් පත්කළ යුතු වුවත්, මේ වනතුරු රජයේ පාසල්වල වැඩ බලන විදුහල්පතිවරුන්ගේ සේවය ස්ථිර නොකිරීමට හේතුව කවරේද;

(ii) තරඟ විභාගයට හෝ පෙනී සිටීමට අවස්ථාව නොලද අවුරුදු 50 ඉක්මවූ වැඩ බලන විදුහල්පතිවරුන්ගේ සේවය ස්ථිර කිරීමට පියවර ගන්නේද;

(iii) පසුගිය රජය සමයේ දේශපාලන පළිගැනීම්වලට ලක්වූවන් සඳහා සහන සලසන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

620/'16

7\.

ගරු වාසුදේව නානායක්කාර මහතා,— නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන්හි,

(i) නොමිලේ පවත්වන පාඨමාලා සංඛ්‍යාව කොපමණද; එම පාඨමාලා කවරේද;

(ii) මුදල් අයකර පවත්වනු ලබන පාඨමාලා සංඛ්‍යාව කොපමණද; එම පාඨමාලා කවරේද;

(iii) ඉල්ලුම් කරන සුදුසුකම් ඇති සියලු සිසුන් පාඨමාලා සඳහා ඇතුළත්කර ගන්නේද;

(iv) පහසුකම් ප්‍රමාණවත් නොවන පාඨමාලා කවරේද;

(v) ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පහසුකම් වැඩිකළහොත් බඳවා ගන්නා සිසුන් ප්‍රමාණය වැඩිවන බව පිළිගන්නේද;

(ii) සංවර්ධන අවශ්‍යතා හඳුනාගෙන එම අවශ්‍යතා සපුරාලීම සඳහා පහසුකම් වැඩි කරනු ලබන දිනය කවරේද;

(iii) "මෘදු කුසලතාවයන්ගේ සංවර්ධන අවශ්‍යතාවය හඳුනාගෙන එම අවශ්‍යතා සපුරාලීම සඳහා කටයුතු කරමින් පවතී" යන්නෙන් අදහස් කරන භෞතික ප්‍රගතිය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

621/'16

8\.

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වංචා හා දූෂණ චෝදනා රාශියක් සම්බන්ධයෙන් ඌව පළාත් ප්‍රධාන අමාත්‍යවරයාට එරෙහිව මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට පැමිණිලි කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ප්‍රධාන අමාත්‍යවරයා විසින් උපදේශකයින් බඳවාගෙන තිබේද;

(ii) එසේ නම්, ඒ කවර බලතල යටතේද;

(iii) බඳවාගෙන ඇති උපදේශකවරයන්/උපදේශකවරියන්ගේ නම් හා ඔවුන්ට ගෙවන දීමනා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම පුද්ගලයින් නීතිවිරෝධීව බඳවාගෙන තිබේ නම්, ඔවුන් ඉවත් කිරීමට හා ඒ සම්බන්ධයෙන් ප්‍රධාන අමාත්‍යවරයාට එරෙහිව නීත්‍යානුකූල පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

626/'16

9.

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 අයවැය යෝජනා යටතේ බදු ගෙවන්නන් දිරි ගැන්වීම සඳහා අඛණ්ඩව වසර 10ක් අවම වශයෙන් වසරකට රු.250,000/-ක බදු ගෙවා ඇති පුද්ගලයින් විසින් වාහනයක් මිලදී ගැනීමේදී ඒ සඳහා අය කරන බද්දෙන් 25%ක බදු සහනයක් ලබා දී ඇති බවත්;

(ii) එම බදු සහනය අහෝසි කරන මෙන් 2015 සැප්තැම්බර් මාසයේදී මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ලිපියකින් දන්වා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම වරප්‍රසාදය අහිමි කිරීමට හේතු කවරේද;

(ii) එම වරප්‍රසාදය අහෝසි කරන අවස්ථාව වනවිටත් වාහන ගෙන්වීම සඳහා ණයවර ලිපි ආරම්භ කර අපහසුතාවයට ලක්වී සිටින පුද්ගලයින්ට ලබා දෙන සහනය කවරේද;

(iii) මෙම බදු සහනය ලබා දීම පිණිස පවතින නිර්ණායක සමාලෝචනය කර ඉදිරි කාලයේදී එය නැවත ලබා දීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ පිළිබඳව සවිස්තර වාර්තාවක් මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

630/'16

10.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2001 – 2004 දක්වා පැවති එක්සත් ජාතික පක්ෂ රජය විසින් දීර්ඝකාලීන බදු පදනම මත පෞද්ගලික සමාගම් හෝ පුද්ගලයින් වෙත ලබාදී ඇති ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් කොළඹ, වොක්ෂෝල් වීදියේ පිහිටි, ගබඩා සංකීර්ණ සංඛ්‍යාව කොපමණද;

(ii) බදු දී ඇති ගබඩාවේ නම, වර්ග අඩි ප්‍රමාණය, බදු දුන් මුදල සහ බදු දුන් සමාගම හෝ පුද්ගලයාගේ නම, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ගබඩා බදු දී ඇත්තේ අමාත්‍ය මණ්ඩල අනුමතියකට, විවෘත ටෙන්ඩර් පටිපාටියකට හෝ රජයේ තක්සේරුවකට යටත්වද;

(ii) එවැනි කොන්දේසි කිසිවක් නොමැතිව මෙම ගබඩා බදු දී ඇත්නම්, ඒවා නැවත රජයට පවරා ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

633/'16

11.

ගරු ජයන්ත සමරවීර මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 1948 පෙබරවාරි 04 දින සිට 2016 මාර්තු 24 දක්වා කාලය තුළ මරණීය දණ්ඩනය හෝ ජීවිතාන්තය දක්වා සිරදඬුවම් නියම වූ පුද්ගලයින් සංඛ්‍යාව, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මරණීය දණ්ඩනයට හෝ ජීවිතාන්තය දක්වා සිරදඬුවම් නියම වූ සිරකරුවන්ගේ නම, ලිපිනය හා එවැනි දඬුවමක් නියම කිරීමට එකී සිරකරුවන් සිදුකළ වරද කුමක්ද යන්න එක් එක් සිරකරුවා අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ආ) (i) මරණ දඬුවම හෝ ජීවිතාන්තය දක්වා සිරදඬුවම් ලබා සිටි සිරකරුවන් සඳහා විශේෂ සමාවක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, විශේෂ සමාව ප්‍රදානය කරනු ලැබුවේ කවුරුන් විසින් කවර දිනයකදී, කවර දඬුවමකට ලක්ව සිටි, කවර සිරකරුවන්ටද යන්න වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

641/'16

12.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ පුරෝකථනයන් අනුව 2016 වර්ෂයේ සමස්ත විදේශ විනිමය ලැබීම් සහ ගෙවීම් කොපමණද;

(ii) 2016 වර්ෂය සඳහා පුරෝකථනය කරන ලද ගෙවුම් ශේෂ හිඟය කොපමණද;

(iii) එම ගෙවුම් ශේෂ හිඟය පියවා ගැනීම සඳහා රජය විසින් ගැනීමට අපේක්ෂා කරන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

700/'16

13.

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ 3, ඇල්ප්‍රඩ් හවුස් ගාඩන්හි, අංක 10, ප්‍රින්ස් ඇල්ප්‍රඩ් ටවර් යන ලිපිනයෙහි, පදිංචි අර්ජුන ජෝශප් ඇලොසියස් මහතා ඩබ්ලිව්. එම්. මෙන්ඩිස් අරක්කු නිෂ්පාදන සමාගමෙහි අධ්‍යක්ෂවරයෙකු වශයෙන්, ධාන්‍ය මඟින් ස්ප්‍රීත්තු පෙරීමේ බලපත්‍රයක් (එතනෝල් බලපත්‍රය දෙපාර්තමේන්තුවෙන් ඉල්ලුම්කර තිබේද;

(ii) එසේ නොවේ නම්, ඩබ්ලිව්. එම්. මෙන්ඩිස් සහ සමාගම විසින් එවැනි බලපත්‍රයක් ඉල්ලුම් කර තිබේද;

(iii) ඩබ්ලිව්. එම්. මෙන්ඩිස් සහ සමාගමෙහි අධ්‍යක්ෂවරුන් කවරේද;

(iv) 2015.01.08 දිනයෙන් පසු මේ දක්වා ධාන්‍ය මගින් ස්ප්‍රීත්තු පෙරීමේ බලපත්‍ර (එතනෝල් බලපත්‍ර) කොපමණ ප්‍රමාණයක් සුරාබදු දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර තිබේද, ඒ කවර පුද්ගලයන් / ආයතන වෙනුවෙන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

702/'16

14\.

ගරු විජිත හේරත් මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ සේවකයන් සඳහා යතුරුපැදි ලබාදීමේ වැඩපිළිවෙළට පවුල් සෞඛ්‍ය සේවා නිලධාරින් ඇතුළත් බවත්;

(ii) ක්ෂේත්‍ර සහ රෝහල් රාජකාරියේ යෙදී සිටින දෙපිරිසටම මෙම යතුරුපැදි දීමනාව හිමි බවත්;

(iii) යම් පළාත්වල යතුරුපැදි ලබාදීම නිසි පරිදි සිදුවී ඇතත්, පළාත් කිහිපයක එය නිසි පරිදි ක්‍රියාත්මක වී නොමැති බවත්;

(iv) විශේෂයෙන් ගම්පහ රෝහලේ සේවයේ නියුතු පවුල් සෞඛ්‍ය සේවා නිලධාරින් සඳහා මේ වනතුරුත් යතුරුපැදි ලබාදීම සිදුවී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ගම්පහ ඇතුළු දිවයින පුරා එම යතුරුපැදි නොලද සැමට යතුරුපැදි ලබාදීම සඳහා පියවර ගන්නේද;

(ii) ඒ සඳහා ගතවිය හැකි කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

388/'15

15\.

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආයුර්වේද උපාධිය සම්පූර්ණ කළ දහසකට අධික පිරිසක් රැකියා විරහිතව සිටින බවත්;

(ii) ඔවුන්ට රැකියා ලබා දීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් මෙතෙක් ක්‍රියාත්මක වී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) රාජ්‍ය අංශයේ දැනට ආයුර්වේද වෛද්‍ය පුරප්පාඩු තිබේද;

(ii) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

(iii) ආයුර්වේද වෛද්‍ය උපාධිධාරීන්ගේ විරැකියා ගැටලුව විසඳීමට එතුමා කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ කෙසේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2016 අගෝස්තු මස 12 වැනි සිකුරාදා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

389/'15

1.

ගරු බුද්ධික පතිරණ මහතා,— ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඉඟුරු වගාවට දිලීර රෝගයක් වැළඳී ඇති බවත්;

(ii) එහෙයින් කළුතර දිස්ත්‍රික්කය ඇතුළු දිස්ත්‍රික්ක ගණනාවක ඉඟුරු වගාවට හානි වී ඇති බවත්;

(iii) මේ වනවිට ඉඟුරු මිල ඉතා පහළ අගයක පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) උක්ත දිලීර හානිය වළක්වා ගැනීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පියවරගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 2015 වර්ෂය තුළදී ශ්‍රී ලංකාවට ආනයනය කළ ඉඟුරු ප්‍රමාණය කිලෝග්‍රෑම් කොපමණද;

(ii) රටට අවශ්‍ය ඉඟුරු ප්‍රමාණය රට තුළම නිෂ්පාදනයට අවශ්‍ය පියවර ගෙන තිබේද;

(iii) එසේ නම්, එම පියවර කවරේද;

(iv) ඉඟුරු ආනයනය සීමා කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) ඉඟුරු මිල ඉහළ නැංවීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කෙසේද;

(iii) ඉඟුරු වගාව දියුණු කිරීමට ගන්නා වෙනත් ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

572/'16

2.

ගරු සෙය්යිඩ් අලි සාහීර් මවුලානා මහතා,— රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සම්මන්තුරේ, අම්පාර පාර, පෝඩියාර් වීදිය, අංක 438 දරන ස්ථානයේ පදිංචි, කේ. එල්. ෆස්ලි නිසාර් මහතාගේ ආබාධිත විශ්‍රාම වැටුප් (වි. වැ. අංක 01-857916) අයදුම්පත්‍රය හා එයට අදාළ සෞඛ්‍ය 307 වාර්තාව (ආබාධිත තත්ත්වයට පත්වූ නිවැරදි දිනය වන 2006.04.18 දිනය සඳහන් කර), අංක DSS/FMG/PEN/DI/2013-2 හා 2013.12.19 දිනැති ලිපිය මඟින් සම්මන්තුරේ ප්‍රාදේශීය ලේකම් විසින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් දැනුවත් කරන ලද බව දන්නේද;

(ii) එසේ නම්, ඔහුගේ විශ්‍රාම වැටුප කඩිනමින් ලබාදීමට පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

595/’16

3\.

ගරු ලකී ජයවර්ධන මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කර ඇති දේශීය හා විදේශීය පෞද්ගලික මූල්‍ය සමාගම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සමාගම් සහ ඒවා පිහිටා ඇති ස්ථාන කවරේද;

(iii) සමහර මූල්‍ය සමාගම්, ගනුදෙනුකරුවන් අපහසුතාවයට පත්වන අයුරින් කටයුතු කරන බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම සමාගම්වල ක්‍රියා කලාපයන් නිසා අපහසුතාවයට පත්වූ ගනුදෙනුකරුවන්, එම සමාගම්වලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති බව එතුමා දන්නේද;

(ii) එසේ නම්, ගනුදෙනුකරුවන්හට සිදුවන අපහසුතා අවම කිරීම සඳහා මූල්‍ය ආයතන නියාමනය කිරීමට විධිමත් ක්‍රමවේදයක් සකස් කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

610/’16

4\.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පිළිකා රෝගීන් සඳහා ලබාදෙන NIMOTUZUMAB නමැති ඖෂධය ශ්‍රී ලංකාවට ආනයනය කර ඇති වාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඖෂධය ආනයනය කරන ලද දින කවරේද;

(iii) එක් එක් වාරයේදී ආනයනය කරන ලද ඖෂධ ප්‍රමාණ, ඒ සඳහා වැය වූ මුදල, ආනයනය කළ සමාගම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ඖෂධය ගෙන්වීම සඳහා ජාතික අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලයේ හෝ වෙනත් ආයතනයක, අදාළ සමාගම් ලියාපදිංචි වී තිබේද;

(ii) එසේ නම්, එම දින කවරේද;

(iii) එම ඖෂධය තවමත් පර්යේෂණ අවස්ථාවේ පවතින බව පිළිගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

622/’16

5\.

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඌව පළාත් ප්‍රධාන අමාත්‍යවරයා විසින් පළාත් සභා ගිණුමක් සිය පෞද්ගලික පරිහරණයට පවරාගෙන ඇති බව දන්නේද;

(ii) පවතින මූල්‍ය රෙගුලාසිවලට සහ පළාත් සභා රීතීන්ට එය කෙතෙක් දුරට එකඟද;

(iii) යම් නීතිවිරෝධී හෝ අයථා ගණුදෙනුවක් සිදු වී තිබේනම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

628/'16

6.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2001 – 2004 කාලය තුළ පැවති එක්සත් ජාතික පක්ෂ රජය විසින් විකිණීමේ හෝ දීර්ඝකාලීන බදු පදනම මත පෞද්ගලික සමාගම් හෝ පුද්ගලයින් වෙත ලබාදී ඇති රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් වතු සංඛ්‍යාව කොපමණද;

(ii) එම වතුවල නම්, ඒවායේ අක්කර ප්‍රමාණය, විකිණූ හෝ බදු දුන් මුදල, විකිණූ හෝ බදු පදනම මත ලබාදුන් සමාගම් හෝ පුද්ගලයින්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම වතු ලබා දී ඇත්තේ කැබිනට් අනුමතිය, විවෘත ටෙන්ඩර් පටිපාටියකට අනුව හෝ රජයේ තක්සේරුවකට යටත්වද;

(iv) එවැනි කොන්දේසි කිසිවක් නොමැතිව මෙම ඉඩම් විකුණා හෝ බදු දී ඇත්නම්, එම ඉඩම් නැවත රජයට පවරා ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

635/'16

7.

ගරු වාසුදේව නානායක්කාර මහතා,— රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විශ්‍රාම වැටුප් විෂමතාවය ඉවත් කරන බවට පසුගිය මැතිවරණ සමයේ දුන් පොරොන්දුව අනුව එම විෂමතාවය ඉවත් කර තිබේද;

(ii) විශ්‍රාම වැටුප් විෂමතා සකස් කර ගෙවීම් කරන තෙක් එකවර මාස 2ක් සඳහා ගෙවන ලද දීමනාව පසුව ආපසු අය කර ගෙන තිබේද;

(iii) විශ්‍රාම වැටුප් ගෙවීමේදී එම වැටුපෙන් වැන්දඹුවන්ට ගෙවූ මුදල කපා හැර තිබේද;

(iv) කලින් විශ්‍රාම වැටුප් ගෙවීමේදී වයස 21ට අඩු අවිවාහක ගැහැණු දරුවන්ට හා වයස 18ට අඩු දරුවන්ට තිබූ විශ්‍රාම වැටුපෙන් හිමිකම් මේ වනවිට අහිමිකර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

642/'16

8.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත හෝ පනතේ සංකල්පීය පත්‍රිකාවක් කෙටුම්පත් කිරීම සඳහා කිසියම් පුද්ගලයන් පිරිසකට ගෙවීමක් කර තිබේද;

(ii) ගෙවීම් ලද පුද්ගලයින්ගේ නම්, ගෙවීමට හේතු සහ එක් එක් පුද්ගලයාට ගෙවන ලද මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

650/'16

9\.

ගරු එස්. එම්. මරික්කාර් මහතා ,— ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015.10.01 සිට 2016.03.30 දක්වා කාලය තුළ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට බඳවාගෙන ඇති සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් කවරේද;

(iii) ඔවුන් බඳවා ගත් ක්‍රියාපටිපාටිය කවරේද;

(iv) ඔවුන් බඳවා ගැනීම සඳහා අනුමත කාර්ය මණ්ඩල පුරප්පාඩු තිබුණේද;

(v) එසේ නම්, පැවති අනුමත කාර්ය මණ්ඩල පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(vi) එක් එක් පුද්ගලයා තෝරා ගත් නිර්ණායකයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

658/'16

10\.

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුස්ලිම් විවාහ හා දික්කසාද පනත යටතේ පත්කරනු ලබන ක්වාසි විනිසුරුවන් සඳහා ලබාදෙන රු.6000/-ක මාසික දීමනාව සහ ලිපිකරු දීමනා ඇතුළු කාර්යාල පහසුකම් සඳහා ලබාදෙන රු.5000/-ක දීමනාව කිසිසේත් ප්‍රමාණවත් නොවන බව පිළිගන්නේද;

(ii) වර්තමාන ජීවන තත්ත්වය හා වියදම් සැලකිල්ලට ගෙන එම දීමනා වැඩිකිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

664/'16

11\.

ගරු බිමල් රත්නායක මහතා,— වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කන්කසන්තුරේ වරාය නවීකරණය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය, ඉන්දීය රජය හෝ ඉන්දියානු සමාගමක් සමඟ ගිවිසුමක් හෝ එකඟතාවයක් ඇති කරගෙන තිබේද;

(ii) එසේ නම්, එම ගිවිසුම හෝ එකඟතාවය මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

(iii) එම ගිවිසුම හෝ එකඟතාවය සඳහා කැබිනට් මණ්ඩලයේ හා නීතිපති දෙපාර්තමේන්තුවේ අනුමතිය සහ නිරීක්ෂණ සහිත ලියවිලි ඉදිරිපත් කරන්නේද;

(iv) මෙම කොන්ත්‍රාත්තුව අදාළ සමාගමට ලබා දී ඇත්තේ, විවෘත ටෙන්ඩර් පටිපාටි අනුගමනය කිරීමෙන්ද;

(v) කොන්ත්‍රාත්තුවට අනුව වරාය නවීකරණය කිරීම සඳහා දැරීමට සිදුවන මුදල කොපමණද;

(vi) නවීකරණ කටයුතු අවසන් කිරීමට ගත වන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

701/'16

12.

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අනුව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ශක්තිමත් කිරීම සඳහා ලබාදුන් මූලධන ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(ii) 2016.03.01 දිනෙන් පසු, එකී කොමිෂන් සභාව විසින් මූලධන ප්‍රතිපාදන බෙදා වෙන්කළ ආකාරය කවරේද;

(iii) රුපියල් මිලියන 123ක මූලධන ප්‍රතිපාදනවලට අමතරව, 2016 වර්ෂය වෙනුවෙන්, තවත් අතිරේක මූලධන ප්‍රතිපාදන ඉල්ලීමක් මුදල් අමාත්‍යාංශය වෙත ලැබී තිබේද;

(iv) එසේ නම්, එම අමතර ප්‍රතිපාදන ඉල්ලීමේ අරමුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

709/'16

13.

ගරු එස්. වියාලේන්දිරන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2015 ජනවාරි 8 වැනි දා සිට හඳුන්වා දෙන ලද දින 100 වැඩසටහන ආරම්භයේ සිට අද දක්වා අධ්‍යාපන අමාත්‍යාංශයේ සුළු සේවක පත්වීම් ලබා දී තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම පත්වීම් ලබාදීමේදී සලකා බැලූ සුදුසුකම් කවරේද;

(ii) එලෙස පත්වීම් කොපමණ සංඛ්‍යාවක් ලබා දී තිබේද;

(iii) එම පත්වීම් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම පත්වීම් ලබා දී ඇති දෙමළ ජාතික සුළු සේවකයින් සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

710/'16

14.

ගරු ප්‍රසන්න රණතුංග මහතා,— සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015.01.08 වැනි දිනට සමෘද්ධි ආධාර හිමි වූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සමෘද්ධි ප්‍රතිලාභීන් වෙනුවෙන් ආධාර ලබාදීම සඳහා වැයකළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2016.04.30 වැනි දිනට සමෘද්ධි ආධාර හිමි වූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සමෘද්ධි ප්‍රතිලාභීන් වෙනුවෙන් ආධාර ලබාදීම සඳහා රජය වැයකළ මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

711/'16

15.

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 වර්ෂයේ ගඟ ඉහළ ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ, ගිරාඋල්ල වසමේ ගොවි නියාමක වශයෙන් කටයුතු කරන උපාලි කුමාර කිත්සිරි යන අය වංචනික ලෙස රජයේ මුදල් යොදා ගනිමින් තම පෞද්ගලික නිවසට යන මාර්ග සකස් කර ඇති බවත්;

(ii) එම මාර්ගය ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට අයත් නොවන බවත්;

(iii) අනවසරයෙන් හා බලහත්කාරයෙන් ගිරාඋල්ල විහාරයට අයත් කුඹුරු ඉඩම ද පුරවා සකස් කරන ලද බවත්;

(iv) ඉහත මාර්ගය සකස් කිරීම සඳහා රජයේ මුදල් ගෙවා ඇති බවත්;

(v) පුද්ගලික මාර්ගයකට රජයේ මුදල් ගෙවීම හා අනවසරයෙන් කුඹුරු ගොඩකිරීම සඳහා දේශපාලන බලය උපයෝගී කරගත් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මේ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා.8/'15

1.

ගරු බුද්ධික පතිරණ මහතා,— රජයේ පාසල් හා විශ්වවිද්‍යාල නිවාඩු දිනවලදී එම මධ්‍යස්ථාන අධ්‍යාපන ඒකක සඳහා ලබාදීම,— රජයේ පාසල් නිවාඩු කාලයේදී සහ සවස් වරුවලත් විශ්වවිද්‍යාල නිවාඩු දිනවලත් එම මධ්‍යස්ථාන මුල් කොට ගෙන ව්‍යාපාරික ප්‍රජාව, රාජ්‍ය නොවන සංවිධාන, වාණිජ මණ්ඩල, ප්‍රජා මූල සංවිධාන සම්බන්ධ කර ගන්නා වූ පුළුල් වැඩපිළිවෙළක් වශයෙන් වැඩිහිටි හා නොවිධිමත් අධ්‍යාපන ඒකක සහනදායී ගාස්තු පදනමක් මත ආරම්භකළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.9/'15

2.

ගරු බුද්ධික පතිරණ මහතා,— පුරප්පාඩු වන ග්‍රාම නිලධාරී තනතුරු වල වැඩ බැලීමේ පත්වීම් සඳහා කාර්යක්ෂම වැඩපිළිවෙළක් සකස් කිරීම,— ග්‍රාම නිලධාරී තනතුරක පුරප්පාඩු ඇති වූ විට ආසන්න ග්‍රාම නිලධාරී වසමේ ග්‍රාම නිලධාරීවරයා වැඩ බැලීම සඳහා පත් කරනු ලබන්නේ ඉතා සුළු දීමනාවක් යටතේ බැවින් ද, මෙම වැඩ බැලීමේ පත්වීම් තුළින් ග්‍රාම නිලධාරී වසම් දෙකෙහිම කාර්යක්ෂමතාව බිඳ වැටෙන බැවින්ද, එම තත්වය මග හරවා ගැනීම සඳහා සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම ග්‍රාම නිලධාරී සංචිතයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ පිහිටුවිය යුතු අතර පුරප්පාඩු සිදුවන වසම සඳහා එකී සංචිතය තුළින් ග්‍රාම නිලධාරින් පත් කිරීම සහ එම සංචිතය තුළ සිටින ග්‍රාම නිලධාරීන්ට ප්‍රාදේශීය ලේකම් විසින් පවරනු ලබන වෙනත් ඵලදායී ක්ෂේත්‍ර හෝ රාජකාරී සඳහා යෙදවීමේ වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.10 /'15

3.

ගරු බුද්ධික පතිරණ මහතා,— වර්තමානයේ ක්‍රියාත්මක වන සිවිල් ආරක්ෂක කමිටුවලට නිල පිළිගැනීමක් ලබා දීම,— සෑම ග්‍රාම නිලධාරී වසමකම පිහිටා ඇති ආගමික සිද්ධස්ථානයන්හි නායක ස්වාමීන්වහන්සේ, පූජකතුමා, විදුහල්පතිතුමා, ග්‍රාම නිලධාරී, සමෘද්ධි සංවර්ධන නිලධාරී, කෘෂිකර්ම පර්යේෂණ සහකාරවරයා, ජන සභා ලේකම්වරු, ප්‍රදේශයේ පොලිස් ස්ථානය නියෝජනය කරන නිලධාරියකු සහ එම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ස්වේච්ඡා සංවිධාන, රාජ්‍ය හා පෞද්ගලික අංශ වල සේවය කරන අදාළ වසමේ පදිංචිව සිටින නියෝජිතයින්ගෙන් සමන්විත සිවිල් ආරක්ෂක කමිටු ගොඩනැගීමට වඩාත් පහසුවීම සඳහා වර්තමාන සිවිල් ආරක්ෂක කමිටුවලට නිල පිළිගැනීමක් ලබා දිය හැකි පරිදි පාර්ලිමේන්තු පනතක් සම්මත කළ යුතු යැයි ද, ඒ තුළින් ග්‍රාම නිලධාරී වසම තුළ සිදුවන අපරාධ හා දූරාචාර, නීති විරෝධී කටයුතු පිළිබඳ අදාළ අංශ සමඟ මනා සම්බන්ධීකරණයක් ගොඩනැගීමට හැකි වන පරිදි අදාළ නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.11/'15

4.

ගරු බුද්ධික පතිරණ මහතා,— දිවයින තුළ දැනට ක්‍රියාත්මක වන යල් පැන ගිය නීති අණපනත් යාවත්කාලීන කිරීම,— ශ්‍රී ලංකාවේ මේ වනවිටත් අධිරාජ්‍යවාදී යුගයේදී හඳුන්වාදෙන ලද නීති අණපනත් ක්‍රියාත්මකවන බැවින් එම නීති අණපනත් යළි අධ්‍යනය කිරීමේ කමිටු පත්කර, යල් පැනගිය දඬුවම්, දඩ මුදල් ආදිය යාවත්කාලීන කිරීමේ ජාතික වැඩපිළිවෙළක් ක්‍රියාවට නැංවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.12/'15

5.

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලු මැතිවරණ එකම දිනක පැවැත්වීම,— ශ්‍රී ලංකාව තුළ1988 සිට 2010 දක්වා වසර 22ක කාලය තුළ 1990, 1992, 1995, 1996, 1998, 2003 සහ 2007 වසරවලදී හැර අන් සෑම වසරකදීම කිසියම් මැතිවරණයක් පවත්වා ඇති අතර, එසේ මැතිවරණ පැවැත්වීම ජනතා මතය සලකා බැලීම සඳහා වටිනා නිර්ණායකයක් වුවද, මේ තුළින් රටේ ආර්ථිකය, පරිපාලනය ආදි සෑම ක්ෂේත්‍රයකටම දැඩි බලපෑමක් ඇති කරන බැවින් පළාත් පාලන මැතිවරණ, මහා මැතිවරණ සහ ජනාධිපතිවරණය එකම දිනයකදී පැවැත්වීමට හැකි වන පරිදි එකී ආයතනවල නිල කාලය සංශෝධනය කිරීමටත්, ගැලපෙන මැතිවරණ ක්‍රමවේදයක් නිර්මාණය කිරීමටත් සුදුසු පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.13/'15

6.

ගරු බුද්ධික පතිරණ මහතා,— පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමට කටයුතු කිරීම,— රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය වඩාත් ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව පාර්ලිමේන්තුව හා පළාත් සභා අතරත්, පළාත් සභා හා පළාත් පාලන ආයතන අතරත් මනා සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යාම අත්‍යාවශ්‍ය වන අතර ඒ සඳහා පළාත් පාලන ආයතන ප්‍රධානීන්, පළාත් සභා තුළ නියෝජනයවීම සහතිකවනු පිණිස ද, පළාත් සභා ප්‍රධානීන් පාර්ලිමේන්තුව තුළ නියෝජනය වීම සහතිකවනු පිණිසද ක්‍රමවේදයක් සකස් කිරීමට අවශ්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.14/'15

7.

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික ඒකාග්‍රතාව ඇති කිරීමට පියවර ගැනීම,— ජාතික ඒකාග්‍රතාවය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දෙමළ භාෂාව කථා කරන ජනතාව ජීවත් වන ප්‍රදේශවල සිංහල භාෂා පුහුණු වැඩසටහන් ද, සිංහල භාෂාව කථා කරන ජනතාව ජීවත් වන

ප්‍රදේශවල දෙමළ භාෂා පුහුණු වැඩසටහන් ද, රාජ්‍ය, රාජ්‍ය නොවන හා පෞද්ගලික ආයතනයන්හි සහයෙන් ක්‍රියාත්මක විය යුතු අතර රාජ්‍ය හා පෞද්ගලික විද්‍යුත් මෙන්ම මුද්‍රිත මාධ්‍ය ආයතනවල සහයෝගය ලබාගනිමින් මෙම පුහුණු වැඩසටහන් ආරම්භ කිරීම සඳහා ජාතික වැඩපිළිවෙළක් ක්‍රියාවට නැංවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.15/’15

8.

ගරු බුද්ධික පතිරණ මහතා,— කලත්‍රයාගේ නොමනා ක්‍රියා නිසා අසරණභාවයට පත්වන පාර්ශවයට සහන සලසා දීම,— විවාහක අඹුසැමි යුවලක් එකම වහලක් යට ජීවත්ව සිටින අවස්ථාවලදී පුරුෂයා හෝ බිරිඳ සුරාව, සූදුව සහ වෙනත් අපචාරී කටයුතුවල යෙදෙමින් ඉඩම් හෝ ගේ දොර බඩු මුට්ටු තම පෞද්ගලික අභිමතය පරිදි විකුණමින් හෝ අන් අයට පවරමින් හැසිරීම නිසාවෙන් අනෙක් පාර්ශවයත් සමඟ දරුවන් දැඩි අසරණභාවයට පත් වන අවස්ථාවලදී එම තත්වය වළක්වා ගැනීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.16/’15

9.

ගරු බුද්ධික පතිරණ මහතා,—චර්යා ධර්ම පිළිබඳ කාරක සභා ඇතිකිරීම,— ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විශ්වාසවන්තභාවය හා ඔවුන් තුළ උසස් ආචාර ධර්ම පවත්වාගෙන යාමේ අවශ්‍යතාව නිසා ඒ පිළිබඳ කරුණු සොයා බැලීම සඳහා චර්යා ධර්ම පිළිබඳ කාරක සභාවක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.17/’15

10.

ගරු බුද්ධික පතිරණ මහතා,—නව ඉලෙක්ට්‍රොනික් හැඳුනුම්පතක් නිකුත් කිරීම,— පරිපාලනය පහසු කිරීම, අපරාධ මැඩලීම සඳහා හා වෙනත් වංචනික ක්‍රියාවලට යොමුවීම අවමකිරීම සඳහා අදාළ පුද්ගලයාගේ රුධිර ගණය, බැංකු ගිණුම්, ක්‍රෙඩිට් කාඩ්, අධ්‍යාපන සුදුසුකම්, රියදුරු බලපත්‍ර හා විදේශ ගමන් බලපත්‍ර අංක ආදී වැදගත් හා අවශ්‍ය තොරතුරු ඇතුළත් නව ඉලෙක්ට්‍රොනික අංකයක් සහිත ජාතික හැඳුනුම්පතක් නිකුත් කළ යුතු බවත් ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයන්හි ජීවත්වන සියලු දෙනාගේ තොරතුරු ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් පරිගණකගත කිරීම කඩිනමින් කළ යුතු බවත් එම තොරතුරු වරින්වර යාවත්කාලීන කළයුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.18/’15

11.

ගරු බුද්ධික පතිරණ මහතා,— පොලිස් නිලධාරීන්ට ද අවුරුදු විස්සක සේවා කාලයකින් පසු විශ්‍රාම යාමට අවස්ථාව ලබාදීම,— පොලිස් දෙපාර්තුමේන්තුවේ කාන්තා පොලිස් නිලධාරිනියන් සඳහා වන විසි වසරක සේවා කාලයකින් පසු ස්ව කැමැත්තෙන් විශ්‍රාමයාමේ හැකියාව, පොලිස් නිලධාරීන් සඳහා ද අදාළ වියයුතු යැයි ද ඒ සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.19/’15

12.

ගරු බුද්ධික පතිරණ මහතා,— රෙගුලාසි ඉවත් කිරීමේ කාරක සභා ඇති කිරීම,— රෙගුලාසි තැනීම මෙන්ම රෙගුලාසි ඉවත් කිරීමද නිතර සිදුවන ක්‍රියාවලියක් බැවින් කල්පැන ගිය රෙගුලාසි ඉවත් කිරීම පිළිබඳ සොයා බැලීම සඳහා රෙගුලාසි ඉවත් කිරීමේ කාරක සභා ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.21/'15

13.

ගරු බුද්ධික පතිරණ මහතා,— සහතික වීම පිළිබඳ කාරක සභා ඇති කිරීම,— පාර්ලිමේන්තුවේ අසන ප්‍රශ්නවලට පිළිතුරු වශයෙන් රජය දෙන සහතික හා රජයේ බැඳීම් ඇතැම් විට කඩ වන අවස්ථා දක්නට ලැබෙන බැවින්, රජය සිය වගකීම් ඉටු කරන බවට සහ ඒවා පිළිබඳව වගකියන බවට සහතික වීම සඳහා සහතික වීම පිළිබඳ කාරක සභා ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.22/'15

14.

ගරු බුද්ධික පතිරණ මහතා,— දුම්රිය දෙපාර්තුමේන්තුව සතු ඉඩම්වල ඵලදායීතාව වැඩිකර ගැනීම,— ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තුමේන්තුව සතු ඉඩම්වල ඇති අනවසර ඉදිකිරීම් හා අනවසර පදිංචිකරුවන් කඩිනමින් ඉවත්කර නීත්‍යානුකූල ඉදිකිරීම් සම්බන්ධ ගිවිසුම් නැවත සමාලෝචනය කිරීමෙන් දෙපාර්තමේන්තුවට ලැබෙන ආදායම් වර්ධනය කළ යුතු අතර, දෙපාර්තමේන්තුවේ සංවර්ධන කටයුතු සඳහා සෘජුවම බල නොපාන්නා වූ ඉඩම් දිගුකාලීන බදු පදනමක් මත පෞද්ගලික අංශයට ලබාදී එම මුදල් දුම්රිය පද්ධතිය නවීකරණය සඳහා යොදා ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.23/'15

15.

ගරු බුද්ධික පතිරණ මහතා,— යාචකයින්ගේ ජීවිත ආරක්ෂා කිරීම සඳහා ක්‍රමවේදයක් සැකසීම,— මේ වන විට යාචකයින්ගේ ජීවිතවලට විශාල ලෙස තර්ජන එල්ල වී තිබෙන බැවින් ඔවුන්ගේ ජීවිතවල සුරක්ෂිතතාව රැකදීම උදෙසා, ඔවුන්ට වගා කිරීම සඳහා ඉඩම් ලබා දී ඉන් ලැබෙන ආදායමෙන් ඔවුන්ගේ ජීවිතවල ආරක්ෂාව හා පෝෂණය සහතික කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.24/'15

16.

ගරු බුද්ධික පතිරණ මහතා,— අයාලේ යන සුනඛයින්ගෙන් මිනිස් ජීවිතවලට සිදුවන හානිය වළක්වා ගැනීම සඳහා ක්‍රමවේදයක් සැකසීම,— අයාලේ යන සුනඛයින්ගෙන් මිනිස් ජීවිතවලට සිදුවන හානිය වළක්වා ගැනීමේ අරමුණින්, රජය මගින් භූමි ප්‍රමාණයක් වෙන්කොට එම ස්ථානයට නිදැල්ලේ යන සුනඛයින් ගෙන ගොස් ඔවුන් රැක බලාගැනීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.25/'15

17.

ගරු බුද්ධික පතිරණ මහතා,— ළමා අපචාර සිද්ධීන් සඳහා දැඩි දඬුවම් පැනවීම,— දිවයින පුරා ළමා අපචාර හා අපයෝජනයන් දිනෙන් දින සීඝ්‍රයෙන් වර්ධනය වීමේ තත්ත්වයක් ඇති වී තිබෙන බැවින් ඒ සම්බන්ධව දැනට පවත්නා නීති රෙගුලාසි ප්‍රමාණවත් නොවන්නේ නම්, නව නීති රෙගුලාසි අලුතින් සම්මත කොට ඉතා කඩිනමින් මේ සම්බන්ධ නඩු විසඳීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.26/'15

18.

ගරු බුද්ධික පතිරණ මහතා,— සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා වෙරළ පිවිසුම් මාර්ග ඇති කිරීම,— දිවයිනේ වෙරළබඩ කලාපය තුළ සීඝ්‍රයෙන් සිදුවන ඉදිකිරීම් නිසාවෙන් දේශීය, විදේශීය සංචාරකයන්ට මෙන්ම ධීවරයන්ට ද වෙරළ තීරයට පිවිසීමේදී අවහිරතා ඇතිව තිබීම සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනයට මෙන්ම ධීවර කර්මාන්තයට ද බාධා ගෙන දෙන බැවින් එම තත්ත්වය වළක්වාලීම සඳහා මෙන්ම මෙම ක්ෂේත්‍ර ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව වෙරළ පිවිසුම් මාර්ග පද්ධතියක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.27/'15

19.
ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීම,— විදුහල්පති සේවය, ගුරු අධ්‍යාපන සේවය, අධ්‍යාපන පරිපාලන සේවය යන සේවාවල දැඩි වැටුප් විෂමතාවක් පවතින බැවින්, එම තත්ත්වය මග හරවා ඔවුන්ගේ ආත්මාභිමානයට සරිලන වැටුපක් ලැබෙන පරිදි වැටුප් විෂමතා ඉවත් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.28/'15

20.
ගරු බුද්ධික පතිරණ මහතා,— බෞද්ධ භික්ෂු අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම,— බෞද්ධ භික්ෂූන්වහන්සේලාගේ ධර්ම ඥානය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව උන්වහන්සේලාගේ කථන හැකියා, ශ්‍රවණ හැකියා, පරිගණක, මනෝවිද්‍යාත්මක සහ උපදේශනය පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම උදෙසා දැනට පවත්නා භික්ෂු අධ්‍යාපන ආයතනවලට පරිබාහිරව මෙම කටයුතු සඳහාම වෙන් වූ භික්ෂු අධ්‍යාපන ආයතන ඇති කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.29/'15

21.
ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව තුළ දැනට ක්‍රියාත්මක වන නොතාරිස් සේවාව යාවත්කාලීන කිරීම,— දිවයින තුළ ක්‍රියාත්මක වන නොතාරිස් සේවය යල්පැන ගිය නීතිවලින් සකස් වී ඇති නිසා ඒ පිළිබඳව යළි සලකා බලා වර්තමානයට ගැලපෙන ලෙස නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.30/'15

22.
ගරු බුද්ධික පතිරණ මහතා,— වියළි කලාපීය හේන් ගොවීන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම,— වියළි කලාපීය ප්‍රදේශවල හේන් ගොවීන් විසින් වගා කරනු ලබන වී, කුරක්කන්, මුං, තල වැනි වගාවන්හි අස්වැන්න වැඩි කර ගැනීම සහ නිෂ්පාදන සකස් කිරීම සඳහා නව තාක්ෂණය හඳුන්වාදීම තුළින් උසස් ගුණාත්මක තත්ත්වයෙන් යුතු නිෂ්පාදන සකස් කිරීම සඳහාත්, දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ තුළ නිෂ්පාදන අලෙවි කර ගැනීමේ පදනම ශක්තිමත් කර ගැනීම සඳහාත් සීමිත සමූපකාර සමාගම් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.31/'15

23.
ගරු බුද්ධික පතිරණ මහතා,— ගුරු උපදේශක සේවාවක් ඇති කිරීම,— ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීමේ අරමුණ ඇතිව මීට වසර විස්සකට (20) පමණ පෙර සිට ආරම්භ වී ක්‍රියාත්මක වන ගුරු උපදේශක තනතුරු වෙනම ගුරු උපදේශක සේවා ඒකකයක් ලෙස ස්ථාපනය කල යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.32/'15

24.
ගරු බුද්ධික පතිරණ මහතා,— තිරිඟු පිටි වෙනුවට සහල් පිටි ජනතාව අතර ජනප්‍රිය කරවීම සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම,— තිරිඟු පිටි සඳහා විදේශ රටවලට ඇදී යන විශාල ධනස්කන්ධය නවතාලීමේ අරමුණ ඇතිව ආදේශකයක් ලෙස භාවිතා කළ හැකි සහල් පිටිවලින් සැකසූ ආහාර ප්‍රචලිත කිරීම සඳහාත්, කෙඳි සහිත ධාන්‍ය වර්ගයක් වන සහල් වඩාත් සියුම් ලෙස තිරිඟු පිටි මෙන් අඹරා ගැනීම සඳහාත්, තිරිඟු පිටි ඇඹරීමට භාවිතා කරන ආකාරයේ යන්ත්‍ර සූත්‍ර සහ නව තාක්ෂණය හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.33/'15

25.

ගරු බුද්ධික පතිරණ මහතා,— යුද්ධය නිසා ආබාධිතයන් බවට පත්වූවන්ට සහන සලසා දීම,— වසර 30කට ආසන්න කාලයක් පැවැති යුද්ධය හේතුකොට ගෙන එදිනෙදා කුලී වැඩ කොට ජීවත් වූ ජනතාවත් ස්ථිර රැකී රක්ෂා කළ ජනතාවත් අතරින් සැලකිය යුතු ප්‍රමාණයක් අංගවිකලව ආබාධිතව ජීවන බරින් මහත් පීඩාවට පත් වී අසරණව ජීවත් වන බැවින්, ඔවුන් සඳහා යම් මාසික දීමනාවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.34/'15

26.

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලුම ප්‍රභූ ආරක්ෂකයින් සඳහා ගමන් වියදම් දීමනාවක් ලබා දීම,— ජනාධිපති ආරක්ෂක සහ අගමැති ආරක්ෂක සේවයේ නියුක්ත නිලධාරීන්ට මෙන්ම අනෙකුත් ප්‍රභූ ආරක්ෂක සේවාවල නියුක්ත නිලධාරීන්ට ද සමාන ගමන් වියදම් දීමනාවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.35/'15

27.

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්වවිද්‍යාල මගින් පවත්වාගෙන යන පාඨමාලාවන් රැකියාභිමුඛ පාඨමාලාවන් බවට පත්කිරීම,— දිවයිනේ සියලුම රජයේ විශ්වවිද්‍යාල සහ පෞද්ගලික විශ්වවිද්‍යාල මගින් පවත්වාගෙන යන ශාස්ත්‍රීය අධ්‍යාපනයම සඳහා වූ උපාධි පාඨමාලාවන් රැකියාභිමුඛ වෘත්තීයමය උපාධි පාඨමාලාවන් බවට පරිවර්තනය කර එමගින් බිහිවන්නා වූ උපාධිධාරීන් වෙත නව රැකියා සපයා දීමේ අරමුණ ඇතිව, සියලුම විශ්වවිද්‍යාල සමඟ රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ ආයතන සම්බන්ධීකරණය සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.36/'15

28.

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් සිසුන් ප්‍රවාහනය කරනු ලබන වෑන් රථ සඳහා නිසි ප්‍රමිතීන් නියම කිරීම,— දිවයින පුරා පවත්වාගෙන යනු ලබන පාසල් සිසු ප්‍රවාහන සේවාවන් නියමිත ප්‍රමිතියෙන් නොපවතින බැවින් සහ ඇතැම් පාසල් වෑන් රථ සේවකයින්ගේ පැවතුම් යහපත් තත්ත්වයෙන් නොපවතින බැවින්, නිසි ප්‍රමිතියෙන් යුතු වෑන් රථ සේවාවක් පවත්වාගෙන යෑම සඳහාත්, එම සේවාවන් ලබාගන්නා පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහාත්, වෑන් රථ සේවාවන් සඳහා ප්‍රමිතීන් හඳුන්වාදිය යුතුයැයි ද, වෑන් රථ සේවකයින් තුළ යහපත් පැවතුම් පවත්වාගෙන යාම සඳහා විනය නීති මාලාවක් හඳුන්වා දිය යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.37/'15

29.

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික සහ ජාත්‍යන්තර අනාගත ඉල්ලුමට සරිලන ලෙස නිෂ්පාදනය වර්ධනය කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම,— ජාතික සහ ජාත්‍යන්තර ප්‍රජාවගේ අනාගත ඉල්ලුමට සරිලන කාර්මික සහ කෘෂිකාර්මික නිෂ්පාදනයන් පිළිබඳව පුරෝකථනයක් කර අදාළ නිෂ්පාදනයන්ට අනුබද්ධිත සියලුම ක්ෂේත්‍රවල අන්තර් සම්බන්ධතාවයක් තුළින් ද, නවීන තාක්ෂණය උපරිම මට්ටමින් ප්‍රයෝජනයට ගනිමින් ද, නිෂ්පාදන ක්‍රියාවලිය වර්ධනය කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.38/'15

30.

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකික ජනතාවගේ පාරම්පරික උරුමයන් රැකගැනීම සඳහා ඩිජිටල් පුස්තකාලයක් ඇති කිරීම,— ශ්‍රී ලාංකික ජනතාවගේ සම්ප්‍රදායික දැනුම ආරක්ෂා කරමින්, පෝෂණය කර අනාගත පරම්පරාව වෙත රැගෙන යාම සඳහා ද, ජාන සම්පත් හා ජෛව උරුමයන් අපහරණය වැළැක්වීම සඳහා පුළුල් ජාතික වැඩපිළිවෙළක් අවශ්‍යව ඇති බැවින් ද, පරිසරය, දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය,

කෘෂිකර්මාන්තය හා සම්ප්‍රදායික කර්මාන්ත ඇතුළු සියලු ක්ෂේත්‍රයන් සඳහා ඩිජිටල් තාක්ෂණය උපයෝගී කරගත් නවීන පුස්තකාලයක් සකස් කිරීමට ද, ඒ සඳහා ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO), ශ්‍රී ලංකා බුද්ධිමය දේපළ කාර්යාංශය, පරිසර අමාත්‍යාංශයේ ජෛව විවිධත්ව ඒකකය ඇතුළු සියලු අංශ ඒකාබද්ධවූ වැඩපිළිවෙළක් සකස් කිරීමට ද පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.39/'15

31.

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකික ජනතාවගේ පාරම්පරික දැනුම ආරක්ෂා කර ගැනීම සඳහා වූ ජාතික වැඩපිළිවෙළක් ආරම්භ කිරීම,— ශ්‍රී ලාංකික ජනතාවගේ පාරම්පරික දැනුම් භාවිතා වන වෛද්‍ය ක්‍රම, කෘෂිකර්මාන්තය, ආහාර සංරක්ෂණය, හස්ත කර්මාන්ත අංශය ඇතුළු විවිධ ක්ෂේත්‍රයන්හි පාරම්පරික දැනුම ආරක්ෂා කිරීම සඳහා අදාළ ක්ෂේත්‍රයන් නියෝජනය කෙරෙන ජනතාවගෙන් තොරතුරු ලබාගෙන, ජෛව විවිධත්ව ඒකකය, බුද්ධිමය දේපළ කාර්යාංශය ඇතුළු අදාළ අංශ ඒකාබද්ධව ජාතික වැඩපිළිවෙළක් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.40/'15

32.

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවට ආවේණික හා ඖෂධමය වටිනාකම්වලින් යුතු ශාඛවල ජාන සම්පත්වලට පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම,— විදේශීය රටවල් ශ්‍රී ලංකාවට ආවේණික වටිනා ඖෂධමය ශාඛවල සක්‍රිය රසායනික ද්‍රව්‍ය සහ ජාන සම්පත් හඳුනා ගෙන, ඒවාට වංචනික ලෙස පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම වැළැක්වීම සඳහා අදාළ සක්‍රිය රසායනික ද්‍රව්‍ය සහ ජාන සම්පත් සඳහා ශ්‍රී ලංකාවට පේටන්ට් බලපත්‍ර ලබා ගැනීමටත්, ඖෂධ නිෂ්පාදනයට සහ වැඩි දියුණු කිරීමට එම කොටස් යොදා ගැනීමටත්, ජෛව විවිධත්ව අංශය, බුද්ධිමය දේපළ කාර්යාංශය සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ඇතුළු වගකිවයුතු සියලු ආයතන එක්ව විශේෂ වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.41/'15

33.

ගරු බුද්ධික පතිරණ මහතා,— ජනතා නියෝජිතයින්ගේ ගරු නාම අත්හැරීම,— ජනාධිපතිතුමා, අගමැතිතුමා ඇතුළු පාර්ලිමේන්තු, පළාත් සභා, ප්‍රාදේශීය සභා නියෝජනය කරන සියලුම ජනතා නියෝජිතයන් මාසිකව තමන් කරන සේවයට අදාළව වැටුප් හා / හෝ දීමනා ලබා ගන්නා අතර ඉහත කිසිදු ධූරයක් නිස්සරණධ්‍යාසයෙන් සිදු කරනු ලබන ගරු සේවයන් නොවන බැවින් ද, එම ධූර දරන්නන්ගේ නමට ඉදිරියෙන් හෝ ධූරයට ඉදිරියෙන් අතිගරු, ශ්‍රීමත් හෝ ගරු යන නාම සහ නමට පසුව උතුමාණන්, මැතිතුමා යන පද යෙදීම උපහාසයට ලක්වීමට හේතුවක් වී ඇති බැවින් ද, ජනතා නියෝජිතයන්ගේ ගරු නාම භාවිතය නතර කිරීමට අවශ්‍ය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.42/'15

34.

ගරු බුද්ධික පතිරණ මහතා,— වැඩිහිටි නඩත්තු මණ්ඩල වැඩසටහන පළාත්, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ව්‍යාප්ත කිරීම,— විවිධ පාර්ශ්වයන් විසින් වැඩිහිටි පුරවැසියන් නොසලකා හැරීම තුළින් සිදුවන විවිධ අසාධාරණයන් සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සඳහා සමාජ සේවා අමාත්‍යාංශයේ වැඩිහිටි ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන වැඩිහිටි නඩත්තු මණ්ඩල වැඩසටහන පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ව්‍යාප්ත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.43/'15

35.

ගරු බුද්ධික පතිරණ මහතා,— වැඩිහිටි ප්‍රජාව ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට දායක කර ගැනීමට ණය දීමේ වැඩපිළිවෙළක් සකස් කිරීම,— වයස අවුරුදු 60 ඉක්මවා ඇති වැඩිහිටි ප්‍රජාවට තම ජීවනෝපාය මාර්ග ශක්තිමත් කරගනිමින් සමස්ත ශ්‍රී ලංකා ආර්ථිකයේ වර්ධනයට දායකවීමට බැංකු පද්ධතිය මගින් ණය දීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවීම ඔවුන්ට සමාජය තුළ වෙනත් අකාරයකට සැලකීමක් වන හෙයින් එම අසාධාරණ තත්ත්වය වැළැක්වීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.44/'15

36.

ගරු බුද්ධික පතිරණ මහතා,— වයස අවුරුදු 60 ඉක්මවා ඇති පුද්ගලයින් සමාජය තුළ සක්‍රීය පුද්ගලයින් බවට පත් කිරීමේ වැඩපිළිවෙළක් සකස් කිරීම,— සමාජ ආර්ථික ක්‍රියාවලියේ ප්‍රගමනය උදෙසා තම ශ්‍රමය කැප කර වයස අවුරුදු 60 ඉක්මවීමෙන් පසු සමාජය තුළ නිසි පිළිගැනීමක් නොමැතිව අක්‍රියව කොන්වී සිටින වැඩිහිටියන්, සමාජයේ සක්‍රීය පුද්ගලයින් බවට පත් කිරීමේ වැඩපිළිවෙළක් සකස් කිරීමට පාසල් ප්‍රජාව ඇතුළු මුළු මහත් සමාජයම දැනුවත් කිරීමේ ක්‍රමවේදයක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.45/'15

37.

ගරු බුද්ධික පතිරණ මහතා,— මෝටර් කාර්මික ක්ෂේත්‍රය පිළිබඳ පාසල් සිසුන්ගේ දැනුම පුළුල් කිරීම,— ශ්‍රී ලංකාවේ අනාගත තරුණ තරුණියන්ගේ රැකියා ප්‍රශ්නයට විසඳුමක් ලෙස සහ මෝටර් කාර්මික ක්ෂේත්‍රයේ ඇතිවන්නාවූ වර්ධනයට සාපේක්ෂව පුහුණු ශ්‍රමිකයින්ගේ අවශ්‍යතාව සපුරා ගැනීමේ අරමුණ ඇතිව පාසල් විෂය නිර්දේශයට මෝටර් කාර්මික ශිල්පය විෂයයක් ලෙස ඇතුළත් කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.46/'15

38.

ගරු බුද්ධික පතිරණ මහතා,— මෝටර් කාර්මික ශිල්පය ඉගැන්වීම සඳහා ගුරුවරුන් පුහුණු කිරීමට අධ්‍යාපන විද්‍යා පීඨයක් ඇති කිරීම,— ශ්‍රී ලංකාවේ සහ විදේශ රටවල මෝටර් කාර්මික ක්ෂේත්‍රයේ ඇතිවන වර්ධනයට සරිලන ලෙස, එම ක්ෂේත්‍රයේ පුහුණු ශ්‍රමිකයින්ගේ ඉල්ලුම සපුරාලීමට හැකිවන පරිදි, පාසල් මට්ටමින් ඉගැන්වීම සඳහා ගුරුවරුන් පුහුණු කිරීමට මෝටර් කාර්මික ක්ෂේත්‍රය පිළිබඳ අධ්‍යාපන විද්‍යා පීඨයක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.47/'15

39.

ගරු බුද්ධික පතිරණ මහතා,— මෝටර් කාර්මික ශිල්පය විෂය නිර්දේශයන් යාවත්කාලීන කිරීම,— මෝටර් කාර්මික ක්ෂේත්‍රය හා සම්බන්ධ රජයේ කාර්මික විද්‍යාල හා අනුබද්ධ ආයතනවල ඉගෙනුම් කටයුතු සිදු කරනු ලබන්නේ වසර 25 - 30ක් තරම් පැරණි විෂය නිර්දේශයක් යටතේ බැවින්, එම තත්ත්වය වෙනස් කිරීම සඳහා එම විෂය නිර්දේශයන් යාවත්කාලීන කිරීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.48/'15

40.

ගරු බුද්ධික පතිරණ මහතා,— ත්‍රිරෝද රථ හා යතුරු පැදි ආශ්‍රිත රැකියාවල නියුක්ත වූවන්ගේ රැකියාවල සුරක්ෂිතභාවය තහවුරු කිරීම,— ශ්‍රී ලංකාව තුළ ජීවත්වන ත්‍රිරෝද රථ හා යතුරුපැදි ආශ්‍රිතව ඍජු හා වක්‍ර ලෙස රැකියාවන්හි නියුක්තවීමට කැමැත්තක් දක්වන තරුණ පිරිස හා විශ්‍රාමික ත්‍රිවිධ හමුදා නිලධාරින් සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් යන ජන කණ්ඩායම්වල ආර්ථික ශක්තිය වර්ධනය කිරීමෙන් සමස්ත ජාතික නිෂ්පාදිතයට ඔවුන්ගේ දායකත්වය ලබා ගැනීමේ අරමුණ ඇතිව එම ක්ෂේත්‍රයේ නියුක්තවූවන්ගේ සක්‍රීය දායකත්වය ජාතික ආර්ථිකයට එක් කර ගැනීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් කඩිනමින් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.49/'15

41.

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකීය/දේශීය සූපවේදය පිළිබඳ රට තුළ ජනතා ආකල්ප පුළුල් කිරීම,— ශ්‍රී ලාංකීය/දේශීය ආහාර කලාව පිළිබඳ දේශීය හා විදේශීය ජනතාව තුළ වැඩි නැඹුරුවක් ඇති කිරීමේ අරමුණ ඇතිව, රට තුළ ජනතා ආකල්ප ඒ වෙත යොමු කිරීම සඳහා පාසල්, විශ්වවිද්‍යාල, තෘතීයික අධ්‍යාපන ආයතනවල විෂය පාඨමාලාවට සූපවේදය විෂයයක් ලෙස ඇතුළත් කිරීමටත්, රාජ්‍ය හා පෞද්ගලික අංශවල

මැදිහත්වීම මත පර්යේෂණ අංශ දිරිගැන්වීම මගින් නව සොයාගැනීම් සිදු කිරීමටත්, ඒ හා බැඳුනු ආයතන පද්ධතිය සම්බන්ධ කර ගනිමින් සහතික පත්‍ර, ඩිප්ලෝමා, උපාධි, පශ්චාත් උපාධි පාඨමාලා ඇති කිරීම තුළින් මෙම ක්ෂේත්‍රය පිළිබඳ ජනතාව තුළ පුළුල් ආකල්පමය වෙනසක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.50/'15

42.

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවේ ආහාර සංස්කෘතිය ඉගෙනුම් සහ ඉගැන්වීමේ ක්‍රියාවලියට බද්ධ කිරීම,— ශ්‍රී ලාංකීය ආහාර කලාව, රස කාරක හා සංයෝග කිරීමේ කලාව, ආහාර පිසීමේ කලාව, වර්ණකාරක කලාව, ආහාර කැපීමේ කලාව ඇතුළු අංශ ගණනාවකින් සකස්වී ඇති අතර ඒ හා බැඳුණු ශ්‍රී ලාංකීය ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම් සහ ඉගැන්වීම් ක්‍රමවේදයන් හරහා අනාගත පරපුරට පවරාදීම මෙන්ම දේශීය හා විදේශීය ජනතාව අතර අපගේ ආහාර සංස්කෘතිය ව්‍යාප්ත කිරීම මගින් ශ්‍රී ලාංකීය අනන්‍යතාව අන්තර්ජාතිකව ඔසවා තැබීම සඳහා වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.51/'15

43.

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්වවිද්‍යාල සහ තෘතීයික අධ්‍යාපන ආයතනවල සිසුන්ගේ පර්යේෂණ නිබන්ධන අමාත්‍යාංශවල සංවර්ධන කටයුතු ඉලක්ක කර සකස් කිරීම,— විශ්වවිද්‍යාල සහ තෘතීයික අධ්‍යාපන ආයතනවල සිසුන් විසින් තම පාඨමාලා සම්බන්ධයෙන් ඉදිරිපත් කරන පර්යේෂණ නිබන්ධන රටේ ආර්ථික, සමාජීය, සංස්කෘතික හා සංවර්ධන කටයුතුවලට උපයෝගී කර ගැනීම වැදගත් වන බැවින් එම නිබන්ධන අධීක්ෂණය කරනු ලබන ආචාර්යවරු හා පර්යේෂණ නිබන්ධන අදාළ වන අමාත්‍යාංශ අතර මනා සම්බන්ධීකරණයක් ඇති කිරීම සඳහා එකී අමාත්‍යාංශයේ නිලධාරියෙකු පත්කිරීමෙන් එම පර්යේෂණ නිබන්ධන මගින් අමාත්‍යාංශයේ ඉදිරි සංවර්ධන ක්‍රියාදාමයන් සහ කාලීන ඉලක්ක සපුරා ගැනීමට හැකිවන පරිදි ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.52/'15

44.

ගරු බුද්ධික පතිරණ මහතා,— වයස අවුරුදු 18 සම්පූර්ණ වන අවස්ථාවේදීම ඡන්ද හිමි නාමලේඛනයට නම ඇතුළත් කිරීම,— මැතිවරණ දෙපාර්තමේන්තුව මගින් වාර්ෂිකව ඡන්ද හිමි නාමලේඛන සංශෝධනය කිරීමට නියමිත දිනට පසුව හෝ පෙර දිනකදී වයස අවුරුදු 18 සම්පූර්ණ වන තැනැත්තන්ට නියමිත වයස සම්පූර්ණ වූ දිනටම ඡන්ද හිමි නාමලේඛනයෙහි නම ඇතුළත් කරවා ගත හැකි ආකාරයේ ප්‍රායෝගික වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.53/'15

45.

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව තුළ සේලයින් නිෂ්පාදනය කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කිරීම,— ශ්‍රී ලංකාව තුළ වාර්ෂිකව සේලයින් විශාල ප්‍රමාණයක් භාවිතා කරනු ලබන අතර සේලයින් ආනයනය කිරීම සඳහා ද විශාල මුදලක් වාර්ෂිකව විදේශීය රටවලට ඇදී යන බැවින්, එම විදේශ විනිමය ප්‍රමාණය රට තුළ ඉතිරි කර ගැනීමේ අරමුණ ඇතිව ලංකාව තුළ පවත්නා දේශීය තාක්ෂණය යොදාගෙන සේලයින් නිෂ්පාදනය කිරීම සඳහා රාජ්‍ය, පෞද්ගලික හෝ සමුපකාර අංශයන් සම්බන්ධ කර ගනිමින් ක්‍රමවත් වැඩපිළිවෙළක් රජය මැදිහත් වීමෙන් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.54/'15

46.

ගරු බුද්ධික පතිරණ මහතා,— පොල් වතුර ආශ්‍රිතව නව නිෂ්පාදනයන් ඇති කිරීම,— ශ්‍රී ලංකාව තුළ වාර්ෂිකව විශාල ප්‍රමාණයක පොල් වතුර අපතේ යන බැවින්, නව තාක්ෂණය යොදා ගනිමින් විධිමත් ක්‍රමවේදයක් යටතේ පොල් වතුර ආශ්‍රිතව නව නිෂ්පාදනයන් දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ ඉලක්ක කර ගනිමින් ඇති කිරීම සඳහා ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.55/'15

47.

ගරු බුද්ධික පතිරණ මහතා,— සාගරයේ නව සම්පත් ගවේෂණය,— විශාල සාගර කලාපයක් හිමි රටක් වූ ශ්‍රී ලංකාව ප්‍රමුඛත්වය ලබා දී ඇත්තේ ධීවර කර්මාන්තය සඳහා පමණක් වන අතර සාගරය ආශ්‍රිතව විශාල ප්‍රමාණයක සවභාවික සම්පත් ඇති බැවින් මෙරටට විශාල රැකියා අවස්ථා ප්‍රමාණයක් මෙන්ම ධනයක් ද උපයා ගැනීමේ අරමුණ ඇතිව සාගර සම්පත් පිළිබඳව විධිමත් වැඩිදුර අධ්‍යයනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.56/'15

48.

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවේ මත්ස්‍ය සම්පත විදේශිකයින් විසින් නෙලා ගැනීම වළකාලීම,— ශ්‍රී ලාංකික ධීවරයන්ට විශාල ආර්ථික අවාසියක් ඇති කරමින් ශ්‍රී ලංකා මුහුදු කලාපයේ මත්ස්‍ය සම්පත් විදේශිකයින් විසින් නෙලා ගන්නා බැවින් ශ්‍රී ලංකා මුහුදු කලාපය තුළ මාළු ඇල්ලීමට සහ විදේශ යාත්‍රාවලට මාළු බෑම සඳහා තොටුපලක් ලෙස භාවිතා කිරීම වළකාලීම සඳහා රජය විසින් විධිමත් වැඩ පිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.57/'15

49.

ගරු බුද්ධික පතිරණ මහතා,— කොස් නිෂ්පාදනය වැඩි කර ඒ ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කිරීම,— ඉතා ප්‍රනීත මෙන්ම ඖෂධීය ගුණයෙන් අනූන, රසායනික ද්‍රව්‍යවලින් තොරව වගා කළ හැකි බෝගයක් වන කොස් වගාව ව්‍යාප්ත කිරීම තුළින් ඒ ආශ්‍රිත නිෂ්පාදන ඉහළ නංවා ඒවා අපනයනය කිරීම මගින් විශාල විදේශ විනිමය ප්‍රමාණයක් අප රටට උපයා ගත හැකි බැවින් ඒ සඳහා රජයේ මැදිහත්විමෙන් විධිමත් වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.58/'15

50.

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික ගොවි සම්මාන උළෙලක් වාර්ෂිකව සංවිධානය කිරීම,— රටක් පෙරට යාමට නම් මූලික වශයෙන් ගොවිතැනින් සශ්‍රික විය යුතු බැවින් රට සරු කරන ගොවි ජනතාවට සිය වෘත්තිය පිළිබඳ අභිමානයක් ඇතිවන පරිදි විධිමත් සංවිධාන ව්‍යුහයක් හරහා ක්‍රියාත්මක වන ගොවි සම්මාන උළෙලක් රජයේ මැදිහත්වීමෙන් වාර්ෂිකව සංවිධානය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.59/'15

51.

ගරු බුද්ධික පතිරණ මහතා,— සහන මිලකට LED බල්බ පාරිභෝගික ජනතාවට ලබාදීම,— නිවාස ආලෝක කිරීමට යොදා ගන්නා ගුණාත්මක LED බල්බ මිල අධික බැවින්, විදුලිබල මණ්ඩලය මැදිහත්වී සහනදායි මිලකට හා ගෙවීමේ ක්‍රමයට මෙම බල්බ පාරිභෝගික ජනතාවට ලබාදී ජාතික වශයෙන් විදුලිය විශාල ප්‍රමාණයක් ඉතිරි කර ගැනීමටත්, LED බල්බ ජනතාව අතර ජනප්‍රිය කිරීම මගින් විදුලිබල මණ්ඩලයටද අමතර ආදායමක් උපයා ගැනීමටත් හැකිවන පරිදි ක්‍රමවත් වැඩ පිළිවෙළක් සැකසිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.60/'15

52.

ගරු බුද්ධික පතිරණ මහතා,— සුළු පරිමාණ සෙල්ලම් බඩු කර්මාන්තශාලා ව්‍යාප්ත කිරීම,— ශ්‍රී ලංකාව තුළ සෙල්ලම් බඩු සඳහා විශාල වෙළඳපොළක් පැවතුණ ද, රට තුළ ඒවා නිෂ්පාදනය කෙරෙන්නේ සුළු වශයෙන් වන අතර ඒ සඳහා චීනය ප්‍රමුඛ අනෙකුත් රටවලට විදේශ විනිමය විශාල ප්‍රමාණයක් ඇදී යන බැවින්, සුළු පිරිවැයක් දැරිය යුතු මෙම කර්මාන්තය ග්‍රාමීය ප්‍රදේශවල ව්‍යාප්ත කිරීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.61/'15

53.
ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව තුළ ඖෂධ නිෂ්පාදන කර්මාන්ත ශාලා ආරම්භ කිරීම,— ශ්‍රී ලංකාව තුළ ඖෂධ නිෂ්පාදනය දැනට ඉතා අවම මට්ටමක පවතින අතර ඖෂධ ආනයනය සඳහා වසරකට විශාල විදේශ විනිමය ප්‍රමාණයක් වැයවන බැවින් දියුණු මානව සම්පතක් හිමි රටක් ලෙස ශ්‍රී ලංකාවට අත්‍යාවශ්‍ය ඖෂධ වර්ග රට තුළම නිපදවීමට අවශ්‍ය පහසුකම් රජය මැදිහත් වීමෙන් ලබා දී ඖෂධ නිෂ්පාදන කර්මාන්ත ශාලා ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.62/'15

54.
ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් විෂය නිර්දේශයට මනෝ විද්‍යාව විෂයය ඇතුළත් කිරීම,— පාසල් ශිෂ්‍ය ප්‍රජාව නිරෝගී මනසකින් යුත් බුද්ධිමත් තීරණ ගැනීමට හැකි පිරිසක් ලෙස හැඩගැස්වීම උදෙසා හය වැනි ශ්‍රේණියේ සිට ක්‍රියාත්මක වන පරිදි බෞද්ධ මනෝ විද්‍යාව සහ බටහිර මනෝ විද්‍යාව යන විෂයයන් ඒකාබද්ධ කොට ක්‍රමවත්ව සැලසුම් කරන ලද "මනෝ විද්‍යාව සහ භාවනාව" නමින් විෂයයක් පාසල් විෂය නිර්දේශයට ඇතුළත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.63/'15

55.
ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්‍රාමික ආධාරක මධ්‍යස්ථාන පිහිටුවීම,— විශ්‍රාමිකයන් වෙනුවෙන් උපදේශන සේවා, වෛද්‍ය පහසුකම් සහ දිවා සුරැකුම් සේවා යනාදී වැඩිහිටියන්ට අවශ්‍ය සුබසාධන කටයුතු රැසක් එකම ස්ථානයකින් ඉටු කර ගැනීමට හැකි වන පරිදි විශ්‍රාමික ආධාරක මධ්‍යස්ථාන ගොඩනැංවීමටත්, එම මධ්‍යස්ථාන කේන්ද්‍ර කර ගනිමින් යම් නිෂ්පාදන කටයුත්තක් සඳහා විශ්‍රාමිකයන් යොමු කිරීම හරහා ඔවුන්ගේ දිවියට සහනයක් ලබාදෙන අතර අමතර ආදායමක් ද උපයා ගැනීමට හැකි වන ලෙස රජය මැදිහත් වීමෙන් රටපුරා විශ්‍රාමික ආධාරක මධ්‍යස්ථාන පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.64/'15

56.
ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්‍රාමිකයන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා නව ලොතරැයියක් හඳුන්වා දීම,— විශ්‍රාමික රාජ්‍ය සෙවකයන්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීමට සහ ඔවුන්ගේ සුබසාධන කටයුතු සඳහා අවශ්‍ය මුදල් සොයා ගැනීම සඳහා නව ලොතරැයියක් වෙළඳපොළට හඳුන්වාදීමට රජය කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.65/'15

57.
ගරු බුද්ධික පතිරණ මහතා,— සංචාරක මගපෙන්වන්නන් පුහුණු කිරීම,— සංචාරකයින්ට ඵලදායී හා ආචාරශීලී සේවාවක් සැපයීමට හැකි පිරිසක් බවට පත් කිරීමට මෙන්ම, ඔවුන්ගේ වෘත්තීය මට්ටම ඉහළ නැංවීම සඳහාත් සංචාරක මගපෙන්වන්නන් පුහුණු කිරීමට විධිමත් වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.66/'15

58.
ගරු බුද්ධික පතිරණ මහතා,— ඉඩම් සම්බන්ධව පවතින නීති සංශෝධනය කිරීම,— ශ්‍රී ලංකාව තුළ මේ වන විට ඉඩම්වලට ව්‍යාජ ඔප්පු සකසා විකිණීමේ ජාවාරමක් ක්‍රියාත්මකවන අතර මීට අදාළව නීතිය ක්‍රියාත්මක වීම ද ඉතා අවම මට්ටමක පවතින බැවින්, ඉඩම් අයිතිය සම්බන්ධව සුරක්ෂිතභාවය වැඩි වන අයුරින් හා වැරදිකරුවන්ට දැඩි දඬුවම් පැමිණවිය හැකි අයුරින් පවතින නීති පද්ධතිය සංශෝධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.67/'15

59.

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව අවට සාගරයේ කොරල්පර ආරක්ෂා කර ගැනීම,— ශ්‍රී ලංකාව අවට සාගරයේ ඇති කොරල්පර මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් විනාශවීමේ තර්ජනයට මුහුණපා ඇති බැවින්, එම කොරල්පර ආරක්ෂාකර ගැනීම සඳහා මිනිස් ක්‍රියාකාරකම් පාලනය කිරීමට හැකිවන පරිදි පුද්ගල ආකල්පමය වෙනසක් මෙන්ම, නෛතික රාමුවේ වෙනසක් ඇති කිරීම සඳහා විද්වත් කමිටුවක් හරහා සුදුසු වැඩපිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.68/'15

60.

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් වෑන් රථ සඳහා කාන්තාවන් සේවයට යෙදවීම,— පාසල් වෑන් රථ සේවයෙහි ගුණාත්මක බව වැඩි කිරීමටත්, එම වෑන් රථවල ගමන් කරන දරුවන්ගේ ආරක්ෂාව උදෙසාත් සියලුම පාසල් සේවා වෑන් රථවල සේවය සඳහා කාන්තාවන් යොදා ගැනීම අනිවාර්ය කිරීමට නීති සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.69/'15

61.

ගරු බුද්ධික පතිරණ මහතා,— ඖෂධ මිල පහත හෙළීම,— ශ්‍රී ලංකාව තුළ ජාතික ඖෂධ ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත් කර ඖෂධීය නාමයෙන් බෙහෙත් අලෙවි කිරීම කඩිනමින් ආරම්භ කිරීම මගින් ඖෂධ මිල පහත හෙළීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.70/'15

62.

ගරු බුද්ධික පතිරණ මහතා,— අන්තර්ජාලය හරහා අලෙවි කරන ඖෂධ ඇතුළු ජාවාරම් මැඩපැවැත්වීම,— මේ වන විට අන්තර්ජාලය හරහා ප්‍රමිතියකින් තොර ඖෂධ, වෛද්‍ය උපකරණ හා රූපලාවන්‍ය නිෂ්පාදන විශාල ලෙස අලෙවි කෙරෙන අතර මෙම ජාවාරම් අප රටේ ජනතාවගේ සෞඛ්‍යයට සහ යහපැවැත්මට විශාල තර්ජනයක් වන බැවින් ඒවා මැඩපැවැත්වීම සඳහා නිසි වැඩපිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කිරීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.71/'15

63.

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂි රසායන ද්‍රව්‍ය භාවිතා නොකර වගා කිරීම,— අධික විෂ සහිත කෘෂි රසායන ද්‍රව්‍ය ශ්‍රී ලංකාව තුළ තහනම් කර පැරණි ක්‍රමයට පරිසර හිතකාමී වගා ක්‍රමයක් රටට හඳුන්වාදීමට අවශ්‍ය පර්යේෂණ සිදුකිරීමට කෘෂි විද්‍යාඥයන් හා පරිසරවේදීන්ගෙන් සමන්විත කමිටුවක් පත් කර ඔවුන්ගෙන් ලබා ගන්නා නිර්දේශ තුළින් ජනතාවට වස විසෙන් තොර සෞඛ්‍යාරක්ෂිත ආහාර වේලක් ලබා දීමට අවශ්‍ය පියවර ගැනීමට රජය මැදිහත්වීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.72/'15

64.

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් සිසුන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීමෙන් මුදවා ගැනීම,— මේ වන විට ශ්‍රී ලංකාව තුළ පාසල් සිසුන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමේ වැඩි ප්‍රවණතාවයක් නිර්මාණය වී ඇති බැවින් පාසල් සිසුන් මත්ද්‍රව්‍යවලින් මුදවාගැනීම සඳහා රජය මැදිහත්වී විධිමත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.73/'15

65.

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික ඵලදායීතා කමිටුවක් පත් කිරීම,— රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන ඵලදායීතා වැඩසටහන්හිදී තම ආයතන ඉතා ඉහළ ඵලදායීතා මට්ටමක් කරා මෙහෙයවූ ආයතන ප්‍රධානීන් හඳුනාගෙන ඔවුන්ගේ දැනුම හා අත්දැකීම් ප්‍රයෝජනයට ගත හැකි වන ආකාරයෙන්, එම ආයතනවල ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සහ ක්‍රමවේද අනෙකුත් ආයතනවලට ගැලපෙන පරිදි ආදේශ කිරීමට හැකිවන පරිදි එම ආයතන ප්‍රධානීන්ගෙන් සමන්විත ජාතික ඵලදායීතා කමිටුවක් පිහිටවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.74/'15

66.

ගරු බුද්ධික පතිරණ මහතා,— ප්‍රජා වෛද්‍යවේදය පිළිබඳ විශේෂඥ සේවාව දියුණු කිරීම,— සෞඛ්‍ය සේවාවේ අත්‍යාවශ්‍ය අංගයක් වන ප්‍රජා වෛද්‍යවේදය පිළිබඳ විශේෂඥ අංශය දියුණු කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීම හා එම ක්ෂේත්‍රයේ දැනට පවතින ගැටලු නිරීක්ෂණය කර කඩිනමින් නිරාකරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.75/'15

67.

ගරු බුද්ධික පතිරණ මහතා,— ඉංග්‍රීසීන් රාජද්‍රෝහීන් ලෙස නම් කළ ශ්‍රී ලාංකිකයින් ජාතික වීරයන් ලෙස නම් කිරීම,— වර්ෂ 1815 සිට 1948 නිදහස ලැබීම දක්වා වූ කාලය තුළ ඉංග්‍රීසීන්ට එරෙහිව රට ජාතිය වෙනුවෙන් දිවි නොතකා සටන් කළ ශ්‍රී ලාංකිකයින් රාජ ද්‍රෝහීන් ලෙස නම් කර ඇති අතර ඔවුන් සියලුදෙනාම විශේෂ ගැසට් පත්‍රයක් මගින් ජාතික වීරයන් ලෙස නම් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.76/'15

68.

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිභෝජනයට නුසුදුසු ආහාර වෙළඳ පොළට ඒම වැළැක්වීමට කටයුතු කිරීම,— පරිභෝජනයට නුසුදුසු ආහාර නිෂ්පාදනය කරන, අලෙවි කරන හා ඊට අනුබල දෙන පුද්ගලයන් හා ආයතන වැටලීමට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ විශේෂ වැටලීම් ඒකකයට පවතින ගැටලු නිරාකරණය කර අවශ්‍ය පහසුකම් නොඅඩුව ලබා දීමටත්, වැරදිකරුවන්ට උපරිම දඬුවම් ලබා දිය හැකි වන පරිදි පවතින නීති පද්ධතිය සංශෝධනය කිරීමටත් කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.77/'15

69.

ගරු බුද්ධික පතිරණ මහතා,— වස විස නැති ආහාර නිෂ්පාදනය දිරිමත් කිරීම,— ආහාර හා සම්බන්ධ නිෂ්පාදන කටයුතුවල දේශීයව නිරතව සිටින නිෂ්පාදකයින් ඉලක්ක කර ගනිමින් ගුණාත්මක බවින් ඉහළ, සෞඛ්‍යාරක්ෂිත ආහාර පාරිභෝගිකයන්ට ලබා දීම තුළින් රටට කළ හැකි සේවාව පිළිබඳව දැනුවත් කර, ආකල්පමය වෙනසක් ඇති කිරීමට හා එලෙස වස විසෙන් තොර ආහාර නිපදවන ව්‍යවසායකයින්ට ගෞරව නාමයක් සහිත සම්මාන ප්‍රදානය කොට ඔවුන් දිරිගැන්වීමට වැඩසටහනක් රජය මැදිහත්වී ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.78/'15

70.

ගරු බුද්ධික පතිරණ මහතා,— අයථා ලෙස අත්පත් කරගත් අභයභූමිවලට අයත් ඉඩම් නිදහස් කරගැනීම,— ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත් කර ඇති අභයභූමිවලට අයත් ඉඩම් විවිධ පුද්ගලයින් හා සංවිධාන විසින් නීති විරෝධී ලෙස අත්පත් කරගෙන ඇති බැවින්, එම ඉඩම් නැවත ලබා ගැනීමට රජය කඩිනමින් මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.79/'15

71.

ගරු බුද්ධික පතිරණ මහතා,— ආදිවාසී ජනයා නගාසිටුවීම සඳහා සැලසුමක් ක්‍රියාත්මක කිරීම,— ශ්‍රී ලංකාව තුළ දැනට වාසය කරන ආදිවාසී ජනතාව පිළිබඳ වෙනම සංගණනයක් සිදුකර, ඔවුනට ජීවත් වීම සඳහා දැනට පවතින අපහසුතා ක්‍රමවත්ව හඳුනාගෙන, ඔවුනට ගෞරවනීයව ජීවත් වීමට හැකි පරිසරයක් නිර්මාණය කර දීමට අවශ්‍ය සාධනීය සැලසුමක් ආදිවාසී නායකයින් ද ඇතුළත්ව පත්කරන ලද විද්වත් මණ්ඩලයක් හරහා ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.80/'15

72.

ගරු බුද්ධික පතිරණ මහතා,— යුද්ධය නිසා උතුරු හා නැගෙනහිර ප්‍රදේශයන්හි හානි වූ පුරාවස්තු සංරක්ෂණය කිරීම,— තිස් වසරක යුද්ධය හේතුවෙන් උතුරු හා නැගෙනහිර පළාත් වල පැවති පුරාවස්තු විශාල ලෙස විනාශ වූ අතර පවතින පුරාවස්තු පිළිබඳ සමීක්ෂණයක් සිදු කර තොරතුරු රැස්කර ගැනීමත්, එම පුරාවස්තු තහවුරු කිරීම, ආරක්ෂා කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීමත් අරමුණු කර ගෙන විද්වත් පුරාවිද්‍යාඥයින්ගෙන් සමන්විත කමිටුවක් පත්කිරීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.81/'15

73.

ගරු බුද්ධික පතිරණ මහතා,— වගා කිරීම සඳහා දේශීය බීජ ප්‍රචලිත කිරීම,— කෘෂි රසායන භාවිතයෙන් තොරව දේශීය කාබනික පොහොර ආශ්‍රයෙන් වගා කළ හැකි දේශීය බීජ වර්ග හඳුනාගෙන එම බීජ කඩිනමින් රට පුරා ව්‍යාප්ත කර රසායනික වස විසෙන් තොර ආහාර ජනතාවට ලබා දීම සඳහා අවශ්‍ය කරන පර්යේෂණ, තාක්ෂණය හා නිෂ්පාදනය වැඩි දියුණු කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.82/'15

74.

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ භාෂා අධ්‍යයනයට පහසුකම් සැපයීම,— පුද්ගල බුද්ධියේ පෘථුල බව තීරණය වීමට ඔහු සතු භාෂා ඥානය ප්‍රධාන සාධකයක් වන බැවින් ඉංග්‍රීසි භාෂාව හැරුණුකොට අනෙකුත් ප්‍රධාන විදේශ භාෂා හැදෑරීමට අවශ්‍ය පහසුකම් පුළුල් කර, සැලසුම් සම්පාදනය කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.83/'15

75.

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලු මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා වියදම් කරන මුදල් සීමා කිරීම,— ශ්‍රී ලංකාව තුළ පැවැත්වෙන සියලු මැතිවරණයන්හිදී ඇතැම් අපේක්ෂකයන් අති විශාල මුදල් ප්‍රමාණයක් වියදම් කරන අතර මුදල් වියදම් කළ නොහැකි, එහෙත් රටට වැඩක් කළ හැකි බුද්ධිමත් පිරිසකට ඉන් අවාසි සහගත තත්ත්වයක් ඇති වන බැවින් මැතිවරණ සඳහා වියදම් කරන මුදල් ප්‍රමාණය සීමා කිරීමට හැකි වන ආකාරයේ නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.84/'15

76.

ගරු බුද්ධික පතිරණ මහතා,— යටත් විජිත සමයේ ශ්‍රී ලංකාවෙන් රැගෙන ගිය පුරාවස්තු නැවත ලබා ගැනීම,— ශ්‍රී ලංකාව යටත් විජිතයක්ව පැවති සමයේ අප රටින් පෘතුගාලය, ඕලන්දය හා මහා බ්‍රිතාන්‍යයට රැගෙන ගිය පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත භාණ්ඩ පිළිබඳ සමීක්ෂණයක් සිදු කර එම භාණ්ඩ නැවත අප රටට ලබා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.85/'15

77.

ගරු බුද්ධික පතිරණ මහතා,— සංඝාධිකරණයක් ස්ථාපනය කිරීම,— භික්ෂූන් වහන්සේලාගේ ආරක්ෂාව හා ගෞරවය රැක ගැනීම වෙනුවෙන් උන්වහන්සේලාට අදාළ අධිකරණමය කාර්යයන් සඳහා වෙනම සංඝාධිකරණයක් පිහිටුවිය යුතු බවටත් එම අධිකරණ තීන්දු සඳහා නීතිමය බලය ලබාගැනීමට හැකි වන අයුරින් මෙම සංඝාධිකරණය ස්ථාපනය කළ යුතු බවටත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.86/'15

78.

ගරු බුද්ධික පතිරණ මහතා,— ව්‍යවස්ථාපිත සංඝ සභාවක් පත් කිරීම,— පාර්ලිමේන්තුව ඇතුළු ජනතා නියෝජිත ආයතන සඳහා උපදේශකත්වය හා මග පෙන්වීම ලබා දීමට හා අණපනත්වලට සංශෝධන ඉදිරිපත් කළ හැකි නෛතික බලය සහිත සංඝ සම්මුතියෙන් පත් කර ගත් රාජ්‍ය පරිපාලනය, නීතිය, විදේශ කටයුතු හා සමාජ ක්‍රියාකාරකම් පිළිබඳ හසල දැනුමක් සහ අත්දැකීම් සහිත විද්වත් සංඝයා වහන්සේලාගෙන් සමන්විත ව්‍යවස්ථාපිත සංඝ සභාවක් පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.87/'15

79.

ගරු බුද්ධික පතිරණ මහතා,— වාපි සංස්කෘතික අධ්‍යයන ආයතනයක් පිහිටුවීම,— ශ්‍රී ලංකාවේ පැවැති ජල තාක්ෂණය හා වැව් තාක්ෂණය නැවත පණගන්වා රැකගැනීම සහ වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය පර්යේෂණ සිදු කිරීමට හා අධ්‍යාපන පාඨමාලා මගින් උක්ත විෂය ගැන දැනුමින් සන්නද්ධ කරන ලද පිරිසක් නිර්මාණය කිරීමට හැකියාව ඇතිවන පරිදි "වාපි සංස්කෘතික අධ්‍යයන ආයතනය" නමින් ආයතනයක් රජය මැදිහත්වීමෙන් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.88/'15

80.

ගරු බුද්ධික පතිරණ මහතා,— මහාවංශය අධ්‍යයනය සඳහා ආයතනයක් පිහිටුවීම,— ශ්‍රී ලාංකීය ඉතිහාසයේ ගමන් මග පෙන්වන මහාවංශය අධ්‍යයනය කිරීම සඳහා භික්ෂූන් වහන්සේලාගේ මැදිහත් වීමෙන් "මහාවංශ අධ්‍යයන පර්යේෂණ ජාතික ආයතනය" නමින් ආයතනයක් රාජ්‍ය අනුග්‍රහයෙන් පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.89/'15

81.

ගරු බුද්ධික පතිරණ මහතා,— බෞද්ධ විරෝධී ක්‍රියා නැවැත්වීම,— ධර්ම ග්‍රන්ථ හා ප්‍රකාශන අධ්‍යයනය කිරීමේ මනා දැනුමක් ඇති නෛතික බලයක් සහිත විද්වත් සංඝ මණ්ඩලයක් පිහිටුවීම මගින් යම් නිර්මාණයක් එළිදැක්වීමට පෙර එය එම මණ්ඩලයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, සමාජගත කිරීමට නුසුදුසු නම්, සංශෝධන ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි යාන්ත්‍රණයක් සැකසීම මගින් බෞද්ධ විරෝධී ක්‍රියා හා ප්‍රකාශන රචනා වීම හා බුදු දහම සම්බන්ධ කරමින් සාවද්‍ය නිර්වචන ඉස්මතුවීම නැවැත්වීම සඳහා රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.90/'15

82.

ගරු බුද්ධික පතිරණ මහතා,— දේශ හිතෛෂී කලා නිර්මාණ ඇගයීම,— දේශානුරාගය හා ආත්මාභිමානය ඇතිවන පරිදි දේශීය හා සංස්කෘතික වටිනාකමින් අනූන කලාකෘති වාර්ෂිකව ඇගයීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.91/'15

83.

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවේ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ විනය නැංවීමට කටයුතු කිරීම,— ශ්‍රී ලංකාවේ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සෞඛ්‍ය සම්පන්න, නිරෝගී හා කායිකව ශක්තිමත් පුරවැසියන් ලෙස සමාජගත කිරීමේ අරමුණින් ඔවුන්ට තමා කැමති ක්‍රීඩාවකට යොමු වීමට සහ ප්‍රායෝගික විනය පුහුණුවකට යොමු කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.92/'15

84.

ගරු බුද්ධික පතිරණ මහතා,— බෞද්ධ සංස්කෘතික තොරතුරු මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම,— ශ්‍රී ලංකාව තුළ පිහිටා ඇති බෞද්ධාගමික ස්ථාන, ඒ හා සබැඳි අනුෂංගික අංශයන් මෙන්ම, භික්ෂූන් වහන්සේලා පිළිබඳ තොරතුරු ආදී කරුණු එක් රැස් කර විධිමත්ව පරිගණක ගත කර, නවීන තාක්ෂණික උපකරණ සහ ප්‍රමාණවත් මානව හා භෞතික සම්පත් වලින් පිරිපුන් "බෞද්ධ සංස්කෘතික තොරතුරු මධ්‍යස්ථානය" නමින් ආයතනයක් රාජ්‍ය අනුග්‍රහයෙන් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.93/'15

85.

ගරු බුද්ධික පතිරණ මහතා,— දහම් පාසල් පාඨ ග්‍රන්ථ කාලානුරූපීව සංශෝධනය කිරීම,— විභාග ඉලක්ක කරගත්, දැනුම පමණක් කේන්ද්‍රගත කළ පාඨ ග්‍රන්ථ වෙනුවට ප්‍රායෝගික පුහුණුව පදනම් කරගත්, බුද්ධිය වර්ධනය කරන්නාවූ, ශිෂ්ට සම්පන්න සමාජයක් නිර්මාණය කිරීම ඉලක්ක කර ගත් පාඨ ග්‍රන්ථ විද්වත් මණ්ඩලයක් හරහා සම්පාදනය කර දහම් පාසල් වෙත ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.94/'15

86.

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාත්‍යන්තර පාසල් නියාමනයට මණ්ඩලයක් පත් කිරීම,— ශ්‍රී ලංකාවේ සංස්කෘතියට, සදාචාරයට හා සමාජ පැවැත්මට ගැලපෙන පරිදි ජාත්‍යන්තර පාසල්හි විෂය පථයන් අවශ්‍ය පරිදි නියාමනය කළ හැකි පූර්ණ බලතල සහිත මණ්ඩලයක් පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.95/'15

87.

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වඩාත් සක්‍රීය කිරීම,— දේශීය ඉතිහාස දැනුම, සාරධර්ම සම්පන්න බව, නිෂ්පාදන ශක්‍යතාව, බුද්ධි සම්පන්න බව, සම්ප්‍රදායික දැනුම, දේශානුරාගය, නිරෝගීතාව, කුසලතා පූර්ණ බව සහ ආකල්ප සම්පත්තියෙන් යුතු බව යන අංගයන්ගෙන් පරිපූර්ණ සාර්ථක පුරවැසියෙකු බිහි කල හැකි වන පරිදි සකසන ලද ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් හරහා සමස්ත අධ්‍යාපන ක්‍රමයේම පරිවර්තනයක් ඇති කිරීමට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වඩාත් සක්‍රීය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.96/'15

88.

ගරු බුද්ධික පතිරණ මහතා,— පවුල් වෛද්‍යාවේදය පිළිබඳ විශේෂඥ සේවාව දියුණු කිරීම,— සෞඛ්‍ය සේවාවේ අත්‍යාවශ්‍ය අංශයක් වන පවුල් වෛද්‍යාවේදය පිළිබඳ විශේෂඥ ක්ෂේත්‍රය තුළ දැනට පවතින ගැටලු නිරීක්ෂණය කර ඒවා කඩිනමින් නිරාකරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමටත් එම පවුල් වෛද්‍යාවේදය පිළිබඳ විශේෂඥ සේවාව දියුණු කිරීමට සැලසුම් කිරීමටත් රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.97/'15

89.

ගරු බුද්ධික පතිරණ මහතා,— ආයුර්වේද වෛද්‍යවරුන්ගේ සේවය විදේශයන්ට ලබා දීම,— ආයුර්වේද වෛද්‍ය උපාධිය සම්පූර්ණ කරන උපාධිධාරීන්හට විදේශ රටවල රැකියා අවස්ථා ලබා දීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.98/'15

90.

ගරු බුද්ධික පතිරණ මහතා,— ආයුර්වේද වෛද්‍ය පනත සංශෝධනය කිරීම,— දැනට පවතින යල් පැන ගිය ආයුර්වේද වෛද්‍ය පනත සංශෝධනය කර ආයුර්වේද වෛද්‍යවරුන්ගේ වෘත්තීය ගැටලු විසඳමින්, එම වෘත්තිය සතු ගරුත්වය හා අභිමානය රැක ගැනීමට නව ආයුර්වේද වෛද්‍ය පනතක් කඩිනමින් ඉදිරිපත් කිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.99/'15

91.

ගරු බුද්ධික පතිරණ මහතා,— දුම්රිය ආරක්ෂක පද්ධතියක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ දුම්රිය ආරක්ෂක පද්ධති නිර්මාණය කළ නව නිපැයුම් කරුවන් ද, එම ක්ෂේත්‍රයට සම්බන්ධ විද්වතුන් ද, දුම්රිය දෙපාර්තමේන්තුවේ සියලුම ක්ෂේත්‍රයන්හි ප්‍රවීනයන්ගෙන් ද සමන්විත කමිටුවක් මගින් දුම්රිය ආරක්ෂක පද්ධතියක් සකස් කර ක්‍රියාත්මක කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.100/'15

92.

ගරු බුද්ධික පතිරණ මහතා,— මගී ප්‍රවාහන සේවයේ ගුණාත්මක තත්ත්වය වැඩි කිරීම,— බස් මගී ප්‍රවාහන සේවයේ ගුණාත්මක තත්ත්වය වැඩි කිරීම මගින් වාර්ෂිකව එම සේවාව ප්‍රතික්ෂේප කරන 1% - 2% ක් පමණ වූ මගීන් ප්‍රමාණය රඳවා ගැනීමට කටයුතු කිරීමෙන්, එම සේවයේ පැවැත්මට දීර්ඝ කාලීනව ඇති විය හැකි අවදානම අඩු කර ගැනීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.101/'15

93.

ගරු බුද්ධික පතිරණ මහතා,— සිංහල භාෂාවට සම්මතයක් සකස් කිරීම,— සිංහල භාෂාවේ ලිඛිත ව්‍යවහාරය හා කථන ව්‍යවහාරය දෙයාකාරයක් ගන්නා අතරම න, ණ, ල, ළ භේදය, අල්පප්‍රාණ, මහප්‍රාණ අක්ෂර යෙදීම සහ පද බෙදීම ආදිය ද විවාද සහිත බැවින් සිංහල භාෂාව සඳහා සම්මතයක් සකස් කිරීමට විද්වත් මණ්ඩලයක් පත් කර කාලානුරූපව සිදුවන වෙනස්කම් ද සැලකිල්ලට ගෙන භාෂාවේ පැවැත්ම තහවුරු කිරීමට හැකි ක්‍රියාදාමයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.102/'15

94.

ගරු බුද්ධික පතිරණ මහතා,— සංස්ථානික කාබනික අපද්‍රව්‍ය මගින් පරිසරය දූෂණය වීම පාලනය කිරීම,— පලිබෝධ නාශක සහ කර්මාන්ත ක්‍රියාවලියන්හි දී පිටවන සංස්ථානික කාබනික අපද්‍රව්‍ය (Persistent Organic Pollutants - POPs) දොළොස් වර්ගයක දූෂණ කාරකයන්ගෙන් සමන්විත අතර ඒවා මිනිසාගේ සෞඛ්‍යයට ඉතා අහිතකර බැවින් එම රසායනිකයන් පරිසරයට මුදා හැරීම පාලනය කිරීමට විධිමත් වැඩ පිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.103/'15

95.

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පාලනයට සම්බුද්ධ දර්ශනය සම්බන්ධ කර ගැනීම,— සප්ත අපරිහානීය ධර්ම, දසරාජ ධර්ම, රාජෝවාද ජාතකය, කුරු ධර්ම ජාතකය, ගන්ධ තින්දුක ජාතකය, තෙසකුර ජාතකය, දේවධර්ම ජාතකය, සතර සංග්‍රහ වස්තු, චක්කවත්ති සීහනාද සූත්‍රය හා ධර්ම ප්‍රදීපිකාව යන සම්බුද්ධ ඉගැන්වීම් සම්බන්ධව පාර්ලිමේන්තු, පළාත් සභා හා ප්‍රාදේශීය මට්ටමේ සිටින සියලුම පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන් දැනුවත් කිරීම තුළින් ඔවුන්ගේ භූමිකාව රටේ යහපාලනයට දායක කර ගැනීමට හැකි වන ආකාරයේ වැඩ පිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.104/’15

96.

ගරු බුද්ධික පතිරණ මහතා,— ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කිරීම,— ෆ්ලොරසන්ට් බල්බ, දුරකථන, ජංගම දුරකථන, විදුලි උපකරණ, බැටරි, පරිගණක හා එහි කොටස් ආදිය අපද්‍රව්‍ය ලෙස පරිසරයට බැහැර කිරීමේදී ආසනික්, කැඩ්මියම්, රසදිය, ලෙඩ් වැනි බැර ලෝහ පරිසරයට එකතුවන බැවින් මෙම ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කිරීමට ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කර පරිසරය සුරැකීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.105/’15

97.

ගරු බුද්ධික පතිරණ මහතා,— රටේ යහපාලනය ස්ථාපිත කිරීම,— අයහපත් පාලනයේ අංග ලක්ෂණ වන අන්තනෝමතික ප්‍රතිපත්ති සම්පාදනය, නිලබල වාදය, බලාත්මක නොවන සහ අසාධාරණ නීති, විධායක බලතල අනිසි පරිහරණය, දේශපාලනයට පුරවැසි දායකත්වය අඩුවීම සහ දූෂණය පැතිරීම යන කරුණු අප රට තුළ නොඅඩුව දක්නට ලැබෙන අතර මේ නිසා රටේ අයහපත් පාලනයක් පවතින බව පෙනී යන හෙයින් රට තුළ යහපාලනය ගොඩනැගීම සඳහා සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.106/’15

98.

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ රටවල ඇති ශ්‍රී ලංකාවට අයත් පුස්කොළ පොත් නැවත ලබා ගැනීම,— ශ්‍රී ලංකාවට අයත් වටිනා පුස්කොළ පොත් රාශියක් යුරෝපා රටවල් ඇතුළු ලෝකයේ රටවල් ගණනාවක තිබෙන අතර ඒවායේ අන්තර්ගතව ඇති දැනුම මේ වන විට වත්මන් ලාංකීය සමාජයට අහිමිව ගොස් ඇති බැවින්, එම පුස්කොළ පොත් අප රටට ආපසු ලබා ගෙන ඒවායේ අඩංගු පෞරාණික දැනුම නැවත සමාජගත කිරීමට විධිමත් වැඩ පිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.107/’15

99.

ගරු බුද්ධික පතිරණ මහතා,— ජෛව විවිධත්වය රැක ගැනීම සඳහා කෘෂිකර්මය දායක කර ගැනීම,— ඒක බෝග වගාව වෙනුවට බහු බෝග වගාව සහ මිශ්‍ර බෝග වගාව ජනප්‍රිය කරවීම, ජෛව විවිධත්වයට හානිකර රසායන ද්‍රව්‍ය කෘෂි කර්මාන්තයෙන් ඈත් කිරීම හා ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණ ක්‍රම භාවිතය තුළින් රට තුළ ජෛව විවිධත්වය ආරක්ෂා කිරීමට ගොවීන් යොමු කරන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.108/’15

100.

ගරු බුද්ධික පතිරණ මහතා,— ජනතාවගේ ආහාර ලැබීමේ අයිතිය සුරක්ෂිත කිරීම,— එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව අයිතිවාසිකම් පද්ධතීන්ට අනුකූලව ආහාර ලැබීමේ මූලික අයිතිවාසිකම ශ්‍රී ලාංකික ජනතාවට අහිමි වන තත්ත්වයක් රජයේ ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම් තුළ දක්නට ලැබෙන හෙයින් උක්ත ප්‍රඥප්තීන්ට අනුව රටේ ජනතාවගේ ආහාර ප්‍රශ්නය විසඳීමේ වගකීම මුළුමනින්ම රජයට පැවරී ඇති බැවින් රජය මැදිහත්වී ආහාර ද්‍රව්‍ය මිල පාලනය හා සෞඛ්‍ය ආරක්ෂිත ආහාර වේලක් රටේ ජනතාවට ලැබීම සහතික කෙරෙන විධිමත් වැඩ පිළිවෙළක් සම්පාදනය කර ජනතාවගේ ආහාර ලැබීමේ මූලික අයිතිවාසිකම තහවුරු කිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.109/’15

101.

ගරු බුද්ධික පතිරණ මහතා,— අකාබනික ද්‍රව්‍ය කළමනාකරණය කිරීම,— අකාබනික ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීමත්, අකාබනික ද්‍රව්‍ය භාවිතය අවම කිරීමත්, භාවිතයෙන් ඉවත්වන අකාබනික ද්‍රව්‍ය එකතු කිරීමේ යාන්ත්‍රණයක් සැකසීම හා අකාබනික ද්‍රව්‍ය භාවිතා කිරීමේ පරිසර නීති රීති විධිමත් කිරීමත් තුළින් රටේ පරිසර පද්ධතියේ ආරක්ෂාව හා යහපැවැත්ම සඳහා අකාබනික ද්‍රව්‍ය කළමනාකරණය කිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.110/'15

102.

ගරු බුද්ධික පතිරණ මහතා,— දේශීය ඖෂධ සහ අත් බෙහෙත් පිළිබඳව පාසල් සිසුන් දැනුවත් කිරීම,— නිරෝගී ජාතියක් ගොඩනැගීම සහ දේශීය ආයුර්වේදයේ යහපැවැත්ම මූලික අරමුණු වශයෙන් ගෙන දේශීය ඖෂධ වර්ග හා අත් බෙහෙත් පිළිබඳ විධිමත් කරුණු සහිත විෂයයක් පාසල් විෂය නිර්දේශයට ඇතුළත් කිරීම මගින් දේශීය ඖෂධ සහ අත් බෙහෙත් පිළිබඳ පාසල් සිසුන් දැනුවත් කිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.111/'15

103.

ගරු බුද්ධික පතිරණ මහතා,— මාතෘ හා ළමා මන්දපෝෂණය තුරන් කිරීම,— ශ්‍රී ලංකාව තුළ අඩුබර දරු උපත් අනුපාතිකය 25% තරම් ඉහළ අගයක් ගන්නා අතර එයට ප්‍රධාන සාධකය වන්නේ පෝෂ්‍යදායී ආහාර හිඟකම වන බැවින්, මාතෘ හා ළමා මන්දපෝෂණය දුරලීමට අවශ්‍ය පෝෂ්‍යදායී ආහාර දුප්පත් ජනතාවට ලබා දීම ප්‍රමුඛතාවය කරගත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.112/'15

104.

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිසරය සුරැකීමෙන් නිරෝගී රටක් ගොඩනැගීම,— වර්තමාන ශ්‍රී ලංකාවේ පරිසර දූෂණය ඉහළ යාම හේතුවෙන් ජලයේ හා ආහාරවල විකිරණශීලී බව වැඩි වී ඇති අතර අනාගතයේදී මිනිසාට වැළඳෙන ඇතැම් රෝගවල රෝග නිධානය පවා සොයා ගැනීම අපහසු විය හැකි බැවින්, මේ පිළිබඳ වැඩිදුර විමර්ශනය කිරීම සඳහා විද්වත් කමිටුවක් පත් කර වාර්තාවක් කැඳවා, එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම තුළින් රටේ ජනතාවගේ නීරෝගීභාවය සහතික කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.113/'15

105.

ගරු බුද්ධික පතිරණ මහතා,— රටේ ආරක්ෂාවට කෘෂිකර්මය සුරක්ෂිත කිරීම,— ධනවාදයේ තුන්වැනි කාර්තුව වන දෙවැනි ලෝක යුද්ධයෙන් පසු කාලයේදී හරිත විප්ලවයත් සමඟ කෘෂිකාර්මික ජීවන රටාව සම්පූර්ණයෙන්ම වෙනස් වීම හේතුවෙන් වර්තමාන ලෝක ප්‍රජාව මුහුණ දී ඇති පරිසර දූෂණය, නීරෝගී බව නැතිවීම හා පිරිසිදු ආහාර නොමැතිවීම ආදී අවදානම් තත්ත්වයන්ගෙන් ශ්‍රී ලංකාව ආරක්ෂා කර ගැනීම සඳහා ජනතාව තිරසාර කෘෂිකර්ම භාවිතයන්ට පෙළඹවීමෙන් හා ගොවීන් ආරක්ෂා කෙරෙන රාජ්‍ය ප්‍රතිපත්ති රට තුළ ස්ථාපිත කරවීමෙන් රටේ අනාගතය සුරක්ෂිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.114/'15

106.

ගරු බුද්ධික පතිරණ මහතා,— සංකීර්ණ ගෝලීය වෙළඳපොළ නිසා ජනතාවට ඇතිවන ගැටලු අවම කිරීම,— ගෝලීයකරණය විසින් හඳුන්වාදුන් ලෝක වෙළඳ රටාව මිනිසාගේ මනස ආක්‍රමණය කිරීම හේතුකොට ගෙන ඔහු පාරම්පරිකව ගෙන ආ හර පද්ධතීන් හා දියුණු දාර්ශනික චින්තනයන් මිනිස් මනස තුළින් උදුරා දැමීම වර්තමානය වන විට ශ්‍රී ලාංකිකයින්ට ද පොදු බැවින්, වෙළඳපොළ ආර්ථිකය තුළ ගොඩනැගෙන සංකීර්ණ ජීවන රටාව හා ඒ සමග පැන නගින සංකීර්ණ සමාජීය ප්‍රශ්නත් විසඳා ගනිමින් සහනශීලී දිවි පැවැත්මකට යා යුතු වන්නේ කෙසේද යන්න පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළක් හා බුද්ධිමය සංවාදයක් රට තුළ ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.115/'15

107.

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවට අවශ්‍ය සීනි රට තුළ නිපදවීම,— ශ්‍රී ලංකාවට අවශ්‍ය කරන සීනි නිෂ්පාදනය කිරීමට අවශ්‍ය සම්පත් ශ්‍රී ලංකාව සතුව ඇති බැවින්, මනා කළමනාකාරීත්වයකින්, කාර්යක්ෂමව හා සැලසුම් සහිතව කටයුතු කර රටට අවශ්‍ය සීනි ප්‍රමාණය මෙරට නිෂ්පාදනය කිරීමට හා සීනි පිරිපහදු කිරීමට අවශ්‍ය කර්මාන්තශාලා රජය මගින් ස්ථාපනය කර සීනි කර්මාන්තය රැක ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.116/'15

108.

ගරු බුද්ධික පතිරණ මහතා,— නකල්ස් රක්ෂිතය ආරක්ෂා කිරීම,— සමස්ත ශ්‍රී ලාංකීය පරිසර පද්ධතියටම බලපෑම් කළ හැකි සංවේදී පරිසර පද්ධතියක් වන නකල්ස් රක්ෂිත වනාන්තරය මේ වන විට මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් දැඩි තර්ජනයකට ලක්වී ඇති අතර වත්මන් පරපුරට මෙන්ම අනාගත මිනිස් පරපුරට ද මෙම පරිසර විනාශය හේතුවෙන් අවදානමකට මුහුණ පෑමට සිදු වන බැවින්, මිනිස් තර්ජන ඉවත් කර නකල්ස් රක්ෂිතයේ ස්වාධීන පැවැත්ම කඩිනමින් තහවුරු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.117/'15

109.

ගරු බුද්ධික පතිරණ මහතා,— රාවණා රජු පිළිබඳව විධිමත් ගවේෂණයක් සිදු කිරීම,— රාවණා රජු පිළිබඳ නිශ්චිත ඉතිහාස තොරතුරු නැති වුවද, විධිමත් ගවේෂණයක් තුළින් ඔහු පිළිබඳව අප රටේ ආකල්ප නැංවීමටත්, රාවණා රජු සතුව තිබූ දැනුම රටේ අභිවෘද්ධිය සඳහා යොදා ගැනීමට හා ශ්‍රී ලාංකීය ඉතිහාසයේ සැඟවී ගිය පරිච්ඡේදයක් නිරාවරණය කර ගැනීමටත් හැකි වන බැවින්, විද්වත් කමිටුවක් හරහා රාවණා රජු පිළිබඳව ගවේෂණය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.118/'15

110.

ගරු බුද්ධික පතිරණ මහතා,— බුද්ධිමය දිළිඳු බව තුරන් කිරීම,— භෞතික වෙළඳ භාණ්ඩ සැරිසරන වේගයට සාපේක්ෂව දැනුම, බුද්ධිය හා මානව හර පද්ධතීන් ජනතාව වෙත ළඟා නොවීම හේතුවෙන් නොදැනුවත්කම හිස එසවීම තුළින් බුද්ධිමය දිළිඳුභාවය අද අප රට තුළ දක්නට ලැබෙන ප්‍රධාන ගැටලුවක් වුවද, ඒ පිළිබඳව රට තුළ ඇත්තේ අඩු අවධානයක් බැවින්, රටේ ජනතාවගේ බුද්ධිමය දිළිඳු බව නැති කිරීමට සියලු වයස් කාණ්ඩයන් ආවරණය වන පරිදි විධිමත්ව සැලසුම් කරන ලද ජාතික වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.119/'15

111.

ගරු බුද්ධික පතිරණ මහතා,— කල් ඉකුත් වූ ඖෂධ භාවිතය නැවැත්වීම,— මේ වන විට ශ්‍රී ලංකාව තුළ කල් ඉකුත් වූ ඖෂධ වෙළඳපොළට හා රජයේ රෝහල් තුළ භාවිතයට පැමිණීමේ අවදානමක් ඇති බැවින් රජයේ අදාළ සියලු අංශ මැදිහත්වී ක්‍රියාකාරී සැලසුමක් සකස් කර කල් ඉකුත් වූ ඖෂධ වෙළඳපොළෙන් ඉවත් කිරීම හා ආනයනය කිරීම නැවැත්වීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.120/'15

112.

ගරු බුද්ධික පතිරණ මහතා,— ඒඩ්ස් රෝගය ව්‍යාප්ත වීම පාලනය කිරීම,— ශ්‍රී ලංකාව තුළ දැනට හඳුනා නොගත් ඒඩ්ස් රෝගීන් 3000 කට ආසන්න ප්‍රමාණයක් සිටින බවට වාර්තා පළ වී ඇති බැවින් ඔවුන් හඳුනාගෙන ප්‍රතිකාර සඳහා යොමු කිරීමටත්, ඒඩ්ස් රෝගය ව්‍යාප්ත වීම වැළැක්වීමටත් ඵලදායී සුදුසු ව්‍යාපෘතියක් කඩිනමින් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.121/'15

113.

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශයන්හිදී ලිංගික අතවරයට ලක්වන කාන්තාවන්ට සහන සැලසීම,— ශ්‍රී ලංකාවේ කාන්තාවන් ගෘහ සේවයට විදේශ ගතවීමෙන් පසු සිදු වන අතවරයන් හේතුවෙන් සිදුවන ගැබ් ගැනීම් නිසා ශ්‍රී ලාංකීය සමාජය තුළ නිර්මාණය වී ඇති ගැටලු සහගත තත්ත්වයන් සමනය කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකසා ක්‍රියාත්මක කිරීමට විද්වතුන් හා එම සිදුවීම් හා බැඳුණු පුද්ගල කණ්ඩායම්වලින් සැදුම්ලත් කමිටුවක් පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.122/'15

114.

ගරු බුද්ධික පතිරණ මහතා,— වන රක්ෂිත හා අභය භූමිවල ආරක්ෂාව දැඩි කිරීම සඳහා නීති සම්පාදනය කිරීම,— මෑතක සිට ශ්‍රී ලංකාවේ රක්ෂිත වනාන්තර සහ අභය භූමි විනාශය වැඩි වෙමින් පවතින අතර ශ්‍රී ලාංකීය පාරිසරික සමතුලිතතාවට ඉන් දැඩි තර්ජනයක් එල්ල වෙමින් පවතින බැවින් මෙම විනාශය නැවැත්වීම සඳහා ජනතාවගේ ආකල්පමය වෙනසක් ඇති කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළක් සැකසීමට මෙන්ම පවතින නීති ප්‍රතිපාදන විධිමත් හා දැඩි බවකින් යුක්ත වන ලෙස සංශෝධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.123/'15

115.

ගරු බුද්ධික පතිරණ මහතා,— විවිධ ආගමික කණ්ඩායම්වලින් සිදු වන සමාජ බලපෑම් පිළිබඳව අධ්‍යයනය කිරීම,— ප්‍රධාන ධාරාවේ ආගමික මතවාදයන් විවේචනය කරමින්, එම ආගම්හි අනු කණ්ඩායම් ලෙස තම නිර්වචන හා පැහැදිලි කිරීම් සමාජගත කරන, නව මතවාද ඉදිරිපත් කරමින් එම මතවාද පිළිගත් පුද්ගලයින් එක් රැස් කර ගන්නා, ආගමික හා වෙනත් මුහුණුවරකින් සමාජගත වී ඇති කණ්ඩායම් පිළිබඳ අධ්‍යයනය කරමින් ඔවුන්ගේ මතවාද, ක්‍රියාකාරීත්වයන් හා සමාජයට ඔවුන් නිසා ඇති වන බලපෑම් කවරාකාරද යන්න පිළිබඳ තක්සේරුවක් ලබා දීමට පිළිගත් ආගමික නායකයන්ගෙන් හා විද්වතුන්ගෙන් සැදුම් ලත් කමිටුවක් පත් කර, වාර්තාවක් කැඳවා එහි නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.124/'15

116.

ගරු බුද්ධික පතිරණ මහතා,— ඉහළ ප්‍රමිතියෙන් යුත් මැටි භාජන නිෂ්පාදනය කිරීම,— ආහාර පිසීමේදී ගෑස් හා විදුලිය අපතේ නොයන ලෙස ඉක්මනින් තාපය අවශෝෂණය කර ගන්නා මැටි භාජන නිෂ්පාදනය කර වෙළඳපොළට ඉදිරිපත් කිරීමට, අවශ්‍ය පරීක්ෂණ සිදු කිරීමට හා මැටි භාජන භාවිතයෙන් සෞඛ්‍යාරක්ෂිතව ආහාර පිසීමට ඇති හැකියාව පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට ජාතික මට්ටමේ වැඩ සටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.125/'15

117.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධිමානසික විද්‍යා ක්ෂේත්‍රයට බුදු දහමින් ආභාෂය ලබා ගැනීම,— බුදුන් වහන්සේගේ සිත පිළිබඳ ඇතැම් විග්‍රහයන් නූතන විද්‍යාවට හසු නොවන තරම් ගැඹුරු බැවින්, ඒ පිළිබඳ පර්යේෂණ කිරීමට හා වර්තමානයේ අධිමානසික විද්‍යා ක්ෂේත්‍රයේ ඇති ගැටලු සඳහා බුදු දහම ඇසුරින් නිර්වචන හා විසඳුම් ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි, අදාළ ක්ෂේත්‍රය පිළිබඳ හසල දැනුමක් ඇති දේශීය හා විදේශීය විද්වතුන්ගෙන් සමන්විත කමිටුවක් පිහිටුවා, ඒ හරහා බුදු දහම දේශීය හා විදේශීය වශයෙන් ප්‍රචලිත කිරීමටත්, ශ්‍රී ලංකාවේ කීර්ති නාමය ඉහළ නැංවීමටත්, අධිමානසික විද්‍යා ක්ෂේත්‍රයේ පුනරුදයක් ඇති කිරීමටත් රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.126/'15

118.

ගරු බුද්ධික පතිරණ මහතා,— විද්‍යාර්ථීන් අතර පුරාවිද්‍යා විෂයය ජනප්‍රිය කරවීම,— විද්‍යාර්ථීන් අතර පුරාවිද්‍යා විෂයය ජනප්‍රිය කිරීම සඳහා මූලික වශයෙන් පාසල් විෂයය නිර්දේශයට එම විෂයය ඇතුළත් කිරීම හා විශ්වවිද්‍යාලවල පුරාවිද්‍යා විෂය පථය තවදුරටත් පුළුල් කිරීමට හා පහසුකම් ලබාදීම සඳහා කටයුතු කිරීමත්, එමගින් පුරාවිද්‍යා විෂයය රට තුළ ව්‍යාප්තවීම හරහා බිහිවන උගතුන්ගෙන් රටට යහපත් සේවයක් ලබා ගැනීමත් අරමුණු කරගත් ජාතික වැඩසටහනක් දිගුකාලීනව සැලසුම් සහිතව නිර්මාණය කිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.127/'15

119.

ගරු බුද්ධික පතිරණ මහතා,— ආහාරවල ඇති වස විෂ පිළිබඳ සොයා බැලීමට විශේෂ ප්‍රමිති ආයතනයක් පිහිටුවීම,— කෘෂිකර්මාන්තයේදී භාවිතා කෙරෙන රසායන ද්‍රව්‍ය හේතුවෙන් ආහාර ද්‍රව්‍යයන්ට ද වස විෂ මිශ්‍රවී ඇති අතර, ඒ පිළිබඳව සොයා බැලීමට අදාළ ප්‍රමිති ආයතනයක් දැනට ශ්‍රී ලංකාව තුළ පිහිටුවා නොමැති බැවින් එම කාර්යය සඳහා විශේෂ ප්‍රමිති ආයතනයක් පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.128/'15

120.

ගරු බුද්ධික පතිරණ මහතා,— යාචකයින් සිඟමනට යොදාගන්නා දරුවන් පුනරුත්ථාපනය කිරීම,— ශ්‍රී ලංකාවේ යාචකයින් දරුවන් සමග සිඟමන් යැදීම තහනම් කර, සිඟමන සඳහා යොදා ගන්නා දරුවන් පුනරුත්ථාපනය කර, ඔවුන් යහපත් පුරවැසියන් ලෙස සමාජගත කිරීම සඳහා අවශ්‍ය ජාතික මට්ටමේ වැඩපිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.129/'15

121.

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව තුළ භික්ෂුණී ශාසනය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් සකස් කිරීම,— මහා ප්‍රජාපතී ගෝතමී තෙරණීන්වහන්සේගෙන් ඇරඹුණු භාරතීය භික්ෂුණී ශාසනය සංඝමිත්තා තෙරණීන්වහන්සේගේ ලංකාගමනයෙන් ශ්‍රී ලංකාව තුළ මැනවින් ස්ථාපිත වුවද, පසුකාලීනව අභාවයට ගිය බැවින්, මෑත යුගයේ දී ශ්‍යාමෝපාලි මහා නිකායේ රංගිරි දඹුලු පාර්ශ්වය විසින් යළි ස්ථාපනය කරන ලද අතර, එලෙස ස්ථාපනය කරන ලද භික්ෂුණී ශාසනයට නිසි පිළිගැනීමක් ලබාදීම සඳහා රජය ත්‍රෛනිකායික මහා නායක ස්වාමීන්වහන්සේලා ඇතුලු අදාළ සියළු ක්ෂේත්‍රයන්ගේ මූලිකත්වයෙන් නිසි සංවාදයක් ඇරඹිය යුතු යැයි ද, එම සංවාදය අවසානයේ විධිමත් ක්‍රමවේදයක් ඔස්සේ ශ්‍රී ලංකාව තුළ භික්ෂුණී ශාසනය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා වැඩපිළිවෙළක් සැකසිය යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.130/'15

122.

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකීය භික්ෂු සංස්ථාව ව්‍යුහාත්මකව විධිමත් කිරීම,— ශ්‍රී ලාංකීය භික්ෂු සංස්ථාව තුළ සංඝයාවහන්සේලා පාර්ශ්ව ගත වීම හේතුවෙන් ව්‍යුහාත්මකව අසංවිධිත වී ඇති අතර එම නිසා ජාතික හා ජාත්‍යන්තර අභිචාර උපචාරයන්හිදී සංඝයා වහන්සේලා ඒකමතික නොවීම රටට අහිතකර ලෙස බලපාන බැවින් සමස්ථ සංඝ සමාජයේ ඒකමතිකත්වය ඇති කර ගැනීමට හැකි වැඩපිළිවෙළක් සැකසීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.131/'15

123.

ගරු බුද්ධික පතිරණ මහතා,— ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ලාභදායී ආයතනයක් කිරීම,— ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ලාභදායී ආයතනයක් ලෙස ජනතාවාදීව සංවර්ධනය කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීමට විද්වත් මණ්ඩලයක් පත් කර ඔවුන්ගේ නිර්දේශයන්ට අනුව සංස්ථාවේ පවතින වංචා, දූෂණ හා පරිපාලනමය ගැටලු විසඳා ඵලදායී ජාතික ආයතනයක් ලෙස ක්‍රියාත්මක වීමට අවශ්‍ය පරිසරය රජය මැදිහත්ව නිර්මාණය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.132/'15

124.

ගරු බුද්ධික පතිරණ මහතා,— ඖෂධ සඳහා අවශ්‍ය ප්‍රමාණයට ගංජා වැවීමට දේශීය වෛද්‍යවරුන්ට අවසර ලබා දීම,— ඉන්දියාවේ සිට රහසිගත මාර්ග ඔස්සේ රට තුළට ගෙන්වන රසායනික ද්‍රව්‍ය මිශ්‍රිත ගංජා භාවිතා කර නිපදවන දේශීය ඖෂධවල ගුණාත්මක බව අඩුවන

බැවින්, ආයුර්වේද ඖෂධ නිපදවීමේදී තම ඖෂධවල ගුණාත්මක බව ආරක්ෂා කර ගැනීම සඳහා ගංජා අත්‍යවශ්‍ය ඖෂධයක් ලෙස යොදා ගන්නා රජයේ පිළිගත් ආයුර්වේද වෛද්‍යවරුන්ට සීමාවන් සහිතව ගංජා ශාකය වැවීමට අවසර ලබාදීම සඳහා අවශ්‍ය නීති සංශෝධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.133/'15

125.

ගරු බුද්ධික පතිරණ මහතා,— එළවළු ගොවීන්ට සාධාරණ මිලක් ලබා දීම,— එළවළු තොග වෙළඳාමේදී ක්‍රියාත්මක වන කප්පම් ගැනීම හා මිල තීරණය කිරීම් ආදී ක්‍රියා හරහා ගොඩනැගී ඇති සංවිධානාත්මක වෙළඳ ඒකාධිකාරයන් නිසා එළවළු ගොවීන්ට සාධාරණ මිලක් ලබා දීමට මෙතෙක් ක්‍රියාත්මක කළ සැලසුම් අසාර්ථක වී ඇති බැවින්, ගොවියාට සාධාරණ මිලක් ලබා දීමේ මූලික අරමුණ කරගත් බලපෑම් වලින් තොර වෙළඳපොළක් රාජ්‍ය වෙළඳ ආයතන මැදිහත්වී නිර්මාණය කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.134/'15

126.

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් දරුවන්ගේ වටිනාකම සමාජගත කිරීම,— දෙමාපියන්, ගුරුවරුන්, ක්‍රීඩා පුහුණුකරුවන් හා පාසල් වෑන් රථ රියැදුරන් යන පිරිස් සඳහා දරුවන්ගේ වටිනාකම පිළිබඳ සමාජ විද්‍යාත්මක හා මනෝ විද්‍යාත්මක ක්‍රමවේදයන් තුළින් සරළව පැහැදිලි කර, රටේ හා සමාජයේ ඉදිරි යහපැවැත්ම සඳහා දරුවා සමාජ අභියෝගයන් හමුවේ ආරක්ෂා කරන්නේ කෙසේද යන්න පිළිබඳව සංවාදයක් පැවැත්වීමට ජාතික මට්ටමේ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.135/'15

127.

ගරු බුද්ධික පතිරණ මහතා,— කාන්තාවන්ට ඇතිවන පීඩාවන් අවම කිරීම,— වත්මන් ගෝලීය සමාජය තුළ කාන්තාවන්ට සිදුවන පීඩාවන් වන ශ්‍රම හා ලිංගික සූරාකෑමට ලක්වීම, පෞද්ගලික දේපළ ක්‍රමය පුරුෂ කේන්ද්‍රීයව විකාශනය වීම, අසමාන ලෙස සැලකීම හා පවුල් සංස්ථාව තුළ සිරගත වීම නිසා ශ්‍රම සංචලතාවයට බාධා ඇතිවීම යන කරුණු ශ්‍රී ලාංකික කාන්තාවන්ට ද ප්‍රධාන වශයෙන් පොදු වන බැවින්, ඔවුන්ගේ යහපැවැත්ම වෙනුවෙන් මෙම පීඩාකාරී වාතාවරණය සමනය කර සහන සැලසීමට අවශ්‍ය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.136/'15

128.

ගරු බුද්ධික පතිරණ මහතා,— පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව නගා සිටුවීම,— ශ්‍රී ලංකාව තුළ පිහිටා ඇති පුරාවස්තු සංරක්ෂණය කිරීමට හැකියාවක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට නොමැත්තේ පවත්නා මානව හා භෞතික සම්පත්හි අඩුව නිසා වන හෙයින්, විද්වත් මණ්ඩලයක් මගින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ඇති අඩුපාඩුකම් පිළිබඳ සොයා බලා, ඒවා සම්පූර්ණ කිරීමට අවශ්‍ය පියවර ගැනීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.137/'15

129.

ගරු බුද්ධික පතිරණ මහතා,— දුර ගමන් සේවා බස් රථවල ගමන් ගන්නා මගීන්ට සෞඛ්‍යාරක්ෂිත ආහාර පාන ලබා ගැනීමට පහසුකම් සැලසීම,— දුර ගමන් සේවා බස් රථ ආහාර පාන ගැනීම සඳහා නතර කරනු ලබන ආපනශාලාවන්හි ප්‍රමිතිය ඉතා පහළ මට්ටමක පවතින බැවින් එය මගී ජනතාවගේ සෞඛ්‍යයට අහිතකර වන අතර, එම ආපනශාලාවල ප්‍රමිතිය ඉහළ නැංවීමට නිරන්තරව පසු විපරම් කළ හැකි වන පරිදි සකස් කරන ලද ජාතික වැඩසටහනක් රජය විසින් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.138/'15

130.
ගරු බුද්ධික පතිරණ මහතා,— රජය සතු වැවිලි සමාගම් ලාභදායී ආයතන බවට පත් කිරීම,— රජය සතු වැවිලි සමාගම් පාඩු ලබන ආයතන බවට පත්වී ඇති බැවින්, විද්වත් කමිටුවක් පත්කර එම ආයතනවල ලාභදායීත්වය වර්ධනය කිරීමට අවශ්‍ය නිර්දේශ සකස් කර, එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම තුළින් එම සමාගම්වල ලාභදායීත්වය ඉහළ දැමීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.139/'15

131.
ගරු බුද්ධික පතිරණ මහතා,— වන රක්ෂිත තුළ සිදුවන නීති විරෝධී ක්‍රියා නැවැත්වීම,— ශ්‍රී ලංකාවේ වන රක්ෂිත තුළ සිදුවන නීති විරෝධී වගාවන්, විවිධ ඉදිකිරීම්, වනාන්තර එළිකිරීම් හා රක්ෂිත සීමා මායිම් වෙනස් කිරීම ආදී වන විනාශයට හේතුවන මිනිස් ක්‍රියාකාරකම් වැටලීමට විශේෂයෙන් සවිබල ගන්වන ලද පොලිස් වන ආරක්ෂක ඒකකයක් පිහිටුවීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.140/'15

132.
ගරු බුද්ධික පතිරණ මහතා,— කොරල්පර සංරක්ෂණය කිරීම,— සාගර ජලයේ උෂ්ණත්වය ඉහළ යෑම හා මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් කොරල්පර විනාශ වීමේ තර්ජනයට ලක්ව ඇති බැවින්, ශ්‍රී ලංකා මුහුදු කලාපය අවට ඇති කොරල්පර ආරක්ෂා කර ගැනීමට හා නව කොරල්පර නිර්මාණය වීමට උචිත පරිසර පද්ධති සකස් කිරීම සඳහා අවශ්‍ය නව නියාමනයන් සකස් කර ක්‍රියාත්මක කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.143/'15

133.
ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා,— ගවයින් සඳහා සුදුසු තෘණ බිම් වෙන් කිරීම,— ආසන්න වශයෙන් ගවයින් 250,000කට පමණ තෘණ භූමි අවශ්‍යව සිටින බැවින් සහ කිරි නිෂ්පාදනය වැඩි කිරීමේ රජයේ ප්‍රතිපත්තිය සපුරාගැනීම සඳහා වෙන් කරන ලද තෘණ භූමි දිස්ත්‍රික්කය තුළ පිහිටා නොමැතිකම නිසා, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ සුදුසු තෘණ භූමි ප්‍රකාශකර, වෙන්කර ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.145/'15

134.
ගරු එස්. එම්. මරික්කාර් මහතා,— රජයේ ආයතනවලින් ජනතාවට සිදුවන අකටයුතුකම් පිළිබඳ සොයා බැලීමට ආයතනයක් පිහිටුවීම,— රජයේ ආයතන මගින් විවිධ සේවාවන් ලබාගැනීම සඳහා පැමිණෙන මහජනතාවට සිදුවන අකටයුතුකම් සහ අසාධාරණකම් පිළිබඳ සොයා බැලීම සඳහාත්, එම අසාධාරණකම් විභාග කිරීම සඳහාත් නෛතික බලයක් සහිත ආයතනයක් ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.150/'15

135.
ගරු හේෂා විතානගේ මහතා,— උපාධිධාරීන් සඳහා රැකියා ලබා දීමේදී නිසි ක්‍රමවේදයක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ උපාධිධාරීන්ට රැකියා ලබා දීමේදී මෙතෙක් කල් ක්‍රියාත්මක වූ පක්ෂ පාට භේද ක්‍රමය නොසලකා සාධාරණය ඉටුකිරීම සඳහා නිසි ක්‍රමවේදයක් සැලසුම් කර එය ප්‍රතිපත්තියක් ලෙස සම්මත කිරීමට පියවර ගන්නා ලෙසත්, දේශපාලනඥයන් හමුවේ උපාධිධාරීන් හෑල්ලුවට පත් නොකිරීමට වගබලා ගත යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.151/'15

136.

ගරු හේෂා විතානගේ මහතා,— වතු ආශ්‍රිතව ජීවත්වන දමිළ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම,— වතු ආශ්‍රිත දමිළ ජනතාව ජීවත්වන පරිසරය තුළ විදුලිය, ජල පහසුකම් සහ යටිතල පහසුකම් අවම මට්ටමක පවතින අතර එම තත්ත්වය පාසල් දරුවන්ගේ අධ්‍යාපන කටයුතුවලටත්, එම ජනතාවගේ පෞද්ගලික ජීවිතයටත් බාධා ඇතිකරන බැවින්, මෙම ලයින් නිවාස සංස්කෘතිය නිමා කර ඒ සඳහා නව විධිමත් තනි නිවාස ක්‍රමයක් සකස් කිරීමට අවශ්‍ය කඩිනම් වැඩසටහනක් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.154/'15

137.

ගරු ලකී ජයවර්ධන මහතා,— මහනුවර දිස්ත්‍රික්කය තුළ මහල් නිවාස යෝජනා ක්‍රමයක් ආරම්භ කිරීම,— මහනුවර දිස්ත්‍රික්කයේ පවතින ඉඩම් හා නිවාස හිඟයට පිළියමක් වශයෙන් මහනුවර ප්‍රදේශයේ පිහිටා ඇති රාජ්‍ය වැවිලි ආයතනවලට අයත් වගා නොකළ ඉඩම් තෝරාගෙන මහල් නිවාස ක්‍රමයක් ඇතිකොට නිවාස නොමැති මහනුවර දිස්ත්‍රික් මධ්‍යම පාන්තික ජනතාවට කඩිනමින් නිවාස ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.155/'15

138.

ගරු ලකී ජයවර්ධන මහතා,— වසර 12 ක ක්‍රියාන්විත රාජකාරියේ නිරතව සිටි ත්‍රිවිධ හමුදා සෙබළුන්ට විශ්‍රාම වැටුප් ලබා දීම,— ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදා සේවයේ වසර 22 ක් සම්පූර්ණ වූ පසු විශ්‍රාම යෑමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක වන බැවින්, උතුරු නැගෙනහිර ක්‍රියාන්විත රාජකාරියේ නියැලී වසර 12 ක් අඛණ්ඩව සේවය කොට එම සේවාවෙන් ඉවත් වී සිටිනා අයවලුන් දැනට ඉතා අසරණ තත්ත්වයෙන් පසුවන බැවින් එම ත්‍රිවිධ හමුදාවේ හා පොලීසියේ සේවය කළ අයට අර්ධ විශ්‍රාම වැටුපක් ලබා දීමේ ක්‍රමවේදයක් කඩිනමින් සකසා එම අයට සහනයක් සැලසීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.156/'15

139.

ගරු ලකී ජයවර්ධන මහතා,— මහනුවර නගරය තුළ පවත්නා මාර්ග තදබදය අවම කිරීම,— ශ්‍රී ලංකාවේ දෙවැනි අගනගරය වන මහනුවර නගරය දේශීය හා විදේශිකයන්ගේ සංචාරක මධ්‍යස්ථානයක් වන හෙයින් ද, මහනුවර නගරයට එදිනෙදා විශාල පිරිසක් පැමිණෙන අතර එම ජනතාව මහනුවර නගරයේ හා අවට මාර්ගවල ඇති අධික රථ වාහන තදබදය නිසා මහත් අසීරුතාවයකට පත්වන බැවින් ද, මහනුවර නගරයේ මාර්ග තදබදය අවම කිරීම සඳහා කඩිනම් විසඳුමක් ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.157/'15

140.

ගරු ලකී ජයවර්ධන මහතා,— මහනුවර නගරය තුළ මුස්ලිම් පිරිමි පාසලක් ආරම්භ කිරීම,— මහනුවර දිස්ත්‍රික්කය තුළ මුස්ලිම් ජනතාව ඉතා වැඩි පිරිසක් ජීවත් වන අතර, මහනුවර නගරය ආශ්‍රිතව මුස්ලිම් පිරිමි පාසලක් පිහිටුවිය යුතු යැයි දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රදේශයේ මුස්ලිම් ජනතාවගේ ද ඉල්ලීමක්ව පවතින බැවින්, ඉතා කඩිනමින් මහනුවර නගරයේ මුස්ලිම් පිරිමි පාසලක් පිහිටුවීමට අවශ්‍ය කටයුතු සැලසිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.158/'15

141.

ගරු ලකී ජයවර්ධන මහතා,— මහනුවර නගරය තුළ පිහිටි ජනප්‍රිය පාසල් සඳහා පළමු ශ්‍රේණියේ දරුවන් වෙනුවෙන් නව ගොඩනැගිලි ඉදිකිරීම,— මහනුවර නගරය ආශ්‍රිතව ජනප්‍රිය පාසල් සඳහා පළමුවැනි ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමට විශාල පිරිසක් ඉල්ලුම් කළත්, එම පාසල්වල ඉඩකඩ සීමිත හෙයින්, දරුවන් ඇතුළත් කිරීම ඉතා අසීරු වී ඇති බැවින් මහනුවර නගරය ආශ්‍රිත ප්‍රධාන පාසල්වලට පළමුවැනි ශ්‍රේණියේ පන්ති පැවැත්වීම සඳහා නව ගොඩනැගිලි ඉතා කඩිනමින් ඉදිකර දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.159/'15

142.

ගරු ලකී ජයවර්ධන මහතා,— මහනුවර පල්ලේකැලේ නිදහස් වෙළඳ උද්‍යාන ක්‍රමවත්ව පුළුල් කිරීම,— මහනුවර දිස්ත්‍රික්කය තුළ විරැකියාවෙන් පෙළෙන තරුණ තරුණියන් විශාල පිරිසක් සිටින බැවින්, එම අයට රැකියා අවස්ථා කඩිනමින් සපයා දීම සඳහා මහනුවර පල්ලේකැලේ ප්‍රදේශයේ පිහිටා ඇති නිදහස් වෙළඳ උද්‍යාන දෙක ක්‍රමවත් ලෙස සකසා වැඩි පිරිසකට රැකියා අවස්ථා ලබා ගැනීමට අවස්ථාව සැලසීමට කඩිනමින් කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.160/'15

143.

ගරු ලකී ජයවර්ධන මහතා,— උඩරට ගැමි පුනරුත්ථාපන කොමිෂන් සභාව යළි ස්ථාපනය කිරීම,— අධිරාජ්‍යවාදී පාලන කාලයේදී අසරණ වූ උඩරට ප්‍රදේශවාසී ජනතාවට සහන සැලසීම උදෙසා ස්ථාපිත කර තිබූ උඩරට ගැමි පුනරුත්ථාපන කොමිෂන් සභාව පසුගිය පාලන කාලය තුළ අක්‍රීය තත්ත්වයට පත් කිරීම නිසා උඩරට ජනතාවට සිදුවී ඇති අසාධාරණයන් සාධාරණය කිරීම සඳහා උඩරට ගැමි පුනරුත්ථාපන කොමිෂන් සභාව නැවත ක්‍රමවත්ව ස්ථාපිත කරලීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සැලසිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.162/'15

144.

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— උතුරු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පවතින ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශේෂ සේවක සංඛ්‍යා පුරප්පාඩු, ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය පදනම් කරගෙන පිරවීම සහ තරඟ විභාගයෙන් නිදහස් කර III ශ්‍රේණියට පත්කිරීම,— උතුරු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ පවතින ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශේෂ සේවක සංඛ්‍යා පුරප්පාඩු පිරවීම සම්බන්ධව නිසි විශ්ලේෂණයක් කර මෙම තනතුරුවලට අදාළ රාජකාරිවල නිරත ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ හා ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාවය සැලකිල්ලට ගෙන ඔවුන් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ තරඟ විභාගයෙන් නිදහස් කර අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියට පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.163/'15

145.

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— උතුරු පළාතේ පළාත් සභාව යටතේ ඇති පාසල්වල වැඩ බලන විදුහල්පතිවරුන් විදුහල්පති තරඟ විභාගයෙන් නිදහස් කර, එම නිලධාරීන් විදුහල්පති සේවයේ III ශ්‍රේණියට පත් කිරීම,— උතුරු පළාත් සභාව යටතේ ඇති පාසල්වල දීර්ඝ කාලයක් සේවයේ නියුතු ශ්‍රී ලංකා ගුරු සේවයට අයත් වැඩබලන විදුහල්පතිවරුන්ගේ ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාවය සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ තරඟ විභාගයෙන් නිදහස් කර, එම නිලධාරීන් ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියට පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.168/'16

146.

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— ජාතීන් අතර ජාතික සංහිඳියාව ගොඩනැංවීම,— ජාතික සංහිඳියාව හා ජාතීන් අතර අන්‍යෝන්‍ය අවබෝධය සහ එකමුතුව වඩාත් ඵලදායී ලෙස ගොඩනැගීම සඳහා දීර්ඝ කාලීන ඉලක්කයන්ට මුල පිරීමේ අරමුණින්, ශ්‍රී ලංකාව තුළ සෑම දෙමළ මාධ්‍ය පාසලකම සිංහල මාධ්‍යයෙන් උගන්වන අංශයක් ආරම්භ කළයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.169/'16

147.

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— නව ක්‍රීඩා පනතක් හඳුන්වාදීම,— දිස්ත්‍රික් ක්‍රීඩා සංගම්වල ඡන්දයෙන් ක්‍රීඩා පාලක මණ්ඩලවලට නිලධාරීන් තේරී පත්වීමේ ක්‍රමය වෙනුවට අලුත් ක්‍රමවේදයක් හඳුන්වා දී, එමගින් එම නිලධාරීන්ගේ ක්‍රියා කලාපය, මහජනතාවට හෝ පාර්ලිමේන්තුවට හෝ වගකියන අයුරින් ශ්‍රී ලංකාවේ ක්‍රීඩාවේ දියුණුව සහ අභිවෘද්ධිය සඳහා නව ක්‍රීඩා පනතක් හඳුන්වා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.177/'16

148.

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— හජ් වන්දනා පනතක් හඳුන්වා දීම,— ශ්‍රී ලංකාවේ සිට වාර්ෂිකව හජ් වන්දනාවේ යෙදෙන බැතිමතුන් විසින් මුහුණ දෙන ගැටලු නිරාකරණය කර ගැනීමටත්, ඒ පිළිබඳ ආයතනික ව්‍යුහයක් ස්ථාපනය කොට නීතිමය ප්‍රතිපාදන සකස් කිරීමටත්, රජය මඟින් "හජ් වන්දනා පනතක්" හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.178/'16

149.

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— යුද්ධය නිසා දිවි අහිමි වූ ජනතාව සිහි කිරීම සඳහා අනුස්මරණ ස්මාරකයක් තැනීම සහ සිහිපත් කිරීම සඳහා පොදු දිනයක් වෙන් කිරීම,— දශක ගණනාවක සිට උතුරු පළාතේ පැවති යුදමය වාතාවරණය තුරන් වී සාමකාමී ජීවන රටාවකට ජනතාව දැන් අවතීර්ණ වී සිටින අතර පසුගිය කාලයේ පැවති අසාමාන්‍ය තත්ත්වයන් නිසා ද, යුදමය වාතාවරණය හේතුවෙන් ද, ඝාතනයට ලක්වූ සියලු ජාති, ආගම් හා සමාජවලට අයත්, සියලුම භාෂාවන් කතාකරන ජනතාව, ශ්‍රී ලාංකිකයින් ලෙස සිහිපත් කරමින්, එම ජනතාව මව්බිම වෙනුවෙන් ද, ඔවුන් කළ පරිත්‍යාගයන්වලට ගෞරව කිරීම සඳහා ද, උතුරු පළාතේ ඕමන්තේ ප්‍රදේශය තුළ සුදුසු ස්ථානයක "අනුස්මරණ ස්මාරකයක්" තැනීමට ද, එම යුදමය තත්ත්වය නිසා දිවි අහිමි වූ සියලුම ජාති, ආගම් හා භාෂාවන් කථා කරන ජනතාව සිහිගැන්වීම සඳහා සුදුසු දිනයක් නම් කොට සෑම වසරක් පාසාම එම දිනය සැමරීමට ද රජය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.179/'16

150.

ගරු සිසිර ජයකොඩි මහතා,— මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම සඳහා අධිකාරියක් පිහිටුවීම,— මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වූ අති විශාල තරුණ පිරිසක් ඒවායින් අත්මිදීමට අපේක්ෂාවෙන් පසුවුවද, ඒ සඳහා නිශ්චිත වැඩපිළිවෙළක් හෝ ක්‍රමවේදයක් නොමැතිවීම ඔවුන් මුහුණ දෙන බරපතල ගැටලුවක්ව ඇති බැවින්, ආගමික නායකයින්ගේ මූලිකත්වයෙන් බෞද්ධ ආධ්‍යාත්මික භාවනා ක්‍රම, දේශීය ඖෂධ ක්‍රමයන් හා අනෙකුත් ප්‍රතිකර්ම ක්‍රම ද උපයෝගී කරගනිමින් මත්කුඩු හා මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම සඳහා අධිකාරියක් පිහිටුවීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.180/'16

151.

ගරු ජේ. සී. අලවතුවල මහතා,— ශ්‍රී ලංගම හා පෞද්ගලික බස් රථ සඳහා දිවයින පුරා ඒකාබද්ධ ධාවන සැලැස්මක් රාත්‍රී කාලයේදී ක්‍රියාත්මක කිරීම,— ශ්‍රී ලංකාව පුරා සවස 6න් පසුව ශ්‍රී ලංගම හා පෞද්ගලික බස් රථ නිසියාකාරව ධාවනය නොවීම හේතුවෙන් මගී ජනතාව බලවත් අපහසුතාවයට පත් වී සිටින හෙයින්, ඊට පිළියම් වශයෙන් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සහ පළාත් සභා යටතේ ක්‍රියාත්මක මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරී ආයතන සමඟ එක්ව ශ්‍රී ලංගම සහ පෞද්ගලික බස් රථ රාත්‍රී කාලයේදී දිවයින පුරා ධාවනය කිරීමට සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.181/'16

152.

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා,— උතුරු පළාතෙන් බලහත්කාරයෙන් නෙරපා හරින ලද මුස්ලිම් ජනතාව නැවත පදිංචි කරවීම,— උතුරු පළාත තුළ සියවස් ගණනාවක් තිස්සේ ජීවත් වූ මුස්ලිම් ජනතාව 1990 වසරේදී පැය 48ක කාලසීමාවක් තුළ එම පළාතෙන් බලහත්කාරයෙන් ඉවත් කරන ලද අතර ඔවුන් ඉන් පිටවූයේ තමන් සතු දේපළ සහ වස්තූන් හැර දමා තම ජීවිත පිළිබඳ කිසිඳු සහතිකයක් නොමැතිව මෙම සුළුතර ජනතාව එතැන් සිට මේ දක්වා කාලය තුළ රටට ද්‍රෝහී නොවී රටින් පිටව නොයමින් ජීවත් වූ අතර පසුගිය ජනාධිපතිවරණ සහ පාර්ලිමේන්තු මැතිවරණවලදී පවා ඔවුන්ගෙන් 95%ක් සිය ඡන්දය ප්‍රකාශ කළ නමුදු ඔවුන්ට තවමත් සිය මුල් ගම් බිම් වෙත යාමට නොහැකි වී ඇති හෙයින්, ඔවුන්හට සියලු අයිතිවාසිකම්

සහිතව සිය මුල් ගම් බිම් වෙත යාමට අවස්ථාව සැලසීම සඳහා ඇති සියලු බාධාවන් හඳුනාගෙන ඒවා ඉවත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම රජයේ වගකීම විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.182/'16

153.

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා,— උපාධිධාරීන් උපදේශන නිලධාරින් ලෙස පාසල්වලට බඳවා ගැනීම,— දිවයින පුරා සිදුවන කාන්තා හා ළමා අපචාර තුරන් කිරීමේ අරමුණෙන් සහ දිවයින පුරා සියලුම පාසල්වල ප්‍රාථමික, ද්විතියික සහ උසස් පෙළ සිසුන්ට, ඔවුන්ගේ අධ්‍යාපනික ක්‍රියාකාරකම්වලට සමගාමීව, උපදේශනය ලබාදීම සඳහා, 2016 වසරේ සිට ක්‍රියාත්මක වන පරිදි, උපාධිධාරීන්ට රැකියා උත්පාදනය කිරීම පෙරදැරි කොටගෙන, දැනට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්ට අනුයුක්ත කොට ඇති උපදේශන නිලධාරීන්ගේ කාර්යභාරයට සමාන වන ආකාරයෙන්, විශේෂ පත්වීමක් ලෙස උපදේශන නිලධාරින් ලෙස උපාධිධාරීන් පත්කිරීම පිණිස ක්‍රියාකාරී සැලැස්මක් ක්‍රියාවට නැගිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

පා.183/'16

154.

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා,— රැකියා ලක්ෂ දහයක් ලබාදීමේ ව්‍යාපෘතියෙහිදී උතුරු හා නැගෙනහිර පළාත්වල තරුණ තරුණියන් සඳහා ප්‍රමුඛතාවය ලබා දීම,— රැකියා ලක්ෂ දහයක් ලබාදීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී, උතුරු නැගෙනහිර පළාත්වල ජීවත් වන, වයස අවුරුදු තිස්පහ සිට හතලිස් පහ දක්වා තරුණ තරුණියන්ට ප්‍රමුඛතාවය ලබාදිය යුතු බවත්, ප්‍රාථමික, ද්විතියික සහ ජ්‍යෙෂ්ඨ ද්විතියික මට්ටම්වලදී පාසල් අතහැර ගිය අ.පො.ස (සාමාන්‍ය පෙළ) සුදුසුකම් සහිතව පාසල්වල ස්වෙච්ඡා ගුරුවරුන් ලෙස වසර විස්සකට වඩා වැඩකරන අයට, උසස් අධ්‍යාපන සුදුසුකම් නොසලකා ස්ථිර පත්වීම් ලබාදීමට අවශ්‍ය පියවර ගත යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.184/'16

155.

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— දහම් පාසල් අධ්‍යාපනය අනිවාර්ය කිරීම,— ශිෂ්ඨ සම්පන්න සමාජයකට නොගැලපෙන අයුරින් රට තුළ ව්‍යාප්ත වන අපචාර හා බාල අපරාධ මර්ධනය කිරීම හා ස්වයං විනයක් ඇති කිරීම උදෙසා සියලුම දරුවන්ට, 9 ශ්‍රේණිය දක්වා ඔවුන්ගේ ආගමට අනුකූල දහම් පාසල් අධ්‍යාපනය අනිවාර්ය කිරීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

---

## 2016 අගෝස්තු මස 23 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

493/'16

1.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 වර්ෂය තුළදී මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් ලියාපදිංචි කර ඇති, ආනයන සහ අපනයන දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද බලපත්‍ර මත ගෙන්වන ලද, කාලසීමාව ඉක්මවූ (overage) වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහන ලියාපදිංචි කර ඇති පුද්ගලයින්ගේ නම්, ලිපිනයන් සහ ලියාපදිංචි කළ අංකයන් වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

514/'16

2\.

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ බරවා රෝගය සීඝ්‍රයෙන් පැතිර යන බවත්;

(ii) දැනට මෙම රෝගයට සැලකිය යුතු පිරිසක් ගොදුරු වී ඇති බවත්;

(iii) රෝග මර්දනයට රජයේ දායකත්වය ප්‍රමාණවත් නොවන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) පසුගිය වසර පහක කාලය තුළ ශ්‍රී ලංකාව තුළ වාර්තා වී ඇති බරවා රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත (i) හි සඳහන් රෝගීන් සංඛ්‍යාව, එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

596/'16

3\.

ගරු ලකී ජයවර්ධන මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පාසල් දහසක් සඳහා තාක්ෂණික විද්‍යාගාර ලබාදීමේ වැඩපිළිවෙළ යටතේ මේ වනවිට විවෘත කර ඇති තාක්ෂණික විද්‍යාගාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම විද්‍යාගාර සඳහා පරිගණක හා උපාංග මිලදී ගැනීමට වැයකර ඇති මුළු මුදල කොපමණද;

(iii) එම මිලදී ගැනීම් සිදුකර ඇත්තේ ක්‍රමවත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් යටතේද;

(iv) එසේ නම්, ඒවා අනුමත කර ඇත්තේ කවුරුන් විසින්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මෙම මිලදී ගැනීම් සිදු කිරීමේදී නියමිත ප්‍රමිතියෙන් තොර උපකරණ මිලදී ගෙන ඇති බවත්, මූල්‍ය අක්‍රමිකතාවන් සිදුවී ඇති බවත් පිළිගන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා වගකිව යුතු පුද්ගලයින් කවුරුන්ද;

(iii) එමඟින් රජයට සිදුවී ඇති අලාභය කොපමණද;

(iv) මේ සඳහා වගකිවයුතු පුද්ගලයින් සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් කඩිනමින් සිදු කරන්නේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

612/'16

4.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) CSN නාලිකාව පවත්වාගෙන යන ගොඩනැගිල්ල පිහිටි අංක 236/01, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල ලිපිනයේ ඇති ඉඩම,

(i) රජයට අයත්ව තිබූ ඉඩමක්ද;

(ii) එය බදු දුන් දිනය කවරේද;

(iii) බදු දී ඇත්තේ කවර පාර්ශ්වයකටද;

(iv) බදු කාලය සහ බදු මුදල කොපමණද;

(v) බදු දීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබාගෙන තිබේද;

(vi) එසේ නම්, එම දිනය කවරේද;

(vii) එම බදු ගිවිසුම සභාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ඉඩමේ පෞද්ගලික රූපවාහිනී හා ගුවන් විදුලි නාලිකා සහිත වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යාමට බදු කොන්දේසිවලින් ඉඩ සලසා තිබේද;

(ii) බදු කොන්දේසි කඩකර තිබේනම්, අදාළ පාර්ශ්වයන්ට එරෙහිව ගනු ලබන නීතිමය ක්‍රියාමාර්ග කවරේද;

(iii) බදු ගත් පාර්ශ්වය පදනමක් හෝ සංවිධානයක් නම්, එහි සාමාජිකයන් හෝ අධ්‍යක්ෂ මණ්ඩලය කවුරුන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

652/'16

5.

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා මැරයින් සර්විසස් සමාගමේ (LMSL) වත්කම් අක්‍රමික ලෙස විකිණීම පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ අංක SEFR209/2007 නඩු තීන්දුව අනුව, එම වංචනික ගනුදෙනුවට සම්බන්ධ පුද්ගලයින්ට එරෙහිව අපරාධ නඩු පැවරීම කළයුතු බව එම නඩු තීන්දුවෙන් ප්‍රකාශයට පත් කර තිබූ බවත්;

(ii) එම නඩු තීන්දුවෙන් වසර 10ක් ගතවී ඇතත්, නඩු පැවරීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මෙතෙක් ක්‍රියාකර නොමැති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එම පුද්ගලයින්ට එරෙහිව අපරාධ නඩු පැවරීම ප්‍රමාද වීමට හේතු කවරේද;

(ii) එම පුද්ගලයින්ට එරෙහිව අපරාධ නඩු පැවරීම කඩිනම් කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

654/'16

6.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 දෙසැම්බර් 31 දිනට සහ 2016 මැයි 31 දිනට ශ්‍රී ලංකාණ්ඩුවේ විදේශ ණය ප්‍රමාණය ඇමරිකානු ඩොලර් සහ රුපියල් වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2014 දෙසැම්බර් 31 දින සිට 2016 මැයි 31 දිනට ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව, ශ්‍රී ලංකා රුපියල පිරිහී ඇති ප්‍රමාණය කොපමණද;

(iii) රුපියලේ විනිමය අනුපාතය පිරිහීම හේතුවෙන් ශ්‍රී ලංකාණ්ඩුවේ විදේශ ණය ප්‍රමාණය ඉහළ ගොස් ඇති ප්‍රමාණය රුපියල්වලින් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

659/'16

7.

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුස්ලිම් විවාහ හා දික්කසාද පනත යටතේ 4 වන වගන්තිය ප්‍රකාර, උපදේශක සභාවක් පත්කර තිබේද;

(ii) එසේ නම්, එම සභාව පත් කළ දිනය කවරේද;

(iii) එම උපදේශක සභාවේ සාමාජිකයින්ගේ නම්, ඔවුන්ගේ අධ්‍යාපන හා වෘත්තීයමය සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, මුස්ලිම් විවාහ හා දික්කසාද පනතේ ඇතැම් කරුණු ක්‍රියාත්මක කිරීමට බාධාවක්ව පවතින, එකී උපදේශක සභාව නොපමාව පත්කිරීම සඳහා එතුමා පියවර ගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

666/'16

8.

ගරු බිමල් රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජය මඟින් ප්‍රකාශ කර ඇති පරිදි අග්‍රාමාත්‍යවරයාගේ චීන සංචාරයේ දී එකඟ වූ බවට සඳහන් කරන "පෝර්ට් සිටි" (Port City) ව්‍යාපෘතිය ආශ්‍රිත විශේෂ චීන කර්මාන්ත කලාපය පිළිබඳ චීන රජය සමඟ එළැඹී ඇති ගිවිසුමක් හෝ එකඟතා ලියවිල්ලක් තිබේද;

(ii) එසේ නම්, එම ලියවිල්ල සභාගත කරන්නේද;

(iii) එම විශේෂ චීන කර්මාන්ත කලාපය පිහිටුවීමේ මූලික කොන්දේසි හා කළමනාකරණය සිදු වන ආකාරය පිළිබඳව පැහැදිලි කරන්නේද;

(iv) එම කර්මාන්ත කලාපය සඳහා හඳුනාගෙන ඇති භූමියේ සිතියමක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

678/'16

9.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය ආරක්ෂක සේවයට අයත් යුද හමුදාව, ගුවන් හමුදාව, නාවික හමුදාව, පොලීසිය සහ සිවිල් ආරක්ෂක බලකායන්හි ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී වෛද්‍ය හේතූන් මත ආබාධිත රණවිරුවන් ලෙස විශ්‍රාම ගැන්වූ වයස අවුරුදු 55ට වැඩි රණවිරු සාමාජික සාමාජිකාවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එකී නිලධාරීන් සඳහා ගෙවනු ලබන දීමනා සහ එක් එක් දීමනාවේ වටිනාකම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අ(i) හි සඳහන් නිලධාරීන් සඳහා ආබාධිත රණවිරුවන් සඳහා ගෙවනු ලබන දුබලතා විශ්‍රාම වැටුප ගෙවන්නේද;

(ii) වයස අවුරුදු 55 සම්පූර්ණවීමෙන් පසු දුබලතා විශ්‍රාම වැටුප නවතා සාමාන්‍ය රජයේ සේවකයෙකු ලෙස සලකා ලබාදෙන දීමනාව කොපමණද;

(iii) පූර්ණ ආබාධිත තත්ත්වයේ පසුවන අයෙකු සඳහා ඉහත (ii) හි එලෙස ලබාදෙන දීමනාව සාධාරණද;

(iv) වයස අවුරුදු 55 සම්පූර්ණ වීමට ප්‍රථම ආබාධිත රණවිරුවකු මියගියහොත්, ඔහුගේ යැපෙන්නන් සඳහා දීමනාවක් ලබා දෙන්නේද;

(v) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

731/'16

10.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා,— වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2015.01.09 දිනට,

(i) ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මුළු සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් වරාය අනුව ස්ථිර සේවක සංඛ්‍යාව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එක් එක් වරාය අනුව අනියම් සේවක සංඛ්‍යාව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2016.05.10 දිනට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මුළු සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) 2016.05.10 දින වනවිට අධිකාරියට අලුතින් බඳවා ගෙන ඇති සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(iii) එම සේවකයින් බඳවාගත් ආකාරය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

515/'16

11.

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය හා සම්බන්ධ ඇතැම් වෘත්තීන්හි යෙදෙන්නන් අතර HIV හෝ වෙනත් සමාජ රෝග පැතිර ඇති බවත්;

(ii) මෙය සංචාරක කර්මාන්තයට සෘජුවම බලපාන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) උක්ත පිරිස අතර HIV ආසාදිතයන් සිටී ද යන්න පිළිබඳ සමීක්ෂණයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

(iii) අ(i) හි සඳහන් පිරිස අතර HIV ව්‍යාප්තිය වැළැක්වීම සඳහා රජය පියවර ගෙන තිබේද;

(iv) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

601/'16

12.

ගරු ලකී ජයවර්ධන මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් උඩුනුවර මැතිවරණ කොට්ඨාසයේ, ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීම සඳහා බිම් සවිය වැඩසටහන ක්‍රියාත්මක කර තිබෙන බව දන්නේද;

(ii) බිම් සවිය මඟින් උඩුනුවර කොට්ඨාසයේ ලියාපදිංචි කිරීමට ඇස්තමේන්තු කර ඇති මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) මේ වනවිට ලියාපදිංචි කර ඇති ඉඩම් ප්‍රමාණය සහ ලියාපදිංචිය අවසන් කර නොමැති ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මෙම කොට්ඨාසයේ ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීමේ කටයුතු කඩිනමින් අවසන් කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

646/'16

13.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සේවක අර්ථසාධක අරමුදල්, කිසියම් ගුවන් සමාගමක ආයෝජනය කර තිබේද;

(ii) එසේ නම්, එම ගුවන් සමාගම, ආයෝජනය කරන ලද මුදල, සහ ආයෝජනය කරන ලද දිනය කවරේද;

(iii) ඒ සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ, මුදල් මණ්ඩලයේ අනුමතිය ලැබී තිබේද;

(iv) 2015.12.31 දිනට එම ආයෝජනය මඟින් සේවක අර්ථසාධක අරමුදලට ලැබුනු ප්‍රතිලාභ කවරේද;

(v) කිසියම් ප්‍රතිලාභයක් නොලැබුනි නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

668/'16

14.

ගරු බිමල් රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජය මඟින් ප්‍රකාශ කර ඇති පරිදි අග්‍රාමාත්‍යවරයාගේ චීන සංචාරයේ දී එකඟ වූ බවට සඳහන් කරන හම්බන්තොට වරාය ආශ්‍රිත විශේෂ චීන කර්මාන්ත කලාපය පිළිබඳ චීන රජය සමඟ එළැඹී ඇති ගිවිසුමක් හෝ එකඟතා ලියවිල්ලක් තිබේද;

(ii) එසේ නම්, එම ලියවිල්ල සභාගත කරන්නේද;

(iii) එම විශේෂ චීන කර්මාන්ත කලාපය පිහිටුවීමේ මූලික කොන්දේසි හා කළමනාකරණය සිදු වන ආකාරය පැහැදිලි කරන්නේද;

(iv) එම කර්මාන්ත කලාපය සඳහා හඳුනාගෙන ඇති භූමියේ සිතියමක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

712/'16

15.

ගරු වාසුදේව නානායක්කාර මහතා,— රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අද දිනයේ විශ්‍රාම යන රජයේ සේවකයන්ගේ විශ්‍රාම වැටුප් ගණනය කිරීමේදී රු.10,000/- දීමනාව වැටුපට එකතු කර ගණනය කිරීමට අවශ්‍ය විධිවිධාන සලස්වන බවට රජය පසුගිය අයවැය අවස්ථාවේදී කළ ප්‍රකාශය පරිදි ඊට අවශ්‍ය විධිවිධාන වර්තමානයේ ක්‍රියාත්මක නොකිරීමට හේතුව කවරේද;

(ii) එකී පොරොන්දුව ක්‍රියාත්මක කරන්නේ කවර දිනයක සිටද;

(iii) එය තවත් එක් පොරොන්දු කඩකිරීමක් බවට පත්කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2016 අගෝස්තු මස 24 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

440/'16

1.

ගරු ඩී. වී. චානක මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් නිවාස සංවර්ධන වැඩසටහන යටතේ රුපියල් 250,000/=ක වටිනාකමින් යුත් නිවාස වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලැබුවේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම වැඩසටහන ක්‍රියාත්මක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ඉඩම් පිහිටි ස්ථාන කවරේද;

(ii) එම ඉඩම් ලබාදීමේදී දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුව මඟින් අදාළ ඉඩම් කැබලි හඳුනාගැනීම සිදුකර තිබේද;

(iii) එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව තෝරාගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම ප්‍රතිලාභීන්ගේ නම්, ලිපිනයන් සහ තෝරාගත් ක්‍රමවේදය කවරේද;

(v) ප්‍රතිලාභීන් තෝරාගැනීමට සහභාගි වූ රාජ්‍ය නිලධාරීන්ගේ නම් කවරේද;

(vi) තෝරාගත් ප්‍රතිලාභීන් ඉඩම් හිමිකමක් ලැබීමට නියම සුදුස්සන් බවට සෑහීමට පත්විය හැකිද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

446/'16

2.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ, මහනුවර දිස්ත්‍රික්කයේ, නාවලපිටිය අඩවියේ, සමනලගම ප්‍රදේශයේ පයිනස් ගස් 7000ක් කපා ඉවත් කරමින් සිටින බවත්;

(ii) නාවලපිටිය, මාපාකන්ද අක්කර 200කට සහ දොලොස්බාගේ, මල්ගොල්ල අක්කර 50කට අයත් පයිනස් ගස් පුද්ගලික වෙළෙඳුන් මඟින් කපා ඉවත් කිරීම සඳහා කටයුතු සූදානම් කර ඇති බවත්;

(iii) දොලොස්බාගේ, පරගල කොටසේ ගස් 2500ක් පමණක් ඉවත් කිරීමට අවසර ලබාගෙන ඇතත්, මේ වනවිට අනවසරයෙන් ගස් 12,000ක් පමණ කපා ඉවත් කොට ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් සියළුම ගස් ඉවත් කිරීම සඳහා අවසර ලබාදීමේදී අනුගමනය කරන ලද ක්‍රමවේදයන් සහ ඒවාට සම්බන්ධ නිලධාරීන්ගේ නම් කවරේද;

(ii) එමඟින් රජයට අයවිය යුතු විශාල මුදලක් අහිමි වී ඇති බව පිළිගන්නේද;

(iii) එම වංචා සහගත ක්‍රියාවලට සම්බන්ධ නිලධාරීන්ට එරෙහිව ගනු ලබන නීතිමය පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

504/'16

3.

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) Lanka Marine Services Ltd. (LMSL) සමාගමේ වත්කම් අක්‍රමික ලෙස විකිණීම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ අංක SEFR209/2007 යටතේ ගොනුකර ඇති පෙත්සමට අදාළව ලබාදී ඇති නඩු තීන්දුවෙන් මතුකරනු ලැබූ කරුණු ගැන විමර්ශනයක් ආරම්භ කරන ලෙසට 2007.07.21 දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත නියෝගකර තිබෙන බවත්;

(ii) එම විමර්ශන කටයුතු සිදුකර එහි උද්ධෘත නීති උපදෙස් සඳහා 2008.12.08 දින නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇතත්, මෙතෙක් ඊට අදාළ උපදෙස් ලැබී නොමැති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එම උපදෙස් ලබාගැනීමට පියවර ගන්නේද;

(ii) එම තොරතුරු කවරේද යන්න මෙම සභාවට දැනුම් දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

516/'16

4.

ගරු බුද්ධික පතිරණ මහතා,— සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වෙරළාශ්‍රිත සංචාරක මගපෙන්වන්නන් කොපමණ සිටීද යන්න පිළිබඳ සංගණනයක් කර තිබේද;

(ii) එසේ නම්, වෙරළාශ්‍රිත සංචාරක මගපෙන්වන්නන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක්ත මගපෙන්වන්නන් ලියාපදිංචි කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) මෙම මගපෙන්වන්නන් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට මැදිහත් වන්නේද;

(iv) එසේ නම්, ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන රජය ලබා දෙන්නේද;

(v) වෙරළාශ්‍රිත සංචාරක මගපෙන්වන්නන්ගේ සුබසාධනය වෙනුවෙන් ගන්නා වෙනත් ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

560/’16

5.

ගරු එස්. ශ්‍රීතරන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වට්ටක්කච්චි ප්‍රදේශයේ රජයේ කෘෂිකාර්මික ගොවිපළක් සහ කෘෂිකාර්මික විද්‍යාලයක් පිහිටා ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම ගොවිපළෙහි විශාලත්වය කොපමණද; ගොඩ ඉඩම් හා මඩ ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් අක්කර කොපමණද;

(iii) මේ වනවිට එම ගොවිපළ පාලනය කරන්නේ කවුරුන් විසින්ද; එය පරිහරණය කරන්නේ කවුරුන්ද;

(iv) අදාළ දෙපාර්තමේන්තුව යටතට එම ගොවිපොළ පවරා දෙන්නේද;

(v) නැවතත් එහි කම්කරුවන්ට රැකියා අවස්ථා ලබාදී එය ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වට්ටක්කච්චි කෘෂිකාර්මික ගොවිපොළ සමඟ ඇති කෘෂිකාර්මික විද්‍යාලය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්නේද;

(ii) වවුනියාව සහ කුණ්ඩසාලේ ඇති කෘෂි විද්‍යාලවලට සමාන අයුරින් මෙය ක්‍රියාත්මක වූ බව එතුමා දන්නේද;

(iii) යළිත් ඒ ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගන්නේද;

(iv) එය අදාළ දෙපාර්තමේන්තුවට පවරා දී ක්‍රියාත්මක කිරීම සඳහා ගතවන කාලය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

602/’16

6.

ගරු ලකී ජයවර්ධන මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පෞද්ගලික වෛද්‍ය ආයතන නියාමනය කිරීම සඳහා පාර්ලිමේන්තුව මඟින් පනතක් සම්මත කර තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) එම පනතට අනුව පෞද්ගලික වෛද්‍ය ආයතන නියාමනය කිරීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කරන්නේද;

(iv) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අ(i) හි සඳහන් පනතට අනුව පෞද්ගලික වෛද්‍ය ආයතන, පෞද්ගලික රෝහල් ලියාපදිංචිය, ඖෂධ හා වෛද්‍ය රසායනාගාර නියාමනය සහ වෛද්‍යවරුන්ගේ සුදුසුකම් ප්‍රදර්ශනය කිරීම ආදී කටයුතු වර්තමානයේදී නිසි ලෙස සිදු නොවන බව පිළිගන්නේද;

(ii) එම පනතේ නියමයන් නිසි ලෙස ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

606/'16

7\.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2015 ජනවාරි සිට දෙසැම්බර් දක්වා,

(i) රජයේ මන්ත්‍රීවරුන් සහ අමාත්‍යවරුන් සහභාගි වී ඇති විදේශ සංචාර සංඛ්‍යාව කොපමණද;

(ii) අග්‍රාමාත්‍යවරයාද ඇතුළත්ව එම සංචාර සඳහා සහභාගි වී ඇති මන්ත්‍රීවරුන් සහ අමාත්‍යවරුන් කවුරුන්ද;

(iii) සංචාරය කරන ලද රටවල් කවරේද;

(iv) එම විදේශ සංචාරවලින් රාජකාරි හා පෞද්ගලික සංචාර වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අ (i) හි සඳහන් සංචාරයන් සඳහා රජයේ නිලධාරින් සහභාගි වී තිබේද;

(ii) එසේ නම්, එම නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(iii) උක්ත කාලසීමාව තුළ රජයේ මන්ත්‍රීවරුන් සහ අමාත්‍යවරුන් සහභාගි වී ඇති විදේශ සංචාරවලට වැය වී ඇති මුළු මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

617/'16

8\.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා,— බුද්ධශාසන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මන්නාරම දිස්ත්‍රික්කයේ පිහිටි තිරුක්කේදීස්වර කෝවිල හින්දු ජනතාවගේ ශුද්ධ වූ පූජනීය ස්ථානයක් බවත්;

(ii) තිරුක්කේදීස්වර කෝවිලට ඉතා ආසන්නව පිහිටි කනපතිපිල්ලෙ විජයකුමාර් මහතාට අයත් ඉඩමෙහි නීතිවිරෝධී ලෙස බෞද්ධ විහාරයක් ඉදිකරමින් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) නීතිවිරෝධීව ඉදිකරන මෙම විහාරයේ ඉදිකිරීම් කටයුතු නවතා දැමීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

647/'16

9.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යොවුන් පුරය 2016 උත්සවය පැවැත්වීමේ අරමුණු කවරේද;

(ii) එහි ප්‍රචාරණ කටයුතු සඳහා දරන ලද වියදම් කොපමණද;

(iii) එක් එක් ප්‍රචාරණ ආයතනයට ගෙවූ මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) යොවුන් පුරය 2016 සඳහා වියදම් කළ මුළු මුදල එක් එක් ශීර්ෂය යටතේ වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) මෙම උත්සවය පැවැත්වීමෙන් රජය අපේක්‍ෂා කළ අරමුණු ඉටු වී යැයි සෑහීමකට පත්වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

669/'16

10.

ගරු බිමල් රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමල වරාය ආශ්‍රිතව ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය තුළ විශේෂ ඉන්දීය ආර්ථික හෝ කර්මාන්ත කලාපයක් සඳහා රජය අවසර දී තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා අනුමතිය ලබා දුන් කැබිනට් පත්‍රිකාව හෝ නිරීක්ෂණ සහිත ලියවිලි ඉදිරිපත් කරන්නේද;

(iii) එම විශේෂ ඉන්දීය ආර්ථික කලාපය පිහිටුවීමේ මූලික කොන්දේසි හා කළමනාකරණය සිදු වන ආකාරය පැහැදිලි කරන්නේද;

(iv) එම විශේෂ ඉන්දීය ආර්ථික කලාපය සඳහා හඳුනාගෙන ඇති භූමියේ සිතියමක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

717/'16

11.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව නගර සභා බලප්‍රදේශයේ, පිළියන්දල දම්පෙ ගමෙහි අක්කර 79, රූඩ් 03, පර්චස් 21.74ක විශාලත්වයෙන් යුත් 'දම්පෙ වත්ත' නමැති පොල් ඉඩම කැබලි කිරීම සඳහා තේ, රබර් හා පොල් වතු පාලනය කිරීමේ හා කැබලි කිරීමේ පාලන මණ්ඩලය වෙත අයදුම්පත් ඉදිරිපත් කරඇති බවත්;

(ii) එකී ඉඩම් කැබලි කරන්නේ නම්, පොල් වගාවට මහත් හානියක් සිදුවන බවත්, රටේ පොල් පලදාවට බලපෑමක් සිදුවන බවත්, එබැවින් අදාළ ඉඩම කැබලි කිරීමට නිර්දේශ නොකරන බව සඳහන් කොට ප්‍රාදේශීය කළමනාකරු, පොල් වගා කිරීමේ මණ්ඩලය, කළුතර ප්‍රාදේශීය කාර්යාලය විසින් සභාපති, පොල් වගා කිරීමේ මණ්ඩලය වෙත දන්වා ඇති බවත්;

(iii) ආර්ථිකයට හා පරිසරයට සිදුවන හානිය පිළිබඳව අවධානය යොමු කර ඉඩම කැබලි කිරීමට එරෙහිව මහජන විරෝධතාවක්ද ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම වාර්තා නොසලකා ඉඩම කැබලි කිරීම නිර්දේශ කිරීමට පියවර ගන්නේද;

(ii) නොඑසේ නම්, ඒ පිළිබඳව ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

520/'16

12.

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාව තුළ ලිංගික පරිවර්තනයන් සිදු කර ගැනීමේ ප්‍රවණතාවයක් තිබේද;

(ii) එමඟින් ගැටලුකාරී තත්ත්වයන් මතු වන්නේද;

(iii) මේ සම්බන්ධයෙන් රජය ප්‍රමාණවත් අවධානයක් යොමු කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පසුගිය වසර පහ ඇතුළත ලිංගික පරිවර්තනයන් සිදු කර ගත් පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) රජයේ රෝහල් තුළ මෙම ක්‍රියාවලියට අදාළ සැත්කම් සිදු කරන්නේද;

(iii) එසේ නම්, පසුගිය වසර පහ තුළ රජයේ රෝහල් තුළ සිදු වූ ලිංගික පරිවර්තනයන්ට අදාළ සැත්කම් සංඛ්‍යාව කොපමණද;

(iv) ඒ සඳහා රජය දරා ඇති වියදම කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ලිංගික පරිවර්තනයක් සිදු කර ගත් පුද්ගලයන්ගේ අනන්‍යතාවයට අදාළ ජාතික හැඳුනුම්පත හා උප්පැන්න සහතිකය වෙනස් කිරීම් සිදු කරන්නේද;

(ii) එසේ නම්, එම ක්‍රියාවලිය සිදු කරන්නේ කෙසේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) ලිංගික පරිවර්තනයක් සිදු කර ගත් පුද්ගලයන් අතර HIV ආසාදිතයන් වාර්තා වී තිබේද;

(ii) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

(iii) HIV ඇතුළු සමාජ රෝගයන් මෙම පිරිස් අතර ව්‍යාප්ත වීම පාලනයට ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

604/'16

13.

ගරු ලකී ජයවර්ධන මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 1980 අංක 27 දරන ඖෂධ, උපකරණ හා විලවුන් නියාමනය කිරීමේ පනත යටතේ ශ්‍රී ලංකාවට විලවුන් ආනයනය කිරීමේදී ඒ සඳහා ඖෂධ, උපකරණ හා විලවුන් අධිකාරියේ අනුමතිය ලබා ගත යුතු බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) නමුත්, 2015 දී ස්ථාපිත කරන ලද ඖෂධ නියාමන අධිකාරි පනතින් විලවුන් විෂයය ඉවත් කිරීම මඟින් ශරීරයට අහිතකර විලවුන් වර්ග ආනයනය කිරීමට අවස්ථාව හිමි වී ඇති බවත්;

(ii) ශරීරයට අහිතකර එම විලවුන් භාවිතා කරන්නන් විවිධ ආසාත්මිකතාවයන්ට ලක්වී මරණයට සහ රෝගී තත්ත්වයට පත් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) මෙවැනි සිදුවීම් අවම කිරීම සඳහා, විලවුන් ආනයනය කිරීම නියාමනය කිරීමට විධිමත් ක්‍රමවේදයක් කඩිනමින් සකස් කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

670/'16

14.

ගරු බිමල් රත්නායක මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉන්දීය රජය හා ශ්‍රී ලංකා රජය අතර සාම්පූර් බලාගාරය ඉදිකිරීම සඳහා කවර හෝ ගිවිසුමක්, එකඟතා ලියවිල්ලක් අත්සන් කර තිබේද;

(ii) එසේ නම්, එම ලියවිල්ල සභාගත කරන්නේද;

(iii) ඒ සඳහා ලබා දුන් කැබිනට් අනුමතිය හෝ නීතිපති දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ සහිත ලියවිලි ඉදිරිපත් කරන්නේද;

(iv) සාම්පූර් බලාගාරය නඩත්තුව සඳහා ඉන්දු-ලංකා ඒකාබද්ධ සමාගමක් ස්ථාපිත කර තිබේද;

(v) එසේ නම්, එම සමාගමේ වත්කම් හා කළමනාකාරීත්වයට අදාළ එකඟතා හා කොන්දේසි කවරේද;

(vi) සාම්පූර් බලාගාරය සඳහා වෙන් කර ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(vii) එම ඉඩමේ සිතියමක් (Plan) සභාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

706/'16

15.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2015 ජනවාරි 08 වැනි දින සිට මේ දක්වා අධිකරණ අමාත්‍යවරයා සහ බුද්ධශාසන අමාත්‍යවරයා වශයෙන් සිදුකළ විදේශ සංචාර සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම එක් එක් සංචාරය,

(i) සිදුකළ කාලවකවානුව;

(ii) අරමුණු;

(iii) වියදම් කළ මුදල;

(iv) රටට ලැබුණු ප්‍රතිලාභ;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2016 අගෝස්තු මස 25 වැනි බ්‍රහස්පතින්දා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

142/'15

1.

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2014 මුදල් වර්ෂය තුළ අලාභ ලැබූ රාජ්‍ය ආයතන කවරේද;

(ii) එම ආයතනයන්හි අලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත (i) හි සඳහන් ආයතනයන්ගෙන් වෙනත් රාජ්‍ය ආයතනයන්ට ගෙවීමට ඇති මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අලාභ පියවීම සඳහා උක්ත ආයතනයන්ට මහා භාණ්ඩාගාරය මඟින් නිකුත් කළ මුදල් ප්‍රමාණය, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) උක්ත අලාභයන්ට හේතු පිළිබඳ සොයා බැලීමක් කර තිබේද;

(iii) එසේ නම්, එම හේතු එක් එක් ආයතනයට, වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) උක්ත ආයතන ලාභදායී ආයතන බවට පත්කිරීමට පියවර ගන්නේද;

(v) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

558/'16

2.

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කොළඹ මහ නගර සභාව මඟින් වසර ගණනාවක් මුළුල්ලේ කොළඹ නගරයේ කැළි කසළ මීතොටමුල්ල ප්‍රදේශයට බැහැර කරන බවත්;

(ii) අක්කර 02ක ප්‍රදේශයකට පමණක් කැළි කසළ බැහැර කිරීම සඳහා අවසර දී ඇතත්, අක්කර 12 ක පමණ ප්‍රදේශයකට කැළි කසළ බැහැර කර ඇති බවත්;

(iii) මෙම ගැටලුව හේතුවෙන් කොළොන්නාව ප්‍රදේශයේ ජනතාව අධ්‍යාපනික, සෞඛ්‍ය හා පාරිසරික වශයෙන් දැඩි ලෙස පීඩාවට පත් වී සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) දිනකට කොළඹ නගරයෙන් මීතොටමුල්ලට ගෙන එන කැළි කසළ ප්‍රමාණය කොපමණද;

(ii) කැළි කසළ බැහැර කිරීම සඳහා කොළඹ නගර සභාව, මීතොටමුල්ල වෙනුවට වෙනත් විකල්ප ස්ථානයක් තෝරා ගන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

(iv) කැළි කසළ වෙනත් ස්ථානයකට යොමු කිරීමට පියවර ගන්නේ නම්, ඉන් පසුව දැනට තිබෙන කැළි කසළ ඉවත් කිරීම සඳහා වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

594/'16

3\.

ගරු ලකී ජයවර්ධන මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2014 වර්ෂයේදී සතොස මඟින් ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද සහල් ප්‍රමාණය කොපමණද; ඒ සඳහා වැය වූ මුළු මුදල කොපමණද;

(ii) එම සහල් ප්‍රමාණයෙන් මේ වනවිට අළෙවි කර ඇති ප්‍රමාණය කොපමණද; එමඟින් සතොස ලබා ඇති ලාභය කොපමණද;

(iii) අළෙවි කිරීමට නොහැකි වූ සහල් ප්‍රමාණය කොපමණද; එමඟින් සතොසට සිදු වූ අලාභය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙවැනි අලාභයන් සිදුවන්නේ සහල් ආනයනයට පෙර දේශීය වෙළඳපොළ තත්ත්වය සැලකිල්ලට ගෙන කටයුතු නොකිරීම නිසා බව පිළිගන්නේද;

(ii) එසේ නම්, පාඩු ලබන ක්‍රියාවන් එළදායී අන්දමින් සිදු කිරීමට නිසි ක්‍රමවේදයක් සකස් කරන්නේද;

(iii) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද; එය ක්‍රියාවට නංවන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

608/'16

4\.

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) හමුදා සාමාජිකයින්ගේ දරුවන් සඳහා වූ පාසල්වලට, නිලධාරින් නොවන යුද හමුදා සාමාජිකයින්ගේ දරුවන් ඇතුළත් කර ගැනීම සම්බන්ධයෙන් පසුගිය රජය විසින් සකස් කරන ලද ප්‍රතිපත්ති කවරේදැයි එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

618/'16

5\.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා,— බුද්ධශාසන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ පිහිටි කෝකිලායි ප්‍රදේශයේ, තිරුඥානසම්බන්ධර් මනිවන්නදාසර් මහතාට අයත් ඉඩමක නීතිවිරෝධී ලෙස බෞද්ධ විහාරයක් ඉදිකරමින් පවතින බව දන්නේද;

(ii) ජනතා විරෝධය විශාල වශයෙන් පැන නැඟී ඇති අවස්ථාවක නීතිවිරෝධීව ඉදිවෙන මෙම විහාරයේ ඉදිකිරීම් කටයුතු වහාම නවතා දැමීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

639/'16

6\.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) නීතිවිරෝධීව ලබාගත් රාජ්‍ය වත්කම් අත්පත් කර ගැනීම පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකායේ සාමාජිකයින් කවුරුන්ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම බලකායේ ප්‍රධානියා කවුරුන්ද;

(ii) එය පිහිටුවීමේ අරමුණ කවරේද;

(iii) එහි සාමාජිකයින් හෝ සහායක නිලධාරින් සංචාරය කර ඇති විදේශීය රටවල් කවරේද;

(iv) සාමාජිකයින් හෝ සහායක නිලධාරින්ගේ විදේශ සංචාර සඳහා 2016 මාර්තු 31 වැනි දිනට වැය වූ මුළු මුදල කොපමණද;

(v) බලකායේ තීරණ මත 2016 මාර්තු 31 වැනි දිනට නැවත අත්පත් කරගෙන ඇති නීතිවිරෝධීව ලබා ගෙන තිබූ වත්කම්වල වටිනාකම කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

671/'16

7.

ගරු බිමල් රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2013, 2014 සහ 2015 වර්ෂයන්හිදී ශ්‍රී ලංකාවේ සිය දිවි නසා ගැනීම් සංඛ්‍යාව සහ සිය දිවි නසා ගැනීමට තැත් කිරීම් සංඛ්‍යාව, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2013, 2014 සහ 2015 වර්ෂයන්හිදී ශ්‍රී ලංකාවේ සිය දිවි නසා ගැනීම් සංඛ්‍යාව සහ සිය දිවි නසා ගැනීමට තැත් කිරීම් සංඛ්‍යාව;

(i) ස්ත්‍රී, පුරුෂභාවය අනුව;

(ii) වයස් කාණ්ඩ අනුව;

(iii) එක් එක් දිස්ත්‍රික්කය අනුව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2013, 2014 සහ 2015 වර්ෂයන්හිදී සිය දිවි නසා ගැනීම් හා සිය දිවි නසා ගැනීමට තැත් කිරීම් වැඩිම සංඛ්‍යාවක් වාර්තා වූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 25 කවරේද;

(ii) සිය දිවි නසා ගැනීම් හා සිය දිවි නසා ගැනීමට තැත් කිරීම් පිළිබඳ නිවැරැදි දත්ත හා තොරතුරු වාර්තා කරන රාජ්‍ය ආයතනය කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

707/'16

8.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රුසියාවේ, ශ්‍රී ලංකා තානාපතිවරයා ලෙස උදයංග වීරතුංග මහතා කටයුතු කළ කාලවකවානුව කවරේද;

(ii) ඔහුට එරෙහිව ඇති චෝදනා කවරේද;

(iii) එම චෝදනා සම්බන්ධයෙන් සිදුකර ඇති විමර්ශනවල ප්‍රගතිය කවරේද;

(iv) ඔහුට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම ප්‍රමාද වීමට හේතු කවරේද;

(v) ඔහුව අත්අඩංගුවට ගැනීම සඳහා ජාත්‍යන්තර පොලිසියේ සහාය ඉල්ලා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

725/’16

9\.

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, හන්දෙස්ස, මහ/අල්මනාර් ජාතික පාසලට අයත්, තෙමහල් ගොඩනැගිල්ල පිහිටා තිබෙන ස්ථානය පසුගියදා නාය යෑමට ලක්වූ බවත්;

(ii) ඒ සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් අංක ED/7/99/9/1/31 හා 2015.12.14 දිනැති ලිපිය මඟින් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ අධ්‍යක්ෂවරයා දැනුවත් කළද, මෙතෙක් කිසිදු පියවරක් ගෙන නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) අධික වර්ෂා සහිත කාලගුණ තත්ත්වයකදී, එකී පාසැල් ගොඩනැගිල්ල හා එහි අවට අවදානම් තත්ත්වයක පවතින හෙයින්, නාය යෑමට ලක් වූ පස් කන්දට ආසන්නව ආරක්ෂිත බැම්මක් ඉදිකිරීම සඳහා පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

521/’16

10\.

ගරු බුද්ධික පතිරණ මහතා,— අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1815 වර්ෂයේ සිට 1948 වර්ෂය දක්වා කාලය තුළ මෙරට පාලනය කළ බ්‍රිතාන්‍ය ජාතිකයන් විසින් නිදහස් සටනට උරදුන් ඇතැම් ශ්‍රී ලාංකේය නායකයින් රාජද්‍රෝහීන් ලෙස නම් කළ බවත්;

(ii) මේ වනතෙක් එම නායකයන්ගේ නම් එම ලැයිස්තුවෙන් ඉවත් නොකළ බවත්;

(iii) ඒ පිළිබඳව රජයේ අවධානය මෙතෙක් යොමු වී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) බ්‍රිතාන්‍යයන් රාජද්‍රෝහීන් ලෙස නම් කළ ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් කවරේද;

(iii) ඔවුන් රාජද්‍රෝහීන් ලෙස නම් කිරීමට දක්වා ඇති හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම නායකයන් රාජද්‍රෝහී ලැයිස්තුවෙන් ඉවත් කිරීමට අවශ්‍ය පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) මෙම නායකයින් ජාතික වීරයන් ලෙස නම් කිරීමට රජය කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

637/'16

11.

ගරු වාසුදේව නානායක්කාර මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 වර්ෂයේදී පසුගිය රජය විසින් ක්‍රියාත්මක කරන ලද "දොරින් දොරට - ගමින් ගමට" වැඩසටහන යටතේ රත්නපුර, කුරුවිට ප්‍රාදේශීය සභාව සමඟ කිරිඇල්ල, හාදූකන්ද සමෘද්ධි සමිතිය ගිවිසුමකට එළඹී ඇති බවත්, එම ගිවිසුම අනුව හාදූකන්ද, කුරුඳුකොටුව මාර්ගය කපා කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන් රුපියල් ලක්ෂ 3ක මුදලක් ගෙවන බවට ගිවිසුම් ගතවූ බවත්;

(ii) ගිවිසුම අනුව ඉහත කී මාර්ගයේ වැඩ අවසන්කර වර්ෂයක් ගතවී ඇතත්, මේ වනතෙක් ඉහත කී සමිතියට ගෙවා ඇත්තේ 20% මුදලක් (රු.58,000/-) පමණක් බවත්;

(iii) ඉතිරි මුදල් මේ වනතෙක් නොගෙවීමෙන් සමිතිය මහත් අපහසුතාවයකට පත් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) කොන්ත්‍රාත්තුවේ ඉතිරි මුදල ඉහත සමිතියට ලබාදීමට පියවර ගන්නේද;

(ii) මීට අමතරව, පහත දක්වා ඇති මාර්ගයන් කොන්ක්‍රීට් කිරීම සඳහා;

බදුවල මාර්ගයේ, ඉහළ කොටස - රු.500,000/-

හාදූකන්ද, පොල්ගහහේන මාර්ගය - රු. 300,000/-

හාදූකන්ද, ඉලුක්පිටිය මාර්ගය - රු. 300,000/-

හාදූකන්ද, තැකිල්ලවත්ත මාර්ගය - රු. 300,000/-

සමිතිය වෙත ගෙවීමට ඇති මුදල් ඉක්මනින් ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

655/'16

12.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 ජනවාරි 10 දින සිට 2016 අප්‍රේල් 30 දින දක්වා කාල පරිච්ඡේදය තුළ සිය රාජකාරි හෝ පෞද්ගලික ගමන් සඳහා ගුවන් හමුදාව සතු හෙලිකොප්ටර් හෝ ගුවන් යානා යොදා ගත් දේශපාලනඥයින්, රජයේ නිලධාරින් සහ වෙනත් පුද්ගලයින් වෙන් වෙන් වශයෙන් කවුරුන්ද;

(ii) එම ගුවන් ගමන් සඳහා එක් එක් පුද්ගලයාගෙන් අය කළ මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ගුවන් ගමන් සඳහා අය විය යුතු මුදලින් මෙතෙක් ගෙවා නැති මුදල කොපමණද;

(iv) එම හිඟ මුදල් අය කර ගැනීම සඳහා ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

672/'16

13\.

ගරු බිමල් රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනාධිපතිවරයා, අග්‍රාමාත්‍යවරයා, අමාත්‍යවරුන්, මන්ත්‍රීවරුන් සහ හිටපු ජනාධිපතිවරුන් සඳහා වෙන් කර ඇති කොළඹ නගරය තුළ පිහිටි මුළු නිල නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම නිල නිවාස දැනට භාවිත කරන පුද්ගලයින්ගේ නාමලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(iii) මෙම නිල නිවාස වෙන් කිරීම සඳහා අනුගමනය කරන රෙගුලාසි සඳහන් චක්‍රලේඛයක් හෝ ලේඛනයක් තිබේද;

(iv) එසේ නම්, එය සභාගත කරන්නේද;

(v) රෙගුලාසි ලේඛනයක් නොමැති නම්, නිවාස වෙන් කරනු ලබන පටිපාටිය කවරේද;

(vi) නිවාස වෙන් කරනු ලබන රෙගුලාසි හෝ පටිපාටියට අනුව සුදුසුකම් සපුරා නොමැතිව නිවාසවල රැඳී සිටින්නන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

708/'16

14\.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 මැයි සිට 2015 ජනවාරි දක්වා කාලසීමාව තුළ ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය මඟින් වෙළඳ දැන්වීම් ලබාදුන් ජනමාධ්‍ය ආයතන කවරේද;

(ii) එම එක් එක් ජනමාධ්‍ය ආයතනයට වෙළඳ දැන්වීම් ලබාදුන් දිනය, දැන්වීමේ වටිනාකම, එක් එක් ජනමාධ්‍ය ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

522/'16

15\.

ගරු බුද්ධික පතිරණ මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ බැස්ටියන් මාවතේ ඉදිකරන ලද පාවෙන වෙළඳ සංකීර්ණය මේ වනවිට ආසාර්ථක ව්‍යාපෘතියක් වී ඇති බවත්;

(ii) මේ හේතුවෙන් එහි ව්‍යාපාරිකයන් අපහසුතාවයට පත්වී ඇති බවත්;

(iii) මෙම ව්‍යාපෘතිය හරහා විශාල මුදල් නාස්තියක් සිදු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) බැස්ටියන් මාවතේ පාවෙන වෙළඳ සංකීර්ණය ඉදිකිරීමට වැය කළ මුදල කොපමණද;

(ii) ඒ සඳහා මුදල් සපයාගත් මූලාශ්‍ර කවරේද;

(iii) මෙම වෙළඳ සංකීර්ණය විවෘත කිරීමේ උත්සවය සඳහා වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2016 අගෝස්තු මස 26 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

158/’15

1.

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් වනාන්තර තුළ පයිනස් හා ඉයුකැලිප්ටස් වගා කර ඇති අක්කර ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම වගාව නිසා පරිසරයට ඇති වාසි හා අවාසි කවරේද;

(iii) පයිනස් හා ඉයුකැලිප්ටස් වගාව නිසා ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ඇති ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පයිනස් හා ඉයුකැලිප්ටස් වෙනුවට දේශීය ශාක වගා කිරීමට කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, එම ශාක වර්ග මොනවාද;

(iii) නොඑසේ නම්, ඉදිරියේදී දේශීය ශාක වගා කිරීමට පියවර ගන්නේද;

(iv) ඒ සඳහා සැලසුම් සකස් කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

459/’16

2.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2014 දී ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ඉදිකිරීම් ආරම්භ කරන ලද කොළඹ 06, කිරුළපන, මිහිඳුපුර මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය කවරේද;

(ii) එම නිවාස ව්‍යාපෘතිය අවසන් කරන ලද දිනය කවරේද;

(iii) ඉදිකිරීම් නිම කර ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) ඒ සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වැය කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිවාස ව්‍යාපෘතියේ ඉදිකිරීම් භාරව කටයුතු කළ දේශීය සමාගම, අක්කර 2ක් පමණ වූ එම රජයේ භූමි භාගය තම පෞද්ගලික බර වාහන ගාල්කිරීමට භාවිතා කරන බව දන්නේද;

(ii) මෙම ඉඩම පාවිච්චි කිරීම වෙනුවෙන් එම සමාගම රජයට ගෙවනු ලබන මාසික බදු කුලිය කොපමණද;

(iii) බදු කුලී නොගෙවා ඉඩම පරිහරණය කරන්නේ නම්, ඒ සම්බන්ධයෙන් ගන්නා පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

660/'16

3.

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පළාත් සභා යටතේ ක්‍රියාත්මක වන පාසල්වල ඇතැම් විදුහල්පතිවරු හා ගුරුවරු විසින් ශිෂ්‍ය ශිෂ්‍යාවන් නොයෙකුත් අසාධාරණකම්වලට හා ශාරීරික සහ මානසික වධ හිංසනවලට ලක් කරන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වනවිට එසේ මානසික හා ශාරීරික පීඩාවන්ට ලක් වූ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සංඛ්‍යාව, එක් එක් පළාත අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මානසික හා ශාරීරික පීඩාවන් වැළැක්වීමට සහ ඔවුන්ගේ විනයානුකූල හැසිරීම පිළිබඳව පළාත් ප්‍රධාන අමාත්‍යවරයා දැනුවත් කර ඔහු සමඟ සාකච්ඡා කර කිසියම් පියවරක් ගැනීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

673/'16

4.

ගරු බිමල් රත්නායක මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු හා නැගෙනහිර පළාත්වල රජය මඟින් සරණාගත කඳවුරු පවත්වාගෙන යන්නේද;

(ii) එසේ නම්, එම කඳවුරු පිහිටි ස්ථාන, ඒවායේ සිටින පුද්ගලයන් හා පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම කඳවුරුවල සිටින ජනතාව සඳහා වෙන්කර ඇති මුදල් ප්‍රමාණය එක් එක් කඳවුර අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එක් පුද්ගලයකුට හා එක් පවුලකට මසකට ලබාදෙන ආධාර වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම සරණාගත පුද්ගලයින් සතු ඉඩම් හෝ නිවාස, රජය හෝ පෞද්ගලික ආයතන හෝ වෙනත් පුද්ගලයන් විසින් භුක්ති විඳින්නේ නම්, එම තොරතුරු සහ එම ඉඩම්/නිවාස සතු සරණාගත පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම සරණාගතයින් අතරින් පදිංචිය සඳහා ඉඩමක් හෝ නිවසක් නොමැති පුද්ගලයින් සංඛ්‍යාව, එක් එක් කඳවුර අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

703/’16

5.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය සේවකයින් විශ්‍රාම ගන්නා වයස අවුරුදු 55ක්ව තිබියදී ක්‍රියාන්විතයේදී මියගිය රණවිරුවන්ගේ පවුල් සඳහා ලබාදෙන මාසික වැටුප මියගිය රණවිරුවාට වයස අවුරුදු 55 සම්පූර්ණ වනතෙක් ලබා දීමට ආණ්ඩුව විසින් තීරණය කර තිබූ බවත්;

(ii) රාජ්‍ය සේවකයින්ට වයස අවුරුදු 58 දක්වා ස්වයංක්‍රීයව ද, අවුරුදු 58 සිට 60 දක්වා පූර්ව අනුමතිය ලබා ගැනීමෙන්ද, විශ්‍රාම ගන්නා වයස අවුරුදු 60 දක්වා ඉහළ නංවා ඇති බවත්;

(iii) දිවි පිදූ රණවිරුවන්ගේ පවුල්වලට තවමත් මාසික වැටුප ලබා දෙන්නේ රණවිරුවාට වයස අවුරුදු 55 පිරෙන තෙක් පමණක් වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) දිවි පිදූ රණවිරුවන්ගේ පවුල්වලට රණවිරුවාගේ මාසික වැටුප ඔහුට වයස අවුරුදු 60 සම්පූර්ණ වනතෙක් ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) එකී සංශෝධනය සිදු කිරීමට අපේක්ෂා කරන්නේ කවර දිනයක සිටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

718/’16

6.

ගරු ඉෂාක් රහුමාන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි,

(i) පිහිටි එකම දෙමළ මාධ්‍ය ජාතික පාසල වන අ/ සාහිරා විද්‍යාලය නොසලකා හැරීම හේතුවෙන් විවිධ අඩුපාඩු සහිත වන බවත්;

(ii) “පාසල් 1000” වැඩසටහනට කාඩාණ්ඩුගම, ජායා මුස්ලිම් මහා විද්‍යාලය හා කහටගස්දිගිලිය මුස්ලිම් මහා විද්‍යාලය ඇතුළත් කර ඇති නමුත් තාක්ෂණ විද්‍යාගාර හැර වෙනත් කිසිදු පහසුකමක් මේ වනවිට ලබා දී නොමැති බවත්;

(iii) සිංහල සහ දෙමළ මාධ්‍ය පාසල්වල ගණිතය, විද්‍යාව, ඉංග්‍රීසි සහ තාක්ෂණවේදය වැනි විෂයයන් ඉගැන්වීම සඳහා ගුරු හිඟයක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත අ (i) හි සඳහන් පාසලෙහි,

(i) උසස් පෙළ විද්‍යා අංශයේ පවතින ගුරු හිඟය සපුරනු ලබන;

(ii) නව ගොඩනැගිල්ලක් ලබා දෙනු ලබන;

(iii) විදුහල්පතිවරයා සඳහා කාර්යාලයක් සහ ශ්‍රවණාගාරයක් ලබාදෙනු ලබන;

(iv) පානීය ජල පිරිපහදු යන්ත්‍රයක් ලබා දෙනු ලබන;

දිනය කවරේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත අ (ii) සඳහන් පාසල් සඳහා අවශ්‍ය අනෙකුත් පහසුකම් ලබාදෙනු ලබන;

(ii) ඉහත අ (iii) හි සඳහන් පුරප්පාඩු පුරවනු ලබන;

දිනය කවරේද යන්නත් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

722/'16

7\.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය මැයි මාසයේ ඇති වූ හදිසි ගංවතුර හේතුවෙන් හානියට පත්වූ වගාව සහිත කුඹුරු හෙක්ටයාර් ප්‍රමාණය කොපමණද;

(ii) මෙම හානියෙන් දළ වශයෙන් සිදුවී ඇති පාඩුව කොපමණද;

(iii) හානියට පත් කුඩා වැව් ඇතුළු වාරිමාර්ග සංඛ්‍යාව කොපමණද;

(iv) අලාභ හානි සිදුවූ වාරි ව්‍යාපෘති පිහිටි දිස්ත්‍රික්ක වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉදිරි කාලයේදී රටේ ආහාර සුරක්ෂිතතාවය සඳහා මෙම ගංවතුර හානිය බලපාන්නේද;

(ii) විපතට පත් ගොවි ජනතාව වෙනුවෙන් රජය සහන ලබා දීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

727/'16

8\.

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රට තුළදී එකලස් කරන ලද, එහෙත් ලියාපදිංචි කර නොමැති වාහන ලියාපදිංචි කිරීමට විශේෂ අවසරයක් 2016 අයවැය යෝජනා මඟින් ලබා දුන් බව පිළිගන්නේද;

(ii) 2016 මාර්තු 31ට පෙර ලියාපදිංචි කරන ලද වෙළඳ වාහන සංඛ්‍යාව සහ එම වාහන ලියාපදිංචි කර ඇති පුද්ගලයින්ගේ නම් කවරේද;

(iii) රුපියල් මිලියනයක් ගෙවීමෙන් ලියාපදිංචි කරන ලද මෝටර් රථ සංඛ්‍යාව සහ එම මෝටර් රථ ලියාපදිංචි කර ඇති පුද්ගලයින්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

383/'15

9\.

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දකුණු පළාත සඳහා අනුයුක්ත පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් සංඛ්‍යාව කොපමණද;

(ii) දැනට සේවය කරන නිලධාරිනියන් සංඛ්‍යාව කොපමණද;

(iii) අවසාන වරට පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් බඳවා ගත් දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පුහුණුව අවසන් කර මේ වනතෙක් බඳවා නොගත් පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් සිටීද;

(ii) එසේ නම්, එම නිලධාරිනියන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන් බඳවා ගැනීමට කටයුතු කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දකුණු පළාතේ, රජයට හා පළාත් සභාවට අයත් මහ රෝහල් තුළ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන්ගේ හිඟයක් පවතින බව දන්නේද;

(ii) එසේ නම්, එම පුරප්පාඩු පිරවීමට ගන්නා පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

674/'16

10.

ගරු බිමල් රත්නායක මහතා,— රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා රාජ්‍ය සංස්ථා සහ සමාගම්වල සභාපතිවරයන් සඳහා කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇති නිල නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් ආයතනයට අයත් නිල නිවාස වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මෙම නිල නිවාස දැනට භාවිතා කරන පුද්ගලයින්ගේ නාමලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(iv) මෙම නිල නිවාස වෙන් කිරීම සඳහා අනුගමනය කරන රෙගුලාසි සඳහන් චක්‍රලේඛයක් හෝ ලේඛනයක් තිබේද;

(v) එසේ නම්, එය සභාගත කරන්නේද;

(vi) රෙගුලාසි ලේඛනයක් නොමැති නම්, නිවාස වෙන් කරනු ලබන පටිපාටිය කවරේද;

(vii) නිවාස වෙන් කරනු ලබන රෙගුලාසි හෝ පටිපාටියට අනුව සුදුසුකම් සපුරා නොමැතිව නිවාසවල රැඳී සිටින්නන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

704/'16

11.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අප්‍රේල් මස සිට ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍යයන්හි පළකරන, ණය අර්බුදය පිළිබඳ ප්‍රචාරක දැන්වීම් සඳහා වැය කළ සම්පූර්ණ මුදල කොපමණද;

(ii) එකී ප්‍රචාරක දැන්වීම් පළ කරන ලද පුවත්පත්වල නම් සහ එක් එක් පුවත්පතේ දැන්වීම් පළ කිරීමට වැය වූ මුදල, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එකී දැන්වීම් විකාශනය කිරීම සඳහා රූපවාහිනී සහ ගුවන් විදුලි නාලිකාවන්ට ගෙවූ මුදල්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එකී දැන්වීම් සඳහා අරමුදල් සපයා ගත් ආකාරය කවරේද;

(v) එකී දැන්වීම් සඳහා අරමුදල් සපයා ගත්තේ රජයේ මුදල් භාවිතයෙන් නම්, ඒ සඳහා අරමුදල් සපයා ගත් වැය ශීර්ෂය කවරේද;

(vi) එකී දැන්වීම් සඳහා අරමුදල් සපයා ගත්තේ අර්ධ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතනවල අනුග්‍රහයෙන් නම්, එම ආයතනවල නම් සහ එක් එක් ආයතනයෙන් ලබා දුන් මුදල්, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

719/'16

12.

ගරු ඉෂාක් රහුමාන් මහතා,— නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ විශාල ගැටලුවක්ව පවතින පානීය ජල ප්‍රශ්නය විසඳීම සඳහා රජය මහා පරිමාණ පානීය ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කළද ඒවායින් ප්‍රමාණවත් ප්‍රයෝජනයක් නොලැබුනු බවත්;

(ii) මෙම දිස්ත්‍රික්කයේ 25,000කට අධික පිරිසක් වකුගඩු රෝගයෙන් පෙළෙන අතර ඒ අතරින් 11,000ක පිරිසක් මාරාන්තික තත්ත්වයෙන් තමන්ගේ ජීවිතය ගෙවන බවත්;

(iii) පානීය ජලයට කැඩ්මියම් වැනි රසායනික ද්‍රව්‍ය මිශ්‍ර වීම හේතුවෙන් මෙවැනි රෝග තත්ත්වයන් ඇතිවන බවත්;

(iv) වකුගඩු රෝගය වැළැක්වීමේ අරමුණින් මේ වනවිට සවිකර ඇති ජලය පිරිසිදු කරන යන්ත්‍ර ප්‍රමාණවත් නොවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) පානීය ජල ප්‍රශ්නය පවතින ප්‍රදේශවලට පානීය ජලය ලබාදීමට නව වැඩසටහන් ආරම්භ කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) රෝගීන් බහුල වශයෙන් ජීවත්වන ප්‍රදේශවලට ජලය පිරිසිදු කරන යන්ත්‍ර ලබාදෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

723/'16

13.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ දේශීය හා විදේශීය ණයබරතාවය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මුළු ණය බරතාවය ජාතික ආදායමේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iii) එම ප්‍රතිශතය 2004 වර්ෂය වනවිට තිබූ ණය බරතාවයේ ප්‍රතිශතයට වඩා අඩුද වැඩිද;

(iv) එම ණය ගෙවීමට රජය යෝජනා කරන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෑතක සිට එම ණයබරතාවය පිළිබඳව ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය මගින් මෙරට විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය හරහා දැන්වීම් ප්‍රචාරය කිරීම සඳහා කොපමණ මුදලක් වෙන්කර තිබේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම දැන්වීම ප්‍රචාරය කිරීම වෙනුවෙන් රාජ්‍ය හා පෞද්ගලික රූපවාහිනී මාධ්‍යයන්ට වෙන් කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) රාජ්‍ය හා පෞද්ගලික ගුවන් විදුලි මාධ්‍යයන්ට වෙන් කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) දිනපතා හා සති අන්ත පුවත්පත් සඳහා වෙන් කර ඇති මුළු මුදල කොපමණද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

728/'16

14.

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1995 සිට මේ දක්වා ශ්‍රී ලංකා රජය විසින් අය කරනු ලබන සෘජු බදු වර්ග කවරේද;

(ii) එකී එක් එක් බදු වර්ගය අය කිරීමේ පදනම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) 1995 සිට 2015 දක්වා සෘජු බදු මඟින් රාජ්‍ය අයභාරයට දක්වන ලද දායකත්වය (රුපියල්), එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත (iii) හි සඳහන් දායකත්වය රජයේ මුළු ආදායමෙහි සහ දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) සංවර්ධිත රටවල් සමඟ සැසඳීමේදී, ශ්‍රී ලංකාවේ සෘජු බදු ආදායම පහළ මට්ටමක පැවැතීමට හේතු කවරේද;

(vi) 2015 වර්ෂයේදී සාක් කලාපයේ රටවල්වලට සාපේක්ෂව, ශ්‍රී ලංකාවේ සෘජු බදු ආදායමෙහි හැසිරීම කෙබඳුද;

(vii) ශ්‍රී ලංකාවේ සෘජු බදු ආදායම ඉහළ නැංවීම සඳහා හඳුන්වාදීමට අපේක්ෂිත විශේෂ ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

775/'16

15.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිවිධ හමුදාවට අයත් පවුල් 1235 ක් පමණ ස්ථිරව පදිංචිව සිටින අනුරාධපුර දිස්ත්‍රික්කයේ, ඉපලෝගම, රණජයපුර ගම්මානයේ, ප්‍රාථමික සෞඛ්‍ය සංරක්ෂණ ඒකකයට රජයේ වෛද්‍ය නිලධාරියෙකු අනුයුක්ත කර නොමැති බවත්;

(ii) රජයේ වෛද්‍යවරයෙකු ස්ථිර ලෙස අනුයුක්ත කර නොමැතිවීම හේතුවෙන්, යුධ හමුදාව, නාවික හමුදාව හා ගුවන් හමුදාවට අයත් වෛද්‍ය නිලධාරීන් වරින් වර මෙම ඒකකයේ සේවය කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ගම්මානයේ ප්‍රාථමික සෞඛ්‍ය සංරක්ෂණ ඒකකයට ස්ථිර රජයේ වෛද්‍යවරයෙකු ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

*1.

අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකාව තුළ ශීඝ්‍රයෙන් වර්ධනය වන අපරාධ මැඩ පැවැත්වීම සහ නීතිය ක්‍රියාත්මක කිරීමේදී සිදුවන ප්‍රමාදයන් වළක්වා ගැනීම පිළිබඳව කරුණු විමර්ශනය කර වාර්තා කිරීම පිණිස වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

ශ්‍රී ලංකාව තුළ වැඩිවෙමින් පවතින අපරාධ මැඩ පැවැත්වීම සහ නීතිය ක්‍රියාත්මක කිරීමේදී සිදුවන ප්‍රමාදයන් වළක්වා ගැනීම මෙරට ජනතාවගේ ප්‍රමුඛ අවශ්‍යතාවයක් බවට පත්වී ඇති හෙයින්ද,

ඒ පිළිබඳව දැඩි අවධානයක් යොමුකර ප්‍රතිකර්ම යෙදීමේ වගකීම මෙම පාර්ලිමේන්තුව වෙත පැවරී ඇති හෙයින්ද,

පහත සඳහන් කාරණා පිළිබඳව කරුණු විමර්ශනයකර සුදුසු නිර්දේශයන් ඉදිරිපත් කිරීම පිණිස පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත්කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

(අ) පසුගිය වකවානුවේ සිදුවූ අපරාධවල ස්වභාවය, එසේ අපරාධ සිදුවීම සඳහා බලපා ඇති කරුණු කාරණා, අපරාධ සිදුවීම අවම කරගැනීම සඳහා අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග සහ අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සහ/හෝ සංශෝධනයන්;

(ආ) සිවිල් සහ අපරාධ නඩුවලදී සිදුවන ප්‍රමාදයන් වළක්වා ගැනීම පිණිස අනුගමනය කළ යුතු නිසි ක්‍රියා පිළිවෙත් සහ අලුතෙන් පැනවීමට අවශ්‍ය සහ/හෝ සංශෝධනයන්ට ලක්විය යුතු නීති රීති; සහ

(ඇ) ඉහත කරුණුවලට ආනුෂංගික වන්නා වූ සහ අවස්ථානුකූලව, සුදුසුයැයි හා අවශ්‍යයැයි කාරක සභාවට හැඟෙන සහ කාරක සභාව විසින් සලකා බලනු ලබන කරුණට බලපාන වෙනත් කාරණා.

2. (අ) එම කාරක සභාව සහ එහි සභාපතිවරයා කථානායකතුමා විසින් නම් කළ යුතු ය;

(ආ) පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 95හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, කාරක සභාව සාමාජිකයන් විසි එක් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.

3. එම කාරක සභාවට,

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) පුද්ගලයන්, ලිපි ලේඛන හා වාර්තා ගෙන්වා ගැනීමට, පාර්ලිමේන්තුව හෝ එබඳු කාරක සභාවක් ඉදිරියේ පෙනී සිටින ලෙස ඕනෑම පුද්ගලයෙකුට නියම කිරීමට ද, එබඳු පුද්ගලයන්ගේ සන්තකයේ හෝ පාලනය යටතේ පවතින යම් ලිපියක්, පොතක්, වාර්තාවක් හෝ ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ද;

(ඇ) සාක්ෂ්‍යකරුවන් වාචිකව විභාග කිරීමෙන් සත්‍ය අසත්‍යතාව විමසා බැලීමට හෝ අන්‍යාකාරයෙන් තහවුරු කර ගැනීමට ද, කාරක සභාවේ සභාපති හෝ ඒ එම කාර්යය සඳහා විශේෂයෙන් බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් දිවුරවනු ලැබූ සාක්ෂ්‍යකරුවන් විභාග කිරීමට ද;

(ඇ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයින්ගේ සහ ප්‍රවීණයන්ගේ සහය ලබා ගැනීමට; සහ

(ඉ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද, පාර්ලිමේන්තුව කල්තබන ලද්දේ වුවද රැස්වීම් පවත්වාගෙන යාමට ද;

බලය තිබිය යුතුය.

4. සිය පළමුවැනි රැස්වීම් දිනයේ සිට මාස (06) හයක කාලයක් තුළ හෝ පාර්ලිමේන්තුව විසින් වැඩිදුරටත් ලබාදෙන අන් කවර කාල සීමාවක් තුළ හෝ කාරක සභාව සිය වාර්තාව ඉදිරිපත් කළ යුතුය.

පා. 166/’15

2.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
ගරු ගාමිණී ලොකුගේ මහතා
ගරු බන්දුල ගුණවර්ධන මහතා
ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
ගරු ශෙහාන් සේමසිංහ මහතා
ගරු ජානක වක්කුඹුර මහතා
ගරු විජිත බේරුගොඩ මහතා
ගරු කංචන විජේසේකර මහතා
ගරු නාමල් රාජපක්ෂ මහතා
ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා
ගරු මනුෂ නානායක්කාර මහතා
ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
ගරු ජයන්ත සමරවීර මහතා
ගරු ඩී. වී. චානක මහතා
ගරු දිළුම් අමුණුගම මහතා
ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
ගරු ප්‍රසන්න රණවීර මහතා
ගරු සිසිර ජයකොඩි මහතා
ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
ගරු එස්.සී. මුතුකුමාරණ මහතා
ගරු විමලවීර දිසානායක මහතා
ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා
ගරු ලොහාන් රත්වත්තේ මහතා
ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
ගරු එස්. ප්‍රේමරත්න මහතා
ගරු ඩලස් අලහප්පෙරුම මහතා

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා

ගරු තාරක බාලසූරිය මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු විමල් රාජපක්ෂ මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා

ගරු වීරකුමාර දිසානායක මහතා

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය

ගරු කනක හේරත් මහතා

ගරු තේනුක විදානගමගේ මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා

ගරු සාලින්ද දිසානායක මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— මුදල් අමාත්‍ය, ගරු රවි කරුණානායක මහතාට එරෙහි විශ්වාස භංගත්වය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වැනි ව්‍යවස්ථාවට අනුව රාජ්‍ය මූල්‍ය පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතු වන හෙයින්ද;

රාජ්‍ය මූල්‍ය කළමනාකරණයෙහි ප්‍රධානතම උපකරණය වන්නේ වාර්ෂික අයවැය ලේඛනය වන හෙයින්ද;

විසර්ජන පනත වශයෙන් මෙම උත්තරීතර සභාවට ඉදිරිපත් කරනු ලබන අයවැය හා සම්බන්ධිත මූල්‍ය අගයන් ඉතා සවිස්තරාත්මකව, විනිවිද පෙනෙන අයුරින්, උපරිම විශ්වාසය රැකෙන පරිදි, සත්‍ය ලෙස ඉදිරිපත් කිරීම මුදල් අමාත්‍යවරයාගේ ප්‍රධානතම යුතුකම හා වගකීම වන හෙයින්ද;

මුදල් අමාත්‍ය, ගරු රවි කරුණානායක මහතා පාර්ලිමේන්තුව හා මහජනතාව නොමග යවන දුර්නිරූපණය සහිත අයවැය ලේඛනයක් මෙවර (2016) මෙම ගරු සභාවට ඉදිරිපත් කරනු ලැබ ඇති හෙයින්ද;

2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණය (වගකීම්) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාරව මුදල් අමාත්‍යවරයා විසින් මෙම ගරු සභාවට 2015 අප්‍රේල් 20 වැනි දින පිළිගන්වන ලද 2014 වාර්ෂික වාර්තාවේ 85 වැනි පිටුවේ "සාමාන්‍ය අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය හා වෘත්තීය අධ්‍යාපනය යන ක්ෂේත්‍රයන් සඳහා සමස්ත ආයෝජනය රුපියල් බිලියන 164ක් වන අතර, 2013 වර්ෂයේදී සිදුකළ රුපියල් බිලියන 157ට වඩා රුපියල් බිලියන 7ක වැඩි වීමක්" වන හෙයින්ද;

"සාමාන්‍ය අධ්‍යාපනය සඳහා 2014 වර්ෂයේ සිදුකළ රාජ්‍ය ආයෝජනය රුපියල් බිලියන 117ක් වන අතර, එය 2013 වසරේ සිදුකළ බිලියන 108ක ආයෝජනයට වඩා 8%ක වැඩිවීමක්" වන හෙයින්ද;

2016 අයවැය ඇස්තමේන්තුවෙහි II වෙළුම 218 සහ 219 පිටු අනුව, 2015 වසරේදී සාමාන්‍ය අධ්‍යාපනය සඳහා වූ ප්‍රාග්ධන වියදම බිලියන 17.8 සිට 2016 දී රුපියල් බිලියන 18.3 දක්වාත් රුපියල් බිලියන 0.5කින් පමණ ඉතා සුළු ප්‍රමාණයකින් වර්ධනය වී ඇති හෙයින්ද;

ශ්‍රී ලංකාවේ අයවැය ලේඛන ඉතිහාසයේ අසාමාන්‍ය හා විස්මිත වෙනසක් ඇති කරමින් 2016 වර්ෂයේ සාමාන්‍ය අධ්‍යාපනය සඳහා වන පුනරාවර්තන වියදම 278%කින් (2015ට සාපේක්ෂව රුපියල් බිලියන 44 සිට බිලියන 167 දක්වා රුපියල් බිලියන 123කින්) රොකට් වේගයෙන් අසාමාන්‍ය ලෙස ඉහළ ගොස් ඇති හෙයින්ද;

මෙලෙස අසාමාන්‍ය හා විස්මයජනක ලෙස පුනරාවර්තන වියදම ඉහළ යෑමට බලපෑ ප්‍රධානතම හේතුව නිදහසින් පසු ශ්‍රී ලංකා ඉතිහාසයේ කිසිම අයවැය ලේඛනයක සඳහන් නොවූ "රාජ්‍ය ආයෝජන පවත්වාගෙන යෑමේ පිරිවැය - ඉඩම් හා ගොඩනැගිලි" වශයෙන් රුපියල් මිලියන 121,352 හෙවත් රුපියල් බිලියන 121ක ගිණුම් සටහනක් පැවතීම වන හෙයින්ද;

මෙය පුනරාවර්තන වියදමක් ලෙස දැක්වුවද 2016 වර්ෂයේ දී සත්‍ය වශයෙන් වියදම් කරනු ලබන මුදලක් නොවන හෙයින්ද;

2016 වර්ෂයේදී අධ්‍යාපනයට වියදම් නොකරන රුපියල් කෝටි 1210කට අධික මුදලක් පුනරාවර්තන වියදම් ලෙස සටහන් කිරීමෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ව්‍යාජ ලෙස "පුම්බා පෙන්වා" මෙම ගරු සභාවට සාවද්‍ය තොරතුරු හා සංඛ්‍යා දත්ත ඉදිරිපත් කිරීමෙන් සභාවේ විශ්වාසය සම්පූර්ණයෙන් අහිමි කරගෙන ඇති හෙයින්ද;

තවදුරටත් මුදල් අමාත්‍යවරයා විසින් එම ධුරයේ කටයුතු කිරීමේ හැකියාව පිළිබඳව විශ්වාසයක් නොපවතින බවට මෙම පාර්ලිමේන්තුව යෝජනාව සම්මත කරයි.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***